

ජාතියට බලය සපයමින්
අනාගතය සුරක්ෂිත කරමින්

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

වාර්ෂික වාර්තාව
2025

අන්තර්ගතය

ආයතනික විශ්ලේෂණය

ආයතනික තොරතුරු 4
දැක්ම සහ මෙහෙවර 5
අප ගැන 6
අපගේ ජාලය 7
කාර්ය සාධන විශේෂතා 8
වසරේ සාරාංශය 9
සම්මාන සහ ඇගයුම් 11
CPSTL හි ආයතනික ව්‍යුහය 2025 මානව සම්පත් සැලැස්ම 13

අපගේ නායකත්වය

සභාපතිතුමාගේ පණිවිඩය 16
කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය 18
අධ්‍යක්ෂ මණ්ඩලය 20
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 25

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

උපායමාර්ගික පසුබිම සහ මෙහෙයුම් පරිසරය 32
මූල්‍ය ප්‍රාග්ධනය 38
නිෂ්පාදිත ප්‍රාග්ධනය 43
මානව ප්‍රාග්ධනය 46

පාලනය සහ අනුකූලතාව

ආයතනික පාලනය 55
අවදානම් කළමනාකරණය 65
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව 74
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 76
තිරසාරභාවය පිළිබඳ දළ විශ්ලේෂණය 78
අභ්‍යන්තර පාලන ඇගයීම 79

මූල්‍ය ප්‍රකාශන

විගණන වාර්තා 83
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 90
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 91
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 92
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 93
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 94
සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය 116
දස අවුරුදු මූල්‍ය සාරාංශය 118

ආයතනික තොරතුරු

ආයතනයේ නම
ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

නෛතික ස්වභාවය
1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන මහජන සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමඟ කියවිය යුතු 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) ඡේදය යටතේ සංස්ථාපිත කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

ලියාපදිංචි කාර්යාලය
නිමාව, කොලොන්නාව, වැල්ලම්පිටිය, ශ්‍රී ලංකාව

දුරකථන
+94 11 2694482 | +94 11 2691643 | +94 11 2532122 | +94 11 2572307
ෆැක්ස් : +94 11 2547827
විද්‍යුත් තැපෑල : secretariat@cpstl.lk
වෙබ් අඩවිය : www.cpstl.lk

බදු ගෙවීම් හඳුනාගැනීමේ අංකය : 134011157

මූල්‍ය වර්ෂය : ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

සභාපති : ඩී.ජේ.ඒ.ඩබ්ලිව්.එස්. ද එස්. රාජකරුණා මහතා

කළමනාකාර අධ්‍යක්ෂ : ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ


අධ්‍යක්ෂ මණ්ඩලය
ඩබ්ලිව්.එස්. හේමන්ත කුමාර මහතා
ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා
දීපාක් දාස් මහතා
අවිනාශ් සින්හාල් මහතා
සුනිල් කාන්ත මහාරණ මහතා
එච්.ටී.පී. චන්දන මහතා

මව් සමාගම : ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව

ලේකම්වරු
ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම
අංක 100, බ්‍රේබෘක් පෙදෙස, කොළඹ 02

විගණකවරු : රජයේ විගණකාධිපති

බැංකුකරුවන් : මහජන බැංකුව, ලංකා බැංකුව



දැක්ම

ලෝකයේ වඩාත් කාර්යක්ෂම බනිජතෙල් තොග ගබඩා පර්යන්ත
ක්‍රියාකරු බවට පත්වීම



මෙහෙවර

CPSTL ආයතනය බනිජතෙල් නිෂ්පාදන සඳහා ආරක්ෂාව, විශ්වාසනීයත්වය සහ කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරමින් සුවිශේෂී ගබඩා විසඳුම් ලබා දීමට කැපවී සිටියි. අපි සියලුම ඇල්මැති පාර්ශවයන්ට මූල්‍ය ස්ථාවරත්වය සහතික කරමින් ජාත්‍යන්තර තත්ත්වයේ තොරතුරු පද්ධති සපයන අතර සෞඛ්‍යය, පාරිසරික සහ ප්‍රවේසම් ප්‍රමිතීන් දැඩි ලෙස පිළිපදිමු. අති නවීන තාක්ෂණයන් අඛණ්ඩව අනුගමනය කරමින්, අපගේ සියලු මෙහෙයුම් වලදී නවෝත්පාදනය, නායකත්වය සහ කාර්යක්ෂමතාවය අපි පවත්වාගන්නෙමු. අපගේ සාර්ථකත්වය මෙහෙයවනු ලබන්නේ සේවයට කැපවූ ඉහළ පුහුණුවක් සහිත වෘත්තීමය හා අවංක ශ්‍රම බලකායක් මගිනි.

අප ගැන

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

අපි කවුද

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති යටිතල පහසුකම් සැපයීමේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස ක්‍රියා කරයි. එය රට පුරාම බනිජතෙල් නිශ්පාදන ආරක්ෂිත, විශ්වාසනීය සහ අඛණ්ඩ ගබඩා කිරීම සහ බෙදාහැරීම සහතික කරයි.

අපගේ කාර්යභාරය

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඉන්ධන ගබඩා කිරීම සහ බෙදාහැරීම සඳහා වන ප්‍රධාන ඉන්ධන ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස, ඉන්ධන ලබා ගැනීම, ගබඩා කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදාහැරීම යන සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා වගකීම භාරගෙන ඇත.

මෙමඟින් රජය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්ට සේවා සපයන අතර, ගෘහස්ථ පරිභෝජනය, ප්‍රවාහන පද්ධති, කර්මාන්ත, ගුවන් තොටුපළ සහ විදුලි උත්පාදන පහසුකම් සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම සහතික කරයි.

අපගේ මෙහෙයුම් ජාලය

ප්‍රධාන පර්යන්ත (2)

කොලොන්නාව පර්යන්තය - නාගරික බහු නිෂ්පාදන පර්යන්තයක් වන මෙයට බනිජතෙල් නිශ්පාදන 13 ක් හැසිරවීමේ හැකියාව ඇත.
මුතුරාජවෙල පර්යන්තය - වෙරළ ආශ්‍රිත, ඉහළ ධාරිතාවයකින් යුත් මෙම පර්යන්තය බනිජතෙල් නිශ්පාදන 3 ක් දක්වා (ගුවන් සේවා සහ විදුලි උත්පාදන ක්ෂේත්‍ර සඳහා භාවිතා වන ඉන්ධන ඇතුලුව) හැසිරවීමේ ක්‍රියාව සිදු කරයි.

තොග ගබඩා (11)

අනුරාධපුර | මඩකලපුව | බදුල්ල | කොටගල | කුරුණෑගල | හපුතලේ | පේරාදෙණිය | සරසවි උයන | කන්කසන්තුරෙයි | ගාල්ල | මාතර

හිමිකාරත්ව ව්‍යුහය

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවෙහි (CPC) උප සමාගමක් වන අතර එහි කොටසක හිමිකාරත්වයෙන් තුනෙන් දෙකක් CPC විසින් ද ඉතිරි කොටස LIOC විසින් ද දරයි.

මොනවාද අපි කරන්නේ

බනිජතෙල් නිශ්පාදන රට පුරාම ගබඩා කිරීම සහ බෙදාහැරීම.

බහු නිශ්පාදන ඉන්ධන හැසිරවීම.

බණ්ඩාරනායක ජාතික ගුවන් තොටුපළ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ගුවන් ඉන්ධන සැපැයීම.

විදුලි උත්පාදන ක්ෂේත්‍රයට කැපවූ නළමාර්ග මඟින් ඉන්ධන සැපැයීම.

CPC සහ LIOC වෙනුවෙන් සිල්ලර හා තොග ඉන්ධන බෙදාහැරීම්.


අපගේ වටිනාකම්

ආරක්ෂාව සහ තිරසරභාවය
අපගේ සියලු මෙහෙයුම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන අතර, මහජන ආරක්ෂාව, වත්කම් ආරක්ෂාව සහ පාරිසරික සුරක්ෂිතතාවය තහවුරු කිරීම අපගේ ප්‍රමුඛතාවයකි.

මානව සම්පතින් බලගැන්වීම
අපගේ ශක්තිය වන්නේ ඉංජිනේරු, මෙහෙයුම්, ලොජිස්ටික් සහ කළමනාකරණ ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි දක්ෂතා සහ කැපවීමෙන් යුත් 2,000 කට අධික වෘත්තීයවේදීන්ගේ දායකත්වයයි.

වගකීම් සහ පුරවැසිභාවය
පරිසරයට වන බලපෑම් අවම කරමින්, පාරිසරික සුරක්ෂිතතාවය සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි කැපවී සිටිමු.

අපගේ ජාලය


කන්කසන්තුරෙයි
පර්යන්තය
තොග ගබඩාව
අනුරාධපුර
මඩකලපුව
කුරුණෑගල
පේරාදෙණිය
සරසවි උයන
මුතුරාජවෙල
කොලොන්නාව
කොටගල
බදුල්ල
හපුතලේ
ගාල්ල
මාතර

කාර්ය සාධන විශේෂතා

			2025	2024	2023	2022	2021
මූල්‍ය ප්‍රාග්ධනය	**ක්‍රමෝපායික ප්‍රමුඛතා මූල්‍ය වර්ධනය**						
	ආදායම	රු.මි.	20,520	18,899	10,150	9,433	14,276
	මෙහෙයුම් ලාභය	රු.මි.	5,131	4,664	(621)	(989)	1,377
	බදු පෙර ලාභය / (අලාභය)	රු.මි.	5,537	4,998	(314)	(704)	1,578
	බදු පසු ලාභය / (අලාභය)	රු.මි.	3,840	3,381	37	(1,059)	1,169
	හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	%	5%	7%	0.1%	-4%	4%
	මූල්‍ය ස්ථාවරත්වය						
	මුළු වත්කම්	රු.මි.	106,172	61,285	32,228	33,481	33,999
	මුළු වගකීම්	රු.මි.	27,178	14,436	5,747	6,252	5,999
	කොටස් හිමිකම්	රු.මි.	78,993	46,849	26,481	27,229	28,000
	මුදල් සහ මුදල් සමාන දෑ	රු.මි.	3,063	4,329	1,113	2,006	2,257
	කොටස් හිමියන්ගේ තොරතුරු						
	කොටසකට ඉපැයුම	රු.	5.12	4.51	0.05	(1.41)	1.56
	කොටසකට ලාභාංශ (ගෙවූ)	රු.	0.20	-	0.48	-	-
	කොටසකට ශුද්ධ වත්කම් අගය	රු.	105	63	35	36	37
නිෂ්පාදිත ප්‍රාග්ධනය	**උපායමාර්ගික ප්‍රමුඛතාවය: මෙහෙයුම් විශිෂ්ටත්වය**						
	දේපළ, පිරියත හා උපකරණ						
	පර්යන්ත සහ තොග ගබඩා	ගණන	13	13	13	13	13
	ප්‍රාග්ධන වියදම්	රු.මි.	1,584	1,298	157	925	1,358
මානව ප්‍රාග්ධනය	**ක්‍රමෝපායික ප්‍රමුඛතා: සේවකයින් තුළ ආයෝජනය**						
	මුළු සේවක සංඛ්‍යාව	ගණන	2,072	2,225	2,299	2,474	2,629
	කාන්තා නියෝජන	ගණන	280	297	288	308	343
	සේවකයින්ට ගෙවීම්	රු.මි.	7,104	6,348	6,361	6,745	6,908
	සේවක ඉවත්වීම් අනුපාතය	%	7%	7%	7%	6%	6%
	පුහුණුව සඳහා ආයෝජනය	රු.මි.	7	6	4	2	3
	මුළු පුහුණු පැය	පැය	11,364	5,680	4,863	5,006	3,806
	සාමාන්‍ය පුහුණු පැය (සේවකයෙකුට)	පැය	5.48	2.55	2.12	2.02	1.45
	සේවකයෙකුට ආදායම	රු.මි.	9.90	8.49	4.41	3.81	5.43
	සේවකයෙකුට ශුද්ධ ලාභය / අලාභය	රු.මි.	1.85	1.52	0.02	(0.43)	0.44
	අනියම් සේවකයින් (ආසන්න සංඛ්‍යාව)	ගණන	47	56	53	70	75
සමාජ හා සබඳතා ප්‍රාග්ධනය	ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය	රු.මි.	3	4	1.7	0.3	6.5
	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ගණන	7,700	8,950	1,034	775	8,600
	රජයට දායකත්වය	රු.මි.	4,502	2,761	1,408	1,796	1,608
ස්වාභාවික ප්‍රාග්ධනය	**ක්‍රමෝපායික ප්‍රමුඛතා: තිරසාරත්වය**						
	බලශක්ති භාවිතය	කි.වොට්	4,417,848	4,683,218	4,504,889	4,717,569	5,342,888
	ජල භාවිතය	කි.ලීටර	177,245	177,054	182,354	204,872	280,239
	තෙල් මණ්ඩි ඉවත් කිරීම	කි.ලීටර	-	-	-	99.6	32.4

වසරේ සාරාංශය


විකුණුම් පරිමාව
කි.ලී. 4,756,164

ආදායම
රු. බිලියන 20.5


වත්කම් පදනම
රු. බිලියන 102

බදු පසු ලාභය **රු. බිලියන 3.8**


ආදායම සහ දළ ලාභ අනුපාත ප්‍රවණතාවය (රු. මි)




විකුණුම් පරිමාව (කි.ලී. මිලියන)




බදු පෙර හා බදු පසු ලාභය (රු. මිලියන)




හිමිකම් මත ප්‍රතිලාභය %




මෙහෙයුම් කාර්යසාධනය




මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)




ජංගම/ක්ෂණික වත්කම් අනුපාතය (වාර)




කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.)



වත්කම් පිරිවැටුම් අනුපාතය



තෝලන අනුපාතය (වාර)



සම්මාන සහ ඇගයීම්

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL), 2025 මාර්තු 21 වන දින මොනාක් ඉම්පීරියල් (Monarch Imperial) හිදී පැවැත්වුණු "විශිෂ්ටතම කළමනාකරණ පරිචයන් සහිත සමාගම් ඇගයීමේ සම්මාන උළෙලේදී" (Best Management Practices Company Awards) කැපී පෙනෙන ඇගයීමකට ලක්වෙමින්, 2025 වසරේදී සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ බව ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමු.

මෙම විශිෂ්ට ජයග්‍රහණය මඟින් නායකත්වයේ විශිෂ්ටත්වය, ඩිජිටල් ප්‍රගතිය සහ අපගේ සියලුම මෙහෙයුම් ක්ෂේත්‍රයන් පුරා ඉහළම මට්ටමේ කළමනාකරණ පරිචයන් අනුගමනය කිරීම වෙනුවෙන් අප සතු නොසැලෙන කැපවීම මනාව පිළිඹිබු කරයි. දිවයින පුරා සිටින ප්‍රමුඛ පෙළේ ආයතන සමඟ තරඟ වදිමින් CPSTL ආයතනය ඉහළ ඇගයීමකින් යුත් සම්මාන කිහිපයක්ම දිනා ගැනීමට සමත් වූ අතර, එමඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති සහ සැපයුම් දාම (logistic) ක්ෂේත්‍රය තුළ ප්‍රමිතිගත ආයතනයක් ලෙස අප සතු ස්ථානය තවදුරටත් තහවුරු කළේය.

2025 වසරේ අපගේ ජයග්‍රහණ

නායකත්ව විශිෂ්ටත්වය උදෙසා වූ ඇගයීම - BMPC සම්මාන 2025

රන් සම්මානලාභී සහ සමස්ත හොඳම ආයතන හය අතරට තේරීම - ඩිජිටල් සාක්ෂරතා අංශය (Digital Literacy Cluster)

කාණ්ඩයේ ජයග්‍රාහකයා - බලශක්ති අංශය (Power and Energy)

කාණ්ඩයේ ජයග්‍රාහකයා - රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ අධිකාරී බලයලත් ආයතන අංශය

කුසලතා සම්මානය - ප්‍රවාහන, සැපයුම් දාම, නැව්ගත කිරීම් සහ ඒ ආශ්‍රිත සේවා අංශය

මෙම ඇගයීම් මඟින් අපගේ පාලන ව්‍යුහයේ ශක්තිමත්භාවය, ඩිජිටල් පරිවර්තන මූලපිරීම්වල සඵලතාවය සහ මෙහෙයුම් කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා අපගේ කාර්ය මණ්ඩලය දක්වන කැපවීම මැනවින් සනාථ කරයි. වඩාත්ම වැදගත් කරුණ වන්නේ, ආයතනික උපායමාර්ග නවෝත්පාදනයන් සමඟ පෙළගැස්වීමට, ආයතනය පුරා හොඳම කළමනාකරණ පරිචයන් ස්ථාපිත කිරීමට සහ ජාතික බලශක්ති සුරක්ෂිතතාවයට මෙන්ම ආර්ථික සංවර්ධනයට අර්ථාන්විත දායකත්වයක් ලබා දීමට CPSTL ආයතනය ගන්නා අඛණ්ඩ උත්සාහය මෙමඟින් ප්‍රදර්ශනය වීමයි.






CLUSTER
AWARDS
DIGITAL LITERACY








CPSTL හි ආයතනික ව්‍යුහය 2025

මානව සම්පත් සැලැස්ම




ТК-37

අපගේ නායකත්වය



සභාපතිතුමාගේ පණිවිඩය

“විශ්වසනීයත්වය, අවංකභාවය සහ සමෘද්ධියෙන් ජාතිය ගොඩනැගීම”



ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කැපවූ සේවක මණ්ඩලය සහ වටිනා පාර්ශවකරුවන් වෙත

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති පණිවිඩය ඉදිරිපත් කරනුයේ වගකීමේ සහ විශ්වාසයේ හැඟීමකිනි.

සමාලෝචනයට ලක් කරන ලද වර්ෂය තුළ සංකීර්ණ ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වයන් යටතේ බලශක්ති ක්ෂේත්‍රය අඛණ්ඩව සංවර්ධනය වෙමින් පැවති බැවින්, ශක්තිමත් ආයතනික නායකත්වයක් සහ උපායමාර්ගික අධීක්ෂණයක් අවශ්‍ය විය. මෙම කාල පරිච්ඡේදය පුරාවටම, උපායමාර්ගික වශයෙන් වැදගත් ජාතික ආයතනයක් ලෙස CPSTL වෙත පැවරී ඇති මෙහෙවර ආරක්ෂා කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කළ අතර, දිගුකාලීන ස්ථාවරත්වය, වගවීම සහ මහජන විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කරන ලදී.

සමාගමේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රගතිය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැදිලි උපායමාර්ගික මඟපෙන්වීම් ලබා දෙන ලදී. ජාතික බලශක්ති රාමුව තුළ

CPSTL හි භූමිකාව තවදුරටත් ශක්තිමත් කිරීම, රජයේ ප්‍රතිපත්ති සමඟ අනුකූලතාවය පවත්වා ගැනීම සහ ජාතික බලශක්ති සුරක්ෂිතතාවය හා ආර්ථික ස්ථාවරත්වය සඳහා සහාය වන උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

ආයතනික කාර්යසාධනය, අවදානම් තත්ත්වයන් සහ උපායමාර්ගික ප්‍රමුඛතා නිරන්තරයෙන් සමාලෝචනය කිරීම තුළින්, අවිනිශ්චිත තත්ත්වයන් හමුවේ අඛණ්ඩතාව සහ ආයතනික විශ්වාසනීයත්වය පවත්වා ගනිමින් සංවිධානය ඉදිරියට මෙහෙයවීමට මා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි විය.

උසස් මට්ටමේ ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රධාන වගකීමක් ලෙස අඛණ්ඩව සැලකිය. 2025 වර්ෂය තුළ විනිවිදභාවය, වගවීම සහ නියාමන අනුකූලතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ආයතනික පාලන රාමුවන් වැඩිදියුණු කරන ලදී. මතුවිය හැකි අවදානම් කාලෝචිතව හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

CPSTL හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා විචක්ෂණශීලී මූල්‍ය අධීක්ෂණයක් සිදු කරන ලදී. මෙහෙයුම් වගකීම් සහ මූල්‍ය විනය අතර සමතුලිතතාවය පවත්වා ගනිමින්, සම්පත් වගකීමෙන් යුතුව සහ ජාතික ප්‍රමුඛතා සමඟ අනුකූලව වෙන් කිරීම සහතික කිරීම සඳහා උපායමාර්ගික මඟපෙන්වීම් ලබා දෙන ලදී.

වාසනාවකට මෙන්, අපගේ සේවක බලකාය සහ ඔවුන්ගේ වටිනාකම් මත ශක්තිමත් වූ ආයතනික ශක්තීන් හඳුනා ගැනීමට අපට හැකි විය. සේවක සුභසාධනය, සේවාස්ථානයේ ආරක්ෂාව සහ ආචාරධාර්මික හැසිරීම සමාගමේ මෙහෙයුම්වල අත්‍යවශ්‍ය අංග ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය අධීක්ෂණය සිදු කරන ලදී.

2025 වර්ෂය තුළ සිදු වූ වඩාත් වැදගත් සහ දිගුකාලීන බලපෑමක් ඇති ආරම්භයන් හා ජයග්‍රහණ පහත දැක්වේ;

1. පවතින SAP පද්ධතිය SAP S/4HANA අදියර වෙත යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර, එය අපගේ ඩිජිටල්කරණ ප්‍රයත්නයන්හි වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරන ලදී.
2. මුතුරාජවෙල පර්යන්තයේ සූර්ය බලශක්ති ස්ථාපනයේ ආරම්භය.
3. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින්, අග්නිදිග ආසියාවේ ප්‍රමුඛ ඉන්ධන බෙදාහැරීමේ ආයතනයක් ලෙස CPSTL උසස් කිරීම අපගේ අරමුණ වේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මුතුරාජවෙල පර්යන්තයේ ISO ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර, එය කඩිනමින් කොලොන්නාව පර්යන්තය සහ අනෙකුත් තොග ගබඩා වෙත ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.
4. දකුණු ජැටියේ බන්කර් පහසුකම් සඳහා ඉන්ධන තෙල් නල මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.
5. දිගු කාලයක් ප්‍රමාදව පැවති ටැංකි 6 ව්‍යාපෘතිය ආරම්භ කිරීම අවසානයේ සිදු කරන ලදී. සැලකිය යුතු ගබඩා ධාරිතාවක් සහිත මෙම ව්‍යාපෘතිය මඟින් දිගු කාලයක් සඳහා ජාතික ඉන්ධන අවශ්‍යතා සපුරාලීමට හැකි වනු ඇත.
6. ටැංකි 6 ව්‍යාපෘතියට අමතරව, කොලොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තවල නව ටැංකි ඉදිකිරීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. අපගේ ශක්තිමත් ඉංජිනේරු හැකියාවන් උපයෝගී කර ගනිමින් ආරක්ෂිත ඉන්ධන ගබඩා කිරීම සම්බන්ධයෙන් මහජන විශ්වාසය තවදුරටත් තහවුරු කිරීම මෙහි අරමුණ වේ.
7. කොළඹ වරාය ආශ්‍රිත අඟල් 12 නල මාර්ගය නැවත මාර්ගගත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.
8. කොලොන්නාව පර්යන්තයේ ටැංකි අංක 21 සහ මඩකලපුව තොග ගබඩාවේ ටැංකි අංක 05 අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, CPSTL සමඟ අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන විශ්වාසය සහ සහයෝගීතාවය වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශය, නියාමන ආයතන සහ සියලුම පාර්ශවකරුවන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද, අභියෝගාත්මක තත්ත්වයන් යටතේ සමාගමේ මෙහෙවර සාර්ථකව ඉටු කිරීම සඳහා දක්වන ලද කැපවීම වෙනුවෙන් කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ කණ්ඩායම වෙත මාගේ අගය කිරීම පළ කරමි.

CPSTL ඉදිරියට ගමන් කරන විට, සමාගම විශ්වසනීයත්වය, අවංකභාවය සහ අරමුණු සහගත ක්‍රියාකාරිත්වය සමඟ ජාතියට අඛණ්ඩව සේවය කිරීම සහතික කිරීම සඳහා යහපත් ආයතනික පාලනයක් සහ උපායමාර්ගික මඟපෙන්වීමක් ලබාදීමට මා සහ අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව කැපවී සිටිමු.

(අත්සන් කළේ)

ඩී. ජේ. ඒ. එස්. ද එස්. රාජකරුණා
සභාපති

කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය



“අර්ථවත් මෙහෙයුම් ප්‍රගතියෙන් පිරි වසරක්”

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන මගේ ප්‍රකාශය ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. මෙම වසර අපගේ සැලසුම් ක්‍රියාවට නැංවීම, ඉලක්ක සපුරා ගැනීම සහ මෙහෙයුම් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කරගත් වසරක් ලෙස හඳුන්වා දිය හැකිය.

2025 වසර තුළ කළමනාකාරිත්වයේ ප්‍රධාන අවධානය යොමු වූයේ මෙහෙයුම් හැකියාවන් ශක්තිමත් කිරීම, තීරණාත්මක ව්‍යාපෘති නිම කිරීම සහ ආයතනික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම කෙරෙහිය. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ වුවද, දිවයින පුරා බාධාවකින් තොරව බනිජතෙල් ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ සේවාවන් පවත්වා ගනිමින්, අපගේ සැලසුම් සාර්ථක ප්‍රතිඵල බවට පත් කිරීමට සමාගම සමත් විය.

දැඩි මෙහෙයුම් සැලසුම්කරණය සහ වඩාත් ශක්තිමත් සම්බන්ධීකරණය මඟින්, CPSTL සමාගම සිය පර්යන්ත ජාලය පුරා

විශ්වාසදායක සේවාවක් සහතික කිරීමට CPSTL පියවර ගත්තේය. මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සම්පත් උපරිම ලෙස භාවිත කිරීම සහ පද්ධති විශ්වසනීයතාව ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කෙරිණි.

නිරෝධායන නඩත්තු වැඩසටහන් (Preventive Maintenance Programmes) සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් මගින් ක්‍රියාකාරිත්වයේ ප්‍රමිතීන් ඉහළ නැංවීමටත් මෙහෙයුම් බාධා අවම කිරීමටත් දායක විය.

වසරේ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස SAP S/4HANA මෘදුකාංග පද්ධතිය සාර්ථකව ස්ථාපිත කිරීම හඳුන්වා දිය හැකිය. මෙමගින්: ආයතනික ක්‍රියාවලි ශක්තිමත් කරමින් සමාගම පුරා දත්තවල නිරවද්‍යතාව සහ වාර්තාකරණ හැකියාවන් ඉහළ නංවා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම සංකීර්ණ ව්‍යාපෘතිය මෙහෙයුම් කටයුතුවලට අවම බාධාවක් වන පරිදි නිම කිරීමට හැකි වීම අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීම සහ මනා ව්‍යාපෘති කළමනාකරණය මනාව පිළිබිඹු කරන්නකි.

නව පද්ධතිය මගින් තත්කාලීන දත්ත (Real-time Data) පදනම් කරගනිමින් නිවැරදි තීරණ ගැනීමට මග පෑදිණි.

පර්යන්තවල යටිතල පහසුකම්වල සුරක්ෂිතතාව සහ විශ්වාසනීයත්වය ඉහළ නැංවීම සඳහා තීරණාත්මක ඉංජිනේරු ව්‍යාපෘති රැසක් පසුගිය වසරේදී ක්‍රියාත්මක කෙරිණි. මෙම ව්‍යාපෘති දිගුකාලීනව පැවති මෙහෙයුම් අවශ්‍යතා විසඳීමට දායක වූ අතර පද්ධති අඛණ්ඩතාවය වැඩිදියුණු කළේය. විශේෂයෙන්ම, දීර්ඝ කාලයක් තිස්සේ ඇණහිට තිබූ ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව නිම කිරීමට හැකි වීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. තාක්ෂණික සමාලෝචන, සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සහ දැඩි මෙහෙයුම් විනයක් හරහා එම බාධාවන් ජය ගැනීමට අපට හැකි විය.

2025 වසරේ අප ලැබූ මෙහෙයුම් සාර්ථකත්වයේ නියමුවා වූයේ CPSTL සේවක මණ්ඩලයයි. ඔවුන්ගේ තාක්ෂණික කුසලතා සහ වෘත්තීය විනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සහ කාර්යසාධන කළමනාකරණ ක්‍රමවේදයන් සඳහා අපි ආයෝජනය කළෙමු. එසේම, සෞඛ්‍ය, වෘත්තීය ආරක්ෂාව සහ පරිසර හිතකාමී වැඩපිළිවෙළ (HSE) අපගේ දෛනික මෙහෙයුම්වල අනිවාර්ය අංගයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය. අඛණ්ඩ පුහුණු, සූදානම්කරණ වැඩසටහන් සහ අධීක්ෂණ ක්‍රියාකාරකම් මගින් ආයතනය තුළ ශක්තිමත් ආරක්ෂක සංස්කෘතියක් තවදුරටත් වර්ධනය විය.

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ යටිතල පහසුකම් තවදුරටත් නවීකරණය කිරීම කෙරෙහි අපගේ අවධානය අඛණ්ඩව යොමු වනු ඇත. 2025 වසරේ අප ලබාගත් අත්දැකීම් සහ ශක්තිය, අනාගත මෙහෙයුම් අභියෝග ජය ගැනීමට මනා පදනමක් සපයයි.

මෙම සාර්ථක වසර සඳහා මග පෙන්වූ සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ ගෞරවනීය ස්තූතිය හිමිවේ. එමෙන්ම, CPSTL ආයතනය මෙහෙයුම් ප්‍රගතිය කරා මෙහෙයවීමට සහය වූ සියලුම පාර්ශවකරුවන්ට සහ කැපවීමෙන් කටයුතු කළ සේවක මණ්ඩලයට මාගේ ස්තූතිය පුද කරමි.

(අත්සන් කළේ)

ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ
කළමනාකාර අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය



ඩී.ජේ.ඒ.එස්. ද එස්. රාජකරුණා මහතා

සභාපති

ජනක රාජකරුණා මහතා තෙල් හා ගෑස් කර්මාන්තයේ, ප්‍රධාන වශයෙන් පර්යන්ත මෙහෙයුම් සහ කළමනාකරණය පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් ඇති කීර්තිමත් නායකයෙකි. ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) දශක දෙකකට අධික කැපවූ සේවාවක් සමඟින්, මෙහෙයුම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීමට සහ ආයතනයේ සාර්ථකත්වය හැඩගැස්වීමට ඔහු දායක වී ඇත.

CPSTL හි සේවා කාලය තුල රාජකරුණා මහතා මුතුරාජවෙල පර්යන්තයේ පර්යන්ත කළමනාකාර සහ නියෝජ්‍ය මෙහෙයුම් කළමනාකාර ඇතුළු ප්‍රධාන නායකත්ව තනතුරු හොබවා ඇත. මෙම භූමිකාවන් හීදී, ඔහු ශ්‍රී ලංකාවේ බනිජතෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම්වල ආරක්ෂාව සහ කාර්යක්ෂම කළමනාකරණය සහතික කළ අතර, රටේ බලශක්ති සුරක්ෂිතතාව සඳහා ද සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත.

කාර්යශූර සහ නව දැනුම ඉතා ඉක්මණින් උකහා ගැනීමට උනන්දුවක් දක්වන රාජකාරුණා මහතා ඔහුගේ තාක්ෂණික හා කළමනාකරණ විශේෂඥතාවය අඛණ්ඩව වැඩි දියුණුකර ගනිමින් නැගී එන කර්මාන්ත ප්‍රවණතා සමඟ සමීපව කටයුතු කරයි. ඔහුගේ සුවිශේෂී තීරණ ගැනීමේ හැකියාව සහ පීඩනය යටතේ සන්සුන්භාවය ඔහුට සංකීර්ණ අභියෝග ජයගැනීමට හා ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට හැකියාව ලබාදී ඇත. සහයෝගී නායකත්ව විලාසයකට කීර්තිමත් ඔහු, කණ්ඩායම් වැඩ සංස්කෘතියක් හා අන්‍යෝන්‍ය ගෞරවය පෝෂණය කිරීම තුලින්, වෘත්තීය සාර්ථකත්වය හා කණ්ඩායම් සංවර්ධනය යන දෙකම ලබාගැනීමට ප්‍රමුඛත්වයක් ලබාදෙයි.

රාජකරුණා මහතාගේ ශක්තිමත් අධ්‍යාපන පසුබිමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කර්මාන්ත රසායනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියද ඇතුලත් වේ. ඔහුගේ විශිෂ්ට අධ්‍යාපනික පදනම හා පුළුල් ප්‍රායෝගික අත්දැකීම් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදන කෙරෙහි අවධානය යොමු කරමින් සංකීර්ණ මෙහෙයුම් අධීක්ෂණය කිරීමට, ඔහුට බලය ලබාදී ඇත.

LNG අගය දාම කළමනාකරණය, තොග ද්‍රව ටැංකි මෙහෙයුම් සහ භාරකාරත්ව හුවමාරු පිළිවෙත් ඇතුළුව තෙල් හා ගෑස් අංශයේ තීරණාත්මක ක්ෂේත්‍රවල විශේෂිත පුහුණුවක් තුලින් ඔහු තම ප්‍රවීණත්වය තවදුරටත් ඔප්නංවා ඇත. ඔහු ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මැලේසියාව යන රටවල උසස් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇති අතර, එහිදී ගෝලීය හොඳම භාවිතයන් පිළිබඳ ඔහුගේ අවබෝධය වර්ධනය කරගෙන ඇති අතර එම දැනුම CPSTL ආයතනයෙහි මෙහෙයුම්වලට භාවිතා කර ඇත. මීට අමතරව, ඔහු අධීක්ෂණ කළමනාකරණය සහ කාර්මික භාවිතයන් පිළිබඳ පුහුණුව ද සම්පූර්ණ කර ඇති අතර, ඔහුගේ නායකත්ව හැකියාවන් ද තවදුරටත් වැඩි දියුණු කරගෙන ඇත.

රාජකරුණා මහතා ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ (CPC) තාක්ෂණික පිරිවිතර කමිටුවේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර, එහිදී ශ්‍රී ලංකාවේ බනිජතෙල් කර්මාන්තයට මග පෙන්වන තාක්ෂණික ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදී ඇත.

වර්තමානයේ, ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාග මෙහි සභාපති සහ ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙස රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ ජාතික බනිජතෙල් යටිතල පහසුකම් අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, නවෝත්පාදනයන් සංවර්ධනය කිරීම සහ බලශක්ති ක්ෂේත්‍රයේ තිරසාර භාවිතයන් මෙහෙයවීම කෙරෙහි ඔහුගේ දූරදර්ශී නායකත්වය අවධානය යොමු කර ඇත.

පිරිසිදු හා තිරසාර බලශක්තිය වෙනුවෙන් පෙනී සිටින රාජකරුණා මහතා චීනයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ පිරිසිදු බලශක්ති යෙදුම තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන සාර්ථකව නිම කර ඇත. ඔහුගේ ඉදිරි දැක්මේ අරමුණ වනුයේ සංවිධානයට සහ ජාතියට ප්‍රතිලාභ සැලසෙන පරිදි තිරසාර භාවිතයන් ඒකාබද්ධ කරමින් බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනය කිරීමය.

අඛණ්ඩ වැඩිදියුණු කිරීම, පාරිසරික වගකීම සහ දැනුම හුවමාරු කර ගැනීම පිළිබඳ දැඩි කැපවීමකින් යුත් රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුල ප්‍රධාන පුරුකක් ලෙස පෙනී සිටියි. ඔහුගේ නායකත්වය සහ කැපවීම අඛණ්ඩ ප්‍රගතිය සහ නව්‍යකරණයන් දිරිමත් කරන අතර, කලාපයේ බලශක්ති භූ දර්ශනයේ ප්‍රධාන නායකයෙකු ලෙස CPSTL සහ CPC ස්ථානගත කරයි.



ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුල දශක දෙකකට ආසන්න අත්දැකීමක් ඇති පළපුරුදු ව්‍යාපාර කළමනාකරණ වෘත්තිකයෙකි. පරිවර්තනීය නායකත්වය සඳහා ප්‍රසිද්ධියට පත් ඔහු බොහෝ සංවිධාන සාර්ථකව පුනර්ජීවනය කර ඇත. ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා පිළිගත් ජාත්‍යන්තර ව්‍යාපාරික උපායමාර්ගිකයෙකු, ආයතනික පරිවර්තන විශේෂඥයෙකු, ඩිජිටල්කරණ විශේෂඥයෙකු සහ කෘතිම බුද්ධිය සම්බන්ධ වෘත්තිකයෙකි.

වර්තමානයේ, ඔහු ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. ඔහු ලිට්රෝ ගෑස් ලංකා සමාගම, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ ධූර ද හොබවයි. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයේ අමාත්‍ය උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

ආචාර්ය නෙත්තිකුමාරගේ මහතාගේ ජාත්‍යන්තර වෘත්තීය දිවිය 2005 වර්ෂයේදී Coca-Cola SABCO හි කලාපීය නායකත්ව භූමිකාවක් සමගින් ආරම්භ වූ අතර, එහිදී ඔහු ව්‍යාපාර කටයුතු ආසියානු කලාපය පුරා ව්‍යාප්ත කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ අතර, ඉන් පසුව එය අප්‍රිකාව පුරා ද ව්‍යාප්ත කළේය. FMCG අංශයේ ඔහුගේ සේවා කාලයෙන් පසු, ඔහු බලශක්ති අංශයට සංක්‍රමණය වූ අතර, මධ්‍ය සහ පහළ ධාරා ව්‍යාපාර දෙකෙහිම පුළුල් අත්දැකීම් ලබා ගත්තේය. ඔහු Total Energies, Petredec, Kleenheat සහ SLOGAL Energy වැනි ප්‍රමුඛ බහුජාතික බලශක්ති සන්නාමයන් සමග මෙන්ම Laugfs-Bangladesh වැනි කලාපීය සන්නාමයන් සමග ද, දේශීය කළමනාකරුගේ සිට ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා සහ බලශක්ති අලෙවිකරු දක්වා ද භූමිකාවන් ඉටුකර ඇත. ඔහුගේ විශේෂඥ දැනුමට පර්යන්ත සඳහා යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ගොඩනැගීම, ටැංකි අංගන, නැව් නැංගුරම්/පැටවීමේ පහසුකම්, පිරවුම් හල්, සිලින්ඩර් බලාගාර, ඉන්ධන පිරවුම්හල් ජාල සහ බලශක්ති අංශයේ කාර්මික ස්ථාපනයන් සමගින් නාලිකා සංවර්ධනය ද ඇතුලත් වේ.

FMCG සහ බලශක්ති ක්ෂේත්‍රයන්ට අමතරව, ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා කෘත්‍රිම බුද්ධිය, යන්ත්‍ර හැදෑරීම, දත්ත පද්ධති, ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, අභිරුචි සංවර්ධනය සහ පරිශීලක අත්දැකීම් නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරමින් තොරතුරු තාක්ෂණ අංශයට දායක වී ඇත.

ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා කළමනාකරණ හා ව්‍යාපාර ආචාර්ය (Ph.D.) උපාධිය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් (MBA) උපාධිය (කුසලතා සාමාර්ථයක්), යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද, දේශපාලන, මෘදුකාංග ඉංජිනේරු සහ පරිගණක-පාදක ගිණුම්කරණය යන ඩිප්ලෝමා ද ලබාගෙන ඇත. ඔහු අ.පො.ස (උ/පෙළ) ගණිත විෂය ධාරාවෙන් ඉහළම ජාතික ශ්‍රේණිගත කිරීමක් ද ලබා ඇති අතර, IESL, ECSL, SLIM සහ CPM ඇතුළු වෘත්තීය ආයතනවල සාමාජිකත්වයන් ද දරනු ලබයි.



ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා
විධායක අධ්‍යක්ෂ

2024 සැප්තැම්බර් මස 26 වෙනි දින ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇත. 1985 සිට තෙල් හා

ගෑස් කර්මාන්තයේ පුළුල් වෘත්තීය අත්දැකීම් සමඟින්, හේමන්ත මහතා පිරිපහදු මෙහෙයුම්, නැව් භාණ්ඩ / ගුදම් සැලසුම් කිරීම සහ පහළ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ සැලකිය යුතු විශේෂඥ දැනුමක් ලබා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට පෙර, ඔහු CPSTL ආයතනයෙහි මෙහෙයුම් කළමනාකාර ලෙස සේවය කළ අතර, සම්පත් ප්‍රශස්ත කිරීම සහ නියාමන අනුකූලතාව සහතික කිරීම මගින් මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, ආනයනයේ සිට බෙදාහැරීම දක්වා වූ ක්‍රියාවලියේ මෙහෙයුම් අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කළේය. ඔහුගේ CPSTL හි වෘත්තීය දිවියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකාර, නියෝජ්‍ය කළමනාකාර, සහකාර කළමනාකාර, ජ්‍යෙෂ්ඨ විධායක සහ මෙහෙයුම් කාර්මික වැනි ප්‍රධාන තනතුරු ඇතුළත් වූ අතර, ඔහු සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ආධුනිකයෙකු ලෙස ද ආරම්භයේදී කටයුතු කර ඇත.

හේමන්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර, ලංකා රසායන විද්‍යා ආයතනයෙන් (MI.Chem. C සහ LI.Chem. C) වෘත්තීය සුදුසුකම් ලබා ඇත. ඔහුට NAITA ආයතනය විසින් ආධුනික තාක්ෂණ ශිල්පී සහතිකයද පිරිනමා ඇත.

ඔහු SAP ERP ව්‍යාපෘතියේ ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස සේවය කිරීම, ගැන්ට්‍රි පුළුල් කිරීම සහ පොම්ප කිරීමේ ධාරිතාව ඉහළ නැංවීම සහ කොලොන්නාව පර්යන්තයේ නිෂ්පාදන වෙනස්කම් අවම කිරීම ඇතුළුව ඔහුගේ සේවා කාලය තුල CPSTL ආයතනය වෙත සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත. මීට අමතරව, ඔහු බංකර් ඉන්ධන මෙහෙයුම් කළමනාකරණය, CPSTL ආයතනය සඳහා සම්පූර්ණ ස්වයංක්‍රීය කරන ලද ටැංකි රථ දත්ත සමුදායක් (Database) සංවර්ධනය කිරීම, ස්වයංක්‍රීය ටැංකි මැනීමේ පද්ධතියක් සහ Power BI භාවිතා කරමින් සම්පූර්ණ ස්වයංක්‍රීය සැලසුම් සහ වාර්තා උත්පාදන මෙවලමක් නිර්මාණය කරන ලදී.

ආයතනයේ මෙහෙයුම් හැකියාවන් වැඩිදියුණු කරමින් සහ රටේ විකාශනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා හේමන්ත මහතාගේ කැපවීම සහ පුළුල් අත්දැකීම් CPSTL ආයතනය වෙත අගනා වත්කමකි.



ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා

අධ්‍යක්ෂ

ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයෙහි විශේෂ ශ්‍රේණි නිලධාරියෙකු වන අතර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරයි. රාජ්‍ය අංශයේ නායකත්වයේ වසර විස්සකට වැඩි පළපුරුද්දක් ඇති ඔහු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතනවල ප්‍රධාන තනතුරු හොබවා ඇත.

ඔහු ඕස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබාගෙන ඇත. එසේම, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) (ගෞරව) උපාධිය ද ලබා ඇත.

වර්තමානයේදී බණ්ඩාර මහතා ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව සහ තිරසාර බලශක්ති අධිකාරිය යන ආයතනයන්හී අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කරන අතර, CPSTL හි විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි. ඔහු තේ පර්යේෂණ ආයතනය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ඇතුළු ජාතික ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල ද සේවය කර ඇත.



දීපක් දාස් මහතා
අධ්‍යක්ෂ

දීපක් දාස් මහතා NIT Silchar හි යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරියෙකු වන අතර බනිජතෙල් කළමනාකරණය පිළිබඳ සහතිකයක් දරයි. බනිජතෙල් ක්ෂේත්‍රයේ වසර 27කට වැඩි ප්‍රවීණතාවයක් ඇති දාස් මහතාට Global Fortune 500 සමාගමක් වන සීමාසහිත ඉන්දියන් ඔයිල් කෝපරේෂන් ලිමිටඩ් (IOCL) හි විවිධ භූමිකාවන් පිළිබඳ පුළුල් අත්දැකීම් තිබේ.

ඔහු ඉන්දියාවේ කේරළ ප්‍රාන්තය, තෙලන්ගානා, ආන්ද්‍ර ප්‍රදේශ්, රාජස්ථාන්, බටහිර බෙංගාලය සහ ඊසානදිග ප්‍රාන්තවල විශාල භූගෝලීය ප්‍රදේශ ආවරණය කරමින් විවිධ තනතුරුවල ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය.

සිල්ලර විකුණුම් සහ මෙහෙයුම් අංශයේ ඔහුගේ විවිධ ප්‍රධාන තනතුරු හැරුණු විට, දාස් මහතා ඉන්දියාවේ බලශක්ති සිතියමට ලක්ෂවදීප් දූපත් ගෙන ඒම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ඔහු කේරළ ප්‍රාන්තයේ සිල්ලර විකුණුම් ප්‍රධානියා ලෙස කටයුතු කළ කාලය තුළ දූපත් දෙකක ගබඩා පර්යන්ත ඇතුළුව ලක්ෂවදීප් හි කවරට්ටි, මිනිකෝයි ඇන්ඩ්‍රොට් සහ කල්පේනි දූපත්වල බනිජතෙල් සිල්ලර අලෙවිසැල් පිහිටුවන ලදී.

ලංකා IOC පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ඔහුගේ ප්‍රධාන භූමිකාවට අමතරව, දාස් මහතා ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු CPC සහ ලංකා IOC හි හවුල් ව්‍යාපාරයක් වන Trinco Petroleum Terminal (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වේ. එසේම, ඔහු ඉන්දියානු ප්‍රධාන විධායක නිලධාරී සංසදයේ සභාපති (රජයේ සම්බන්ධීකරණ) ලෙස සේවය කරන අතර ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ඉන්දියානු සංගමය වැනි විවිධ මණ්ඩලවල ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ඔහු විසින් දිවයින පුරා සිටින අසරණ පුද්ගලයින්ට උපකාර කිරීම සඳහා විවිධ සමාජ සත්කාර වැඩසටහන් සංවිධානය කරයි.



අවිනාශ් සිංහාල් මහතා
අධ්‍යක්ෂ

අවිනාශ් සිංහාල් මහතා දිල්ලි විශ්ව විද්‍යාලයේ, හින්දු විද්‍යාලයේ වාණිජ උපාධිධාරියෙකු වන අතර, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරීවරයෙකි.

අවිනාශ් සිංහාල් මහතා 2005 වර්ෂයේදී ඉන්දියානු තෙල් සංස්ථාවට සම්බන්ධ වී ඇති අතර වසර 19කට වැඩි කාලයක් මූල්‍ය, භාණ්ඩාගාර සහ බදු ක්ෂේත්‍රයේ මනා පළපුරුද්දක් සහ විවිධ අත්දැකීම් ඇති අයෙකි. ඔහු ඉන්දියානු තෙල් සංස්ථාවේ ආයතනික මුදල් කළමනාකරණය, ආයෝජක සබඳතා, වත්‍ර බදුකරණය සහ ගිණුම්කරණය වැනි මූල්‍ය ක්ෂේත්‍රවල විවිධ කාර්යයන් හසුරුවා ඇත. ඔහුට විදේශ විනිමය අවදානම් කළමනාකරණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ජාත්‍යන්තර වෙළඳපොළෙන් අරමුදල් රැස් කිරීම, ආයෝජක සබඳතා, ණය ශ්‍රේණිගත කිරීම් සහ සමාගම් තක්සේරු කිරීම් යන ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් අත්දැකීම් ඇත.

ඔහු වර්තමානයේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙහි ජ්‍යෙෂ්ඨ උප සභාපති (මූල්‍ය) ලෙස ද, මූල්‍ය කාර්යාංශයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි.



සුනිල් කාන්ත මහාරණ මහතා
අධ්‍යක්ෂ

සුනිල් කාන්ත මහාරණ මහතා ඉන්දියාවේ බුබනේස්වර් හි Xavier කළමනාකරණ ආයතනයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල බනිජතෙල් නිෂ්පාදන අලෙවිකරණය සහ මෙහෙයවීම පිළිබඳ වසර 17කට අධික මනා පළපුරුද්දක් ද ලබා ඇත.

ඔහු වර්තමානයේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙහි උප සභාපති (මෙහෙයුම්, ආනයන සහ විකුණුම්) ලෙස කටයුතු කරයි.

ඔහු ඉන්දියාවේ විවිධ තනතුරු සහ විවිධ ප්‍රදේශවල විකුණුම් වෘත්තිකයෙකු ලෙස වසර 15කට අධික කාලයක් සිල්ලර වෙළඳාම හසුරුවා ඇත. ජාල පුළුල්කරණය, සැපයුම් කළමනාකරණය සහ සිල්ලර යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා ඉන්දියාවේ ගෝවා හී ප්‍රාදේශීය සිල්ලර විකුණුම් ප්‍රධානියා ලෙස කණ්ඩායමක් ද මෙහෙයවා ඇත.

ඉන්දියන් ඔයිල් හි අලෙවිකරණ ප්‍රධාන කාර්යාලයේ සේවා කාලය තුළ ඔහු සිල්ලර වෙළඳ ව්‍යාපාර පරිවර්තන ව්‍යාපෘතිය මූලික කණ්ඩායමේ සාමාජිකයෙකු වූ අතර, රට පුරා පිහිටි සිල්ලර අලෙවිසැල්වල පහසුකම් සහ සේවා මට්ටම් වෙනස් කිරීම සඳහා බොහෝ මුල පිරීම් මෙහෙයවන ලදී.

ඔහු මෙහෙයුම් කාර්යාංශයේ ද සේවය කර ඇති අතර එහිදී ටැංකි, බංකර් සහ නල මාර්ග ඇතුළු පර්යන්ත මෙහෙයුම්වලට අදාල කටයුතු අධීක්ෂණය කර ඇත.



එච්.ටී.පී. චන්දන මහතා
අධ්‍යක්ෂ

එච්.ටී.පී. චන්දන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි (ACA). ඔහු සිය වෘත්තීය දිවිය CIC හෝල්ඩිංග්ස් පීඑල්සී හි ආරම්භ කර ඇති අතර, එහිදී ඔහු ගණකාධිකාරී, තොරතුරු තාක්ෂණ කළමනාකාර, සමූහ ව්‍යාපාර විශ්ලේෂක සහ ප්‍රසම්පාදන සාමාන්‍යාධිකාරී වැනි තනතුරු හරහා වසර 20කට අධික විවිධ අත්දැකීම් ලබාගෙන ඇත.

ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහුගේ ආයතනික පළපුරුද්දට අමතරව, චන්දන මහතා CP Associates හි වසර අටකට වැඩි කාලයක් හවුල්කරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර, මූල්‍ය හා ව්‍යාපාර උපදේශන ක්ෂේත්‍රයන්ට සිය ප්‍රවීණත්වය ලබා දී ඇත.

වර්තමානයේදී, ඔහු ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික දැක්මක් සහ පාලන පළපුරුද්දක් ගෙන එයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



ඕ.පී. කග්ගොඩ ආරච්චි මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)



ටී.වී. සරත්චන්ද්‍ර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)



ඊ.ඒ.ආර්.ඩී. බණ්ඩාර මහතා
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සහ පාලන) /
කළමනාකාර (පුහුණු හා ඵලදායිතා
සංවර්ධන)



එච්.එම්.යූ. බණ්ඩාර මහතා
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ඉංජිනේරු සහ උපකාරක සේවා) /
ඉංජිනේරු කළමනාකාර



ජේ.ඒ.යූ.ආර්.කේ. ජයලත් මහතා
කළමනාකාර - මූල්‍ය



එච්.එන්.බී.යූ. ජයවර්ධන මහතා
කළමනාකාර - ආරක්ෂක

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



එස්.එන්. ගමගේ මහත්මිය
කළමනාකාරිනී - ආයතනික කටයුතු



ඩබ්ලිව්.එම්.ටී.ඩබ්ලිව්.ඒ. බණ්ඩාර මහතා
කළමනාකාර - බෙදාහැරීම්



වෛද්‍ය ආර්. සුසිරිවර්ධන මහත්මිය
වෛද්‍ය නිලධාරිනී



මේජර් ආර්.එම්.එන්. ජයතිලක WWV RWP RSP (විශ්‍රාමික)
කළමනාකාර - විමර්ශන



එම්. පී. ඒ. ලක්මාල් මහතා
මෙහෙයුම් කළමනාකාර
තොග චලන හා තොග නිෂ්පාදන



එන්.එම්. මුනාස් මහතා
මානව සම්පත් කළමනාකාර

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



ඩබ්ලිව්.ජී.ජී.ඒ.ඩබ්ලිව්. ජයවර්ධන මහත්මිය
ප්‍රධාන නීති නිලධාරිනී



ජී.එච්.එන්.එම්. චන්ද්‍රසිරි මහතා
කළමනාකාර - රසායනාගාර



එම්.ඩී.ඒ. අශෝක කුමාර මහතා
කළමනාකාර - ගබඩා



එන්. ඩෙෆ්නි තස්නීම් මහතා
කළමනාකාර - ප්‍රසම්පාදන



සමන්මලී ගජධීර මහත්මිය
වැඩබලන ප්‍රධාන තොරතුරු නිලධාරිනී



සකුන්තලා ඒකනායක මහත්මිය
වැඩබලන කළමනාකාරිනී
තොරතුරු පද්ධති

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



ඩී.ආර්.ජේ. බෝපේආරච්චි මහතා
කළමනාකාර - අක්වෙරළ මෙහෙයුම්



සඳුන් ජිනදාස මහතා
වැඩබලන පර්යන්ත කළමනාකාර - මුතුරාජවෙල



ඩී.එම්.සී.පී.කේ. දිසානායක මහතා
නියෝජ්‍ය කළමනාකාර - මෝටර් වාහන



ඒ.ආර්. සේරසිංහ මහතා
නියෝජ්‍ය කළමනාකාර - අභ්‍යන්තර විගණන




ඩබ්ලිව්.එම්.පී.අයි.බී. වර්ණසූරිය මහතා
වැඩබලන කළමනාකාර
සෞඛ්‍ය, ආරක්ෂක, පාරසරික සහ තත්ත්ව (HSEQ)



මනෝජ් සිරිවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමනාකාර

කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණය


බාහිර ක්‍රියාකාරී පරිසරය
ආර්ථික හා බලශක්ති ක්ෂේත්‍රය
සමාජීය හා පාරිසරික සාධක
තාක්ෂණික පරිසරය
නියාමන හා අනුකූලතා අවශ්‍යතා
මෙහෙයුම්
ගබඩා මෙහෙයුම්
පර්යන්ත හැසිරවීම සහ ගබඩා කිරීම
පාර්ශවකරුවන් සමඟ සබඳතා
ප්‍රජාව හා හවුල්කරුවන් සමඟ සබඳතා
ප්‍රාග්ධනය
මූල්‍ය ප්‍රාග්ධනය
අරමුදල් හා ප්‍රතිලාභ
භෞතික ප්‍රාග්ධනය
යටිතල පහසුකම් හා වත්කම්
මානව සම්පත් ප්‍රාග්ධනය
ශ්‍රම බලකාය හා කුසලතා

උපායමාර්ගික පසුබිම සහ මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුමෙහි තීරණාත්මක කාර්යභාරය



30% විදුලි ජනනය

ඉන්ධන පිරවුම්හල් 1100 කට අධික ප්‍රමාණයක්

ප්‍රධාන අලෙවිසැල්

සහාය දක්වන ප්‍රධාන යටිතල පහසුකම්

බාහිර පරිසරය




තෙල් මිලෙහි උච්චාවචනය

දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වර්ධනය

පුනර්ජනනීය බලශක්ති ඉලක්ක: 2030 වන විට 70%

විදේශ විනිමය අභියෝග

ගබඩා ධාරිතාව




කොලොන්නාව පර්යන්තය
267,083 MT

මුතුරාජවෙල පර්යන්තය
208,321 MT


ප්‍රාදේශීය ඩිපෝ 11
11,243 MT

2025 මූල්‍ය වර්ෂයේ බෙදාහැරීම




CPC
Sinopec
LIOC
RM Parks

නිෂ්පාදන මිශ්‍රණය





පාර්ශවකරුවන් කෙරෙහි අවධානය



රජය
බලශක්ති සුරක්ෂිතභාවය

ආනයනකරුවන්
විශ්වාසනීය සැපයුම

සේවකයින්
ආරක්ෂාව ප්‍රථමයෙන්

ප්‍රජාවන්
භිරසාරත්වය

ඩිජිටල් සහ පරිසර, සෞඛ්‍ය හා ආරක්ෂණ (EHSS) මූලපිරීම්



ස්මාර්ට් පද්ධති

GPS රථවාහන සමූහ කළමනාකරණය

ශූන්‍ය හානි ආරක්ෂාව

හරිත ව්‍යාපෘති

ඉදිරි උපායමාර්ගික ප්‍රමුඛතා



යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව

ඩිජිටල් ඒකාබද්ධතාව

බලශක්ති විවිධාංගීකරණය

ත්‍රිකුණාමලය ටැංකි සංකීර්ණය ව්‍යාප්ත කිරීම

උපායමාර්ගික පසුබිම සහ මෙහෙයුම් පරිසරය

මෙහෙයුම් පරිසරය විශ්ලේෂණය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ, ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති යටිතල පහසුකම් පද්ධතියේ අතිශය තීරණාත්මක අංගයක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක විය. රටේ ප්‍රධාන බනිජතෙල් ගබඩා සහ ප්‍රවාහන සේවා සැපයුම්කරු ලෙස වෙනස්වෙමින් පවතින ආර්ථික හා භූදේශපාලනික පරිසරයක් තුළ ජාතික බලශක්ති ආරක්ෂාව, සැපයුම් අඛණ්ඩතාව සහ මෙහෙයුම් ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා CPSTL සුවිශේෂී හා අත්‍යවශ්‍ය භූමිකාවක් ඉටු කරයි.

සමාගමේ මෙහෙයුම් පරිසරය වර්ෂය තුළ පාර්ශවකරුවන්ගේ තිරසාර අපේක්ෂාවන්, ජාතික බලශක්ති ප්‍රතිපත්ති ප්‍රමුඛතා මෙන්ම කාර්යක්ෂමතාව, ආරක්ෂාව, තිරසාරභාවය සහ ඩිජිටල් සක්‍රීයකරණය පිළිබඳ වැඩිදියුණු වන අවශ්‍යතා මගින් ප්‍රබල ලෙස හැඩගැසී තිබිණි.

බාහිර මෙහෙයුම් පරිසරය

සමාගමේ මෙහෙයුම් පරිසරය පහත සඳහන් ප්‍රධාන බාහිර සාධක මගින් බලපෑමට ලක්විය:

- ගෝලීය බලශක්ති මිල උච්චාවචනයන් සහ භූ-දේශපාලනික අස්ථාවරතා
- ජාතික ආර්ථික හා ප්‍රතිපත්තිමය වෙනස්කම් (ඉන්ධන මිල නියාමන ප්‍රතිසංස්කරණ ඇතුළුව)
- පාරිසරික බැඳීම් සහ බලශක්ති පරිවර්තන අවශ්‍යතා- (පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය 2025දී 59% සිට 2030 වන විට 70% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය)
- විනිමය අනුපාත උච්චාවචනයන් සහ මූල්‍යමය අභියෝග

CPSTL බනිජතෙල් නිෂ්පාදන හිමිකාරිත්වය නොදරන අතර, පොදු භාවිත බනිජතෙල් පහසුකම් සැපයුම්කරුවෙකු ලෙස, ප්‍රධාන පාරිභෝගිකයන් සඳහා ආරක්ෂිත, කාර්යක්ෂම සහ විශ්වාසනීය ගබඩා කිරීම හා බෙදාහැරීමේ සේවාවන් පමණක් සපයයි.

- ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව (CPC)
- ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC)
- සිනොපෙක් එනර්ජි ලංකා (පුද්.) සමාගම
- ආර්. එම්. පාර්ක්ස් (පුද්.) සමාගම

ආර්ථික හා බලශක්ති අංශයේ වර්ධනයන්

- ගෝලීය බනිජතෙල් මිල උච්චාවචනයන් (Brent සාමාන්‍යය දළ වශයෙන් බැරල් එකකට ඇ.ඩො. 80)
- ශ්‍රී ලංකා ආර්ථිකය 5.0% ක ස්ථාවර සැබෑ දළ දේශීය නිෂ්පාදන වර්ධනයක් වාර්තා කළේය
- ඉදිකිරීම් අංශයේ යළි උද්දීපනයක් දක්නට ලැබුණි
- උද්ධමන ස්ථාවරතාවය - 2025 වසර තුළ 2% ට අඩු මට්ටමක පවතින ලදී.
- 2025 වසර තුළ ස්ථාවර සහ අඩු වෙළෙඳපොළ පොලී අනුපාත පැවතුණි.

CPSTL විසින් පහත සඳහන් යටිතල පහසුකම් මගින් රටපුරා ඉන්ධන සැපයුම් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී:

- තොග බනිජතෙල් පර්යන්ත
- නළ මාර්ග යටිතල පහසුකම්
- මාර්ග හා දුම්රිය ටැංකි රථ ප්‍රවාහන සේවා


රජයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තිමය දිශානතිය සහ LNG, පෙව ඉන්ධන හා අනෙකුත් විකල්ප ඉන්ධන වෙත ක්‍රමිකව සිදුවන විවිධාංගීකරණ ප්‍රවණතාවයන් සැලකිල්ලට ගනිමින්, CPSTL මෙම ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ උපායමාර්ගික අවධානයක් යොමු කර ඇත.

ගෝලීය පරිසරය

2025 වර්ෂයේදී ගෝලීය බනිජතෙල් ගබඩා හා පර්යන්ත කර්මාන්තය සාපේක්ෂව සමතුලිත වූ නමුත් ව්‍යුහාත්මකව පරිවර්තනය වෙමින් පවතින බලශක්ති වෙළඳපොළක් තුළ ක්‍රියාත්මක විය. ජාත්‍යන්තර බලශක්ති ඒජන්සිය (IEA) අනුව, ගෝලීය තෙල් ඉල්ලුම දිනකට බැරල් මිලියන 103-104 ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. එහි වර්ධන වේගය දිනකට බැරල් මිලියන 0.9-1.1 (mb/d) පමණට සීමා වී ඇති අතර, මෙය නැගී එන ආර්ථිකයන්ගෙන් ස්ථාවර ඉල්ලුම සහ සංවර්ධිත වෙළෙඳපොළවල ක්‍රමික කාර්යක්ෂමතා වැඩිදියුණු වීම මගින් බලපා ඇත.

කාර්තුමය ලෝක බනිජතෙල් නිෂ්පාදනය සහ පරිභෝජනය (2021 - 2025)


දිනකට බැරල් මිලියන



ගෝලීය බනිජතෙල් ගබඩා සහ පර්යන්ත කර්මාන්තය 2025 වසරේදී ද ශක්තිමත් සහ සාපේක්ෂව ස්ථාවර ධාරිතා මට්ටමකින් ක්‍රියාත්මක විය. ගෝලීය බනිජතෙල් ගබඩා ධාරිතාව බැරල් බිලියන 8 කට වඩා වැඩි මට්ටමක පවතින අතර, එය වාණිජ සහ උපායමාර්ගික තොග (Strategic reserves) යන දෙකම ආවරණය කරයි. අඛණ්ඩ පිරිපහදු ක්‍රියාවලීන් සහ සාමාන්‍යකරණය වූ තොග කළමනාකරණ චක්‍රයන් හේතුවෙන්, 2025 වසරේදී ගබඩා භාවිත මට්ටම් මධ්‍යස්ථ හා ස්ථාවර මට්ටමක පවතී. වෙළඳපල දැඩි ලෙස අස්ථාවර වූ පෙර කාලපරිච්ඡේදවලට වෙනස්ව, වර්තමානයේ ගබඩා කිරීම සඳහා පවතින ඉල්ලුම තීරණය වන්නේ මිල මත පදනම් වූ සමපේක්ෂන (Speculative) අවශ්‍යතා මත නොව, ප්‍රධාන වශයෙන් සැපයුම් දාම හා මෙහෙයුම් අවශ්‍යතා මතය.

කාර්තුමය ලෝක බනිජතෙල් තොග වෙනස්වීම (2021-2025)

දිනකට බැරල් මිලියන



2025 වසර තුළ ගෝලීය ඛනිජතෙල් මිල ගමන් මාර්ගය සාපේක්ෂව පාලිත පරාසයක් තුළ (බැරල් එකකට ඇ.ඩො. 70-90) පවතින ලදී. මෙය OPEC සහ එහි අනුබද්ධ ආයතන OPEC+ විසින් සිදුකරන ලද සැපයුම් කළමනාකරණ ක්‍රියාමාර්ග මෙන්ම OPEC නොවන නිෂ්පාදන රටවල ස්ථාවර සහ ප්‍රතිරෝධී නිෂ්පාදන මට්ටම් මගින් බලපෑමට ලක්විය. මෙම තත්ත්වයන් සාපේක්ෂව සමතුලිත වෙළඳපොළ ව්‍යුහයක් ගොඩනැගීමට දායක වූ අතර, දිගුකාලීන Contango (ඉදිරි මිල වැඩි වෙළෙඳපොළ තත්ත්වය) තත්ත්වයන් සීමිත වීම හේතුවෙන් විශාල පරිමාණයේ තොග ගොඩනැගීම සඳහා ඇති උත්තේජන අවම විය.


ඒ සමඟම, භූ-දේශපාලනික සාධක ගෝලීය ඛනිජතෙල් වෙළඳ ප්‍රවාහයන් දිගින් දිගටම ප්‍රතිනිර්මාණය කරමින් පවතී. රුසියාව-යුක්රේනය ගැටුමේ දිගුකාලීන බලපෑම් සහ වෙනස්වෙමින් පවතින සම්බාධක (Sanctions) පද්ධති හේතුවෙන් සැපයුම් මාර්ග දිගු හා සංකීර්ණ වී ඇති අතර, අතරමැදි ගබඩා, මිශ්‍රණ (Blending) සහ නැවත ප්‍රවාහන (Transshipment) මධ්‍යස්ථානවල උපායමාර්ගික වැදගත්කම ඉහළ ගොස් ඇත. මෙය සැපයුම් දාම කාර්යක්ෂමතාව සහ නම්‍යශීලීභාවය පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානගත පර්යන්ත යටිතල පහසුකම්වල කාර්යභාරය මෙයින් තවදුරටත් තහවුරු වී තිබේ.

ක්ෂේත්‍රය තුළ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික දියුණුව තවදුරටත් ප්‍රධාන සාධකයක් වී පවතී. ඩිජිටල් පර්යන්ත කළමනාකරණ පද්ධති (Digitalterminal Management Systems), ස්වයංක්‍රීය ටැංකි මැනීමේ ක්‍රම (Automated Tank Gauging) සහ පුරෝකථන නඩත්තු තාක්ෂණයන් (Predictive Maintenance Technologies) භාවිත කිරීම මගින් මෙහෙයුම්කරුවන්ට සිය කාර්යක්ෂමතාව 10%-15% දක්වා පරාසයකින් ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. එමෙන්ම, මෙමඟින් ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ තොග වාර්තාවල නිවැරදිභාවයද තහවුරු වේ. මෙහෙයුම් විශිෂ්ටත්වය (operational excellence) මඟින් ලාභ අනුපාත උපරිම කර ගැනීමට උත්සාහ කරන වර්තමාන වෙළඳපල පරිසරය තුළ මෙම දියුණුවීම් සුවිශේෂී ලෙස වැදගත් වේ.

දේශීය ආර්ථික පරිසරය


වැඩිදියුණු වන සාර්ව ආර්ථික මූලධර්ම සහ මිල පීඩන ලිහිල් වීම මඟින් ලබා දුන් සහායත් සමඟ, අස්ථාවර කාලපරිච්ඡේදයකින් පසුව 2025 වසරේදී දේශීය ආර්ථිකය ක්‍රමිකව ස්ථාවර වීමක් පෙන්නුම් කළේය. ආර්ථික වර්ධනය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවති අතර, දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 2024 තුන්වන කාර්තුවේ 5.3% සිට 2024 සිව්වන කාර්තුවේ 5.4% දක්වා ඉහළ ගොස්, 2025 පළමු කාර්තුවේ 4.8% දක්වා මදක් පහත වැටුණි. මධ්‍ය කාලීන ප්‍රක්ෂේපණයන් මඟින් පෙන්නුම් කරන්නේ, ප්‍රතිසාධන ගමන් මඟ සහ ව්‍යුහාත්මක බාධාවන් අතර සමබරතාවයක් පිළිබිඹු කරමින්, ආර්ථික වර්ධනය 4.8%-5.4% පරාසය තුළ ස්ථාවර වනු ඇති බවයි.

දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය (2024-2025)



වසර පුරා උද්ධමන තත්ත්වයේ සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුණි. 2025 වසරේ මුල් භාගය අවධමනකාරී (Deflationary) තත්ත්වයන්ගෙන් සංලක්ෂිත වූ අතර, එහිදී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) යන දෙකම - 4.0% සිට -4.2% දක්වා පහත වැටීමක් වාර්තා කළේය. මෙම ප්‍රවණතාව වසර පුරා ක්‍රමිකව වෙනස් වූ අතර, 2025 මැද භාගය වන විට උද්ධමනය ධන අගයකට පත් වූ අතර, දෙසැම්බර් මාසය වන විට එය 2.1%-2.9% දක්වා ළඟා විය.

උද්ධමනය 2025



අවධමනකාරී තත්ත්වයේ සිට මධ්‍යස්ථ උද්ධමනයක් දක්වා සිදු වූ මෙම සංක්‍රමණය හරහා ඉල්ලුම වර්ධනය වීම, මුදල් වීකකය ස්ථාවර වීම සහ සැපයුම් දාමයන් සාමාන්‍ය තත්ත්වයට පත්වීම පිළිබිඹු වේ. ඛනිජතෙල් අංශය සම්බන්ධයෙන් ගත්විට, මෙම වෙනස ප්‍රවාහන, විදුලි බල උත්පාදනය සහ කාර්මික ක්‍රියාකාරකම් යන ප්‍රධාන ක්ෂේත්‍රවල පරිභෝජන රටා මත සෘජු බලපෑම් ඇති කරයි. එහිදී ඉන්ධන ඉල්ලුම ආර්ථික නිෂ්පාදන මට්ටම් සහ මිල චලනයන් සමඟ සමීපව සම්බන්ධව පවතින බැවින්, මෙම ආර්ථික ගතිකත්වයන් අංශයේ සමස්ත ඉල්ලුම් ව්‍යුහය තීරණය කිරීමේදී වැදගත් සාධකයක් ලෙස ක්‍රියා කරයි.

වසරේ මුල් භාගයේ පැවති අඩු උද්ධමනය මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට සහ බලශක්ති නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාව (Affordability) වැඩි කිරීමට දායක වූ අතර, වසර අවසානය වන විට දක්නට ලැබුණු ක්‍රමානුකූල මිල ඉහළ යාම මඟින් පෙන්නුම් කරන්නේ මිල මට්ටම් වඩාත් සාමාන්‍ය තත්ත්වයකට පත්වෙමින් පවතින බවයි. මෙම සාමාන්‍ය තත්ත්වයට පත්වීම, සමස්ත ආර්ථික ව්‍යාප්තියට අනුකූලව මධ්‍යස්ථ වේගයකින් වුවද තිරසාර ඉල්ලුමක් වර්ධනය වීමට සහායක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ක්ෂේත්‍රමය දෘෂ්ටිකෝණයකින් බලන කල, සාර්ව ආර්ථික දර්ශක ස්ථාවර වීම හේතුවෙන් බොරතෙල් ගබඩා කිරීම සහ බෙදාහැරීම සඳහා වඩාත් පුරෝකථනය කළ හැකි ඉල්ලුමක් නිර්මාණය වී ඇති අතර, එය පෙර කාලපරිච්ඡේදවල පැවති අස්ථාවරත්වය අවම කිරීමට දායක වී ඇත. කෙසේ වෙතත්, ගෝලීය තෙල් මිල වෙනස්වීම්, විනිමය අනුපාත උච්චාවචනයන් සහ ආනයන මූල්‍යකරණ කොන්දේසි ඇතුළු බාහිර සාධක කෙරෙහි ආර්ථික වර්ධනය තවදුරටත් සංවේදීව පවතී.

සමස්තයක් ලෙස ගත් කල, 2025 වසරේ දේශීය ආර්ථික පරිසරය ස්ථාවරත්වය කරා යන සංක්‍රමණයක් පිළිබිඹු කරයි. එහි පවතින මධ්‍යස්ථ වර්ධනය සහ පාලිත උද්ධමනය, බොරතෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ ක්ෂේත්‍රය සඳහා වඩාත් පුරෝකථනය කළ හැකි මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කර ඇත.

ගබඩා මෙහෙයුම්

CPSTL හි ගබඩා මෙහෙයුම් උපායමාර්ගික ස්ථාන තුනක පිහිටා ඇත.

- කොලොන්නාව පර්යන්තය - මෙ. ටොන් 267,083ක ධාරිතාවය
- මුතුරාජවෙල පර්යන්තය - මෙ. ටොන් 208,321ක ධාරිතාවය
- තොග ගබඩා 11 - සමස්ත මෙ. ටොන් 11,243 ක ධාරිතාවය

කොලොන්නාව පර්යන්තය ප්‍රධාන උපායමාර්ගික බනිජතෙල් ගබඩා පර්යන්තයක් වන අතර, වැඩි ඉන්ධන ධාරිතාවක් පවත්වාගෙන යාමට එය ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරයි. එහිදී ඔක්ටේන් 92 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 66,891), ගුවන් යානා ඉන්ධන (මෙට්‍රික් ටොන් 38,988), දැව්තෙල් (මෙට්‍රික් ටොන් 48,120), ලංකා ඔටෝ ඩීසල් (මෙට්‍රික් ටොන් 50,971), සුපිරි ඩීසල් (මෙට්‍රික් ටොන් 17,232), ඔක්ටේන් 95 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 18,249), භූමිතෙල් (මෙට්‍රික් ටොන් 10,488) සහ නැප්තා (මෙට්‍රික් ටොන් 14,209) සඳහා ප්‍රමුඛ ගබඩා ධාරිතා පවත්වා ඇත.

කාර්මික භූමිතෙල් (මෙට්‍රික් ටොන් 1,593) සහ SBP (මෙට්‍රික් ටොන් 342) වැනි අඩු ධාරිතා ඉන්ධන වර්ග, විශේෂිත වෙළෙඳපොළ අවශ්‍යතා සඳහා සේවය සැපයීමේදී භාවිතයට ගනු ලබයි.


මුතුරාජවෙල පර්යන්තය විසින් ඔටෝ ඩීසල් (මෙට්‍රික් ටොන් 113,633) සහ ඔක්ටේන් 92 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 94,688) සඳහා ප්‍රමුඛතාවය ලබා දෙයි.

තොග ගබඩාවල (Bulk depots) ධාරිතාවය මෙට්‍රික් ටොන් 11,243 ක් වන අතර එහි සවිස්තරාත්මක විග්‍රහය පහත දැක්වේ.

ඉන්ධන වර්ගය	ලංකා ඔටෝ ඩීසල්	ඔක්ටේන් 92 පෙට්‍රල්	භූමිතෙල්	එකතුව (MT)
අනුරාධපුරය	1,042	303	126	1,471
බදුල්ල	1,058	155	51	1,264
මඩකලපුව	638	383	-	1,021
ගාල්ල	1,826	521	252	2,599
හපුතලේ	162	120	24	306
කන්කසන්තුරෙයි	232	136	51	419
කොටගල	1,013	239	130	1,383
කුරුණෑගල	1,249	620	-	1,869
මාතර	192	160	50	401
පේරාදෙණිය	239	269	-	509
එකතුව	7,652	2,907	685	11,243

මෙහෙයුම් කාර්යක්ෂමතාව CPSTL හි සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයක් ලෙස පවතී. ගබඩා කළමනාකරණය සහ නඩත්තු ක්ෂේත්‍රවල හොඳම භාවිතයන් (Best Practices) අනුගමනය කිරීම මගින් ප්‍රවාහන ධාරිතාව උපරිම කිරීම, නිෂ්ක්‍රීය කාලය අවම කිරීම, වියදම් අඩු කිරීම සහ සේවා සැපයුමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සමාගම ක්‍රියා කරයි.

ගබඩා ධාරිතා විශ්ලේෂණය



බෙදාහැරීමේ මෙහෙයුම්

ශ්‍රී ලංකාව පුරා ඉන්ධන බෙදා හැරීමේදී CPSTL ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, ජාතික ඉල්ලුම සපුරාලීම සඳහා බනිජතෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම සහතික කරයි. අපි පහත සඳහන් ආයතනවල අවශ්‍යතා වෙනුවෙන් සේවය සපයන්නෙමු:

- ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව (CPC)
- ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC)
- සිනොපෙක් ඵිනර්ජි ලංකා (පුද්.) සමාගම
- ආර්. එම්. පාර්ක්ස් (පුද්.) සමාගම
- යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (පුද්.) සමාගම

ඵලදායී බෙදාහැරීමක් සඳහා අපි උපායමාර්ගිකව පිහිටුවා ඇති පර්යන්ත (කොලොන්නාව සහ මුතුරාජවෙල) සහ ප්‍රාදේශීය ගබඩා මධ්‍යස්ථාන ප්‍රයෝජනයට ගන්නා අතර, දුම්රිය මාර්ග, නල මාර්ග සහ බව්සර් රථ (Road Tankers) භාවිතා කරන්නෙමු.

2025 මූල්‍ය වර්ෂය තුළ බෙදා හරින ලද මුළු පරිමාව

- එකතුව : 4,756,164 KL
- CPC : 3,449,198 KL (72.52%)
- LIOC : 435,050 KL (9.15%)
- සිනොපෙක් : 464,036 KL (9.75%)
- ආර්. එම්. පාර්ක්ස් : 407,880 KL (8.58%)

වැදගත් කරුණු

- **ඔටෝ ඩීසල්:** 34% ක ප්‍රතිශතයක් හිමිකර ගනිමින් බෙදාහැරීම් අතර පෙරමුණ ගනී.
- **ඔක්ටේන් 92/95 පෙට්‍රල්:** 34% ක ප්‍රතිශතයක් සමඟින් ඉතා සමීපව පසුපසින් සිටී.
- **ගුවන් යානා ඉන්ධන:** ගුවන් ප්‍රවාහනය සඳහා අත්‍යවශ්‍ය වන මෙය සමස්තයෙන් 13% කි.
- **දැව්තෙල් (Furnace Oil):** ප්‍රධාන වශයෙන් කාර්මික අරමුණු සඳහා භාවිතා වන මෙය 9% ක දායකත්වයක් ලබා දෙයි.

ඉතිරි නිෂ්පාදන හය මගින් නිශ්චිත කාර්මික සහ සුවිශේෂී වෙළඳපල අවශ්‍යතා සපුරාලූ අතර, ශ්‍රී ලංකාව තුළ විවිධත්වයෙන් යුත් සහ ශක්තිමත් බනිජතෙල් සැපයුම් දාමයක් පවත්වාගෙන යාමට CPSTL ආයතනය දක්වන කැපවීම ඒ හරහා තහවුරු විය.

සමාගමේ යටිතල පහසුකම් පර්යන්ත දෙකකින් (කොලොන්නාව සහ මුතුරාජවෙල) සහ ප්‍රාදේශීය ඉන්ධන ඉල්ලුමට සරිලන පරිදි සකස් කරන ලද ගබඩා මධ්‍යස්ථාන කිහිපයකින් (මාතර, පේරාදෙණිය, හපුතලේ, කන්කසන්තුරේ, කොටගල, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව සහ ගාල්ල යන ප්‍රදේශවල පිහිටා ඇති) සමන්විත වේ.

මෙම අතරින්, මුතුරාජවෙල සහ කොලොන්නාව පර්යන්තයන් ප්‍රධාන බනිජතෙල් ගබඩා මධ්‍යස්ථාන ලෙස කැපී පෙනෙන අතර, ඒවායේ සමස්ත ගබඩා ධාරිතාව ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 500,000ක් පමණ වේ. මුතුරාජවෙල පර්යන්තය ප්‍රධාන වශයෙන් ලංකා ඔටෝ ඩීසල් සහ ඔක්ටේන් 92 පෙට්‍රල් ගබඩා කිරීම සඳහා භාවිතා වන අතර, කොලොන්නාව පර්යන්තය කාර්මික භූමිතෙල්, සුපිරි ඩීසල්, විවිධ පෙට්‍රල් වර්ග, Jet A-1 ගුවන් ඉන්ධන සහ රසායනික ද්‍රාවක ඇතුළු විවිධ ඉන්ධන වර්ග ගබඩා කිරීම සඳහා යොදා ගැනේ.

මෙම පර්යන්තයන් සමාගමේ සැපයුම් දාමයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර, රටේ බනිජතෙල් ගබඩා හා බෙදාහැරීමේ අවශ්‍යතා බහුතරයක් සඳහා මූලික සහාය සපයයි.

CPSTL හි නිෂ්පාදන පරාසය ඔක්ටේන් 92 සහ 95, ඔටෝ ඩීසල්, සුපර් ඩීසල්, භූමිතෙල්, කාර්මික භූමිතෙල්, දැව්තෙල්, ගුවන් යානා ඉන්ධන සහ නැප්තා ඇතුළු විවිධ ඉන්ධන වර්ග රාශියකින් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ, සමාගම සමස්ත විකුණුම් පරිමාව ලීටර් බිලියන 4.7 කට අධික මට්ටමක පවත්වාගෙන ඇති අතර, එය ජාතික බලශක්ති අංශය තුළ සමාගමේ තීරණාත්මක භූමිකාව පිළිබිඹු කරයි. ප්‍රධාන නිෂ්පාදන විකුණුම් අතර ඔටෝ ඩීසල් ලීටර් බිලියන 1.62 ක්, ඔක්ටේන් 92/95 පෙට්‍රල් ලීටර් බිලියන 1.63 ක් සහ ගුවන් යානා ඉන්ධන ලීටර් මිලියන 612 කට අධික ප්‍රමාණයක් වාර්තා වී ඇත.

උපායමාර්ගික වැදගත්කම, භූ-දේශපාලනික සහ සාර්ව ආර්ථික පරිසරය

දකුණු ආසියාවේ වඩාත් කාර්යක්ෂම බනිජතෙල් පර්යන්ත මෙහෙයුම්කරු වීමේ දැක්මට අනුකූලව, CPSTL හි යටිතල පහසුකම් මඟින් ජාතික විදුලි බල උත්පාදනයෙන් 30% කට වඩා වැඩි ප්‍රමාණයකටත්, සිල්ලර ඉන්ධන පිරවුම්හල් 1,100 කට අධික සංඛ්‍යාවකටත් සහ තීරණාත්මක ජාතික ස්ථාපිතයන් සඳහාත් සහාය ලබා දෙයි.

ගෝලීය බනිජතෙල් මිල උච්චාවචනයන් සහ විදේශ විනිමය සීමාකම් පැවති තත්ත්වය තුළද, සමාගම වර්ෂය තුළ බනිජතෙල් නිෂ්පාදන මෙට්‍රික් කිලෝලීටර් මිලියන 4.7 කට අධික ප්‍රමාණයක් බෙදාහැරීමට සමත් වූ අතර, එය වාර්ෂිකව වාහන මිලියන හයක් පමණ ඉන්ධන සැපයීමට ප්‍රමාණවත් වේ.

ඉන්දියා-ශ්‍රී ලංකා හවුල්කාරිත්ව රාමුව යටතේ ක්‍රියාත්මක වන ත්‍රිකුණාමල තෙල් ටැංකි ගබඩා ව්‍යාපෘතිය (Trincomalee Tank Farm) පුළුල් කිරීම ඇතුළු ප්‍රාදේශීය බලශක්ති ආරක්ෂක මුලපිරීම් සඳහාද ප්‍රගතිය අඛණ්ඩව ලබා ඇත.

නිෂ්පාදනයේ නම	සිපෙට්කෝ	ලංකා අයි.ඕ.සී	සිනොපෙක්	ආර්.එම්. පාක්	එකතුව	ප්‍රතිශත කොටස (%)
පෙට්‍රල්	958,354	230,193	229,140	215,315	1,633,002	34.34%
ඔටෝ ඩීසල්	1,023,588	195,743	225,906	183,186	1,628,423	34.24%
සුපිරි ඩීසල් (සුපර් ඩීසල්)	32,618	9,115	8,989	9,379	60,101	1.26%
භූමිතෙල්	152,684	-	-	-	152,684	3.21%
කාර්මික භූමිතෙල්	11,808	-	-	-	11,808	0.25%
දැව්තෙල් 1.5%	405,441	-	-	-	405,441	8.52%
නැප්තා	251,015	-	-	-	251,015	5.28%
එස්.පී.බී	1,412	-	-	-	1,412	0.03%
ගුවන් යානා ඉන්ධන	612,279	-	-	-	612,279	12.87%
එකතුව	**3,449,198**	**435,050**	**464,036**	**407,880**	**4,756,164**	**100%**
මුළු ප්‍රමාණයෙන් ප්‍රතිශතය (%)	**72.52%**	**9.15%**	**9.75%**	**8.58%**	**100%**	

පාර්ශවකරුවන් කේන්ද්‍ර කරගත් මෙහෙයුම් ආකෘතිය

CPSTL ආයතනය ජාතික මහජන සේවා වගකීම් සහ වාණිජ මෙහෙයුම් විනය යන දෙකේ සන්ධිස්ථානයේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ බලශක්ති යටිතල පහසුකම් පද්ධතියේ අත්‍යවශ්‍ය සක්‍රීයකාරකයක් ලෙස, ආයතනය මෙහෙයුම් අඛණ්ඩතාව, ආරක්ෂණ සහතික කිරීම සහ විනිවිදභාවයෙන් යුතු පාලනය සමඟ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සමානුකූල කරමින්, ආර්ථිකයට සහ සමාජයට දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සහතික කරයි.

පාර්ශවකරුවන්	අපේක්ෂාවන්	CPSTL ප්‍රතිචාරය	වටිනාකම් ප්‍රතිඵල
රජය සහ නියාමන ආයතන	බලශක්ති ආරක්ෂාව සහ නියාමන අනුකූලතාව	උපායමාර්ගික ඉන්ධන සංචිත සහ ප්‍රතිපත්තිමය පෙළගැස්ම	ජාතික බලශක්ති ස්ථාවරත්වය
CPC සහ ඉන්ධන ආනයනකරුවන්	බාධාවකින් තොර, සුමට මෙහෙයුම් කටයුතු	සුමට මෙහෙයුම් කටයුතු නවීන පර්යන්ත සහ 24/7 මෙහෙයුම් හැසිරවීම	විශ්වාසනීය සැපයුම් දාමයක්
සේවකයින්	ආරක්ෂාව, වෘත්තීය වර්ධනය සහ ඇගයීම	පුහුණු වැඩසටහන්, ශක්තිමත් HSE ක්‍රමවේද සහ කාර්ය සාධන පදනම් කරගත් ප්‍රතිලාභ	උසස් සේවක උද්යෝගය සහ මරණ රහිත සේවා පරිසරයක්
පාරිභෝගිකයින්	ගුණාත්මක හා අඛණ්ඩ ඉන්ධන සැපයුම	ඩිජිටල් ලුහුබැඳීම සහ දැඩි තත්ත්ව පරීක්ෂණ	ශක්තිමත් විශ්වාසය සහ වර්ධනය වන පාරිභෝගික පදනම
සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්	සාධාරණත්වය, විනිවිදභාවය සහ කාලෝචිත ගෙවීම්	ඊ-ප්‍රසම්පාදන ක්‍රමවේද සහ කඩිනම් ගෙවීම් පියවීම්	දිගුකාලීන හවුල්කාරිත්වයන්
ප්‍රජාව	පාරිසරික රැකවරණය සහ සමාජීය සහයෝගය	ආයතනික සමාජ වගකීම් (CSR) සහ හරිත මෙහෙයුම්	සමාජීය වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා පිළිගැනීම
විගණකවරුන් සහ මූල්‍ය ආයතන	අඛණ්ඩතාව සහ ශක්තිමත් පාලන ක්‍රම	ශක්තිමත් ආයතනික පාලනය සහ IFRS වාර්තාකරණය	ආයතනික විශ්වාසය
මහජනතාව සහ මාධ්‍ය	විනිවිදභාවය සහ වගකීම්භාවය	නිල දැනුවත් කිරීම් සහ ඩිජිටල් මාධ්‍ය සම්බන්ධීකරණය	මහජන විශ්වාසය

තාක්ෂණික පෙළගැස්ම සහ ඩිජිටල්කරණය

පෙර වසරවල මුලපිරීම් තවදුරටත් ඉදිරියට ගෙනයමින්, ස්මාර්ට් තොග පාලන පද්ධති, GPS තාක්ෂණය සක්‍රීය කළ නාවික රථ කළමනාකරණය, මධ්‍යගත තත්කාලීන වාර්තාකරණය, දත්ත විශ්ලේෂණය, සහ වැටුප් ලේඛන ඩිජිටල්කරණය හරහා CPSTL ආයතනය සිය ඩිජිටල් සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ක්‍රමයෙන් ඉහළ නංවා ගන්නා ලදී.

නියාමන සහ අනුකූලතා පරිසරය

CPSTL ආයතනය, ජාතික වශයෙන් උපායමාර්ගික වැදගත්කමක් ඇති බනිජතෙල් ප්‍රවාහන සහ ගබඩාකරණ ආයතනයක් ලෙස, සම්පූර්ණ සහ පැහැදිලිව නිර්වචනය කළ නියාමන හා අනුකූලතා රාමුවක් යටතේ ක්‍රියාත්මක වේ. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය, පාරිසරික භාරකාරත්වය, රාජ්‍ය අංශයේ පාලනය සහ ජාත්‍යන්තර බැඳීම් සමඟ පෙළගැස්ම සහතික කරමින්, බහුවිධ ව්‍යවස්ථාපිත සහ අංශීය බලධාරීන් විසින් මේ සඳහා අධීක්ෂණය ක්‍රියාත්මක කරනු ලබයි.

නියාමන ක්ෂේත්‍රය	ප්‍රධාන නියාමකයින් සහ රාමු	අනුකූලතා අවධානය
බලශක්ති සහ අංශීය පාලනය	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත	ප්‍රතිපත්තිමය පෙළගැස්ම, අංශීය නියාමනය සහ මෙහෙයුම් බලපත්‍ර
පාරිසරික කළමනාකරණය	මධ්‍යම පරිසර අධිකාරිය (CEA) ජාතික පාරිසරික පනත පරිසර අමාත්‍යාංශය	විමෝචන පාලනය, අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) සහ විගණන
සෞඛ්‍ය සහ ආරක්ෂාව	කර්මාන්තශාලා ආඥා පනත ජාතික ගිනි ආරක්ෂණ රෙගුලාසි	සේවා ස්ථාන ආරක්ෂාව, ගිනි වැළැක්වීම, අවදානම් කළමනාකරණය
වෙළඳ හා රේගු	ශ්‍රී ලංකා රේගුව BOI	ආනයන පාලනය, බදු සහ සහන
මූල්‍ය හා විගණන අනුකූලතාව	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව CA ශ්‍රී ලංකා/ IFRS ජාතික විගණන පනත	බදු අනුකූලතාවල විගණන සහතික කිරීමල මූල්‍ය විනිවිදභාවය
කම්කරු සහ මානව සම්පත්	කම්කරු අමාත්‍යාංශය කම්කරු නීති කාර්මික ආරවුල් පනත	සේවක අයිතිවාසිකම්, ප්‍රතිලාභ සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය.
ප්‍රසම්පාදන සහ පාලනය	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	විනිවිදභාවය සහ වගකීම් සහිත සැපයුම් ක්‍රියාවලිය
ගුණාත්මකභාවය සහ ප්‍රමිති	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)	නිෂ්පාදන තත්ත්වය සහ ප්‍රමිතිකරණය
ජාත්‍යන්තර බැඳීම්	ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය	නාවික ඉන්ධන අනුකූලතාව සහ බංකරීකරණ ප්‍රමිතීන්

පාරිසරික, සෞඛ්‍ය, ආරක්ෂාව සහ තිරසාරභාවය (EHSS) සම්බන්ධ ප්‍රවර්ධක සාධක

පරිසර සහ ආරක්ෂණ රෙගුලාසි වඩාත් වඩාත්ම දැඩි වෙමින් පවතී. ජාතික විමෝචන ප්‍රමිතීන්, උපද්‍රවකාරී ද්‍රව්‍ය පරිහරණය කිරීමේ රීති සහ වෘත්තීය සෞඛ්‍ය ව්‍යුහයන් සපුරාලීම සඳහා CPSTL ආයතනය සිය මෙහෙයුම් ක්‍රමවේද කල්තියාම උත්ශ්‍රේණි කර ඇත. මෙම වසර තුළදී, තෙල් කාන්දු වීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සූදානම සහ ගිනි ආරක්ෂණ සන්නද්ධතාව සම්බන්ධයෙන් සැලකිය යුතු දියුණුවක් ළඟා කර ගැනීමට අපට හැකි විය.



EHSS ධාවකය	උපායමාර්ගික අවධානය	ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාමාර්ග	ඇතිවූ බලපෑම
පරිසරය	පාරිසරික බලපෑම අවම කිරීම	විමෝචන නිරීක්ෂණය, ජල සංරක්ෂණය, අපද්‍රව්‍ය වෙන් කිරීම	අනුකූලතාවය වැඩිදියුණු වීම, කාබන් විමෝචන අඩුවීම
සෞඛ්‍යය	සේවක සුභසාධනය සහතික කිරීම	වාර්ෂික වෛද්‍ය පරීක්ෂණ, දැනුවත් කිරීමේ වැඩසටහන්	සේවකයින් සේවයට වාර්තා නොකිරීම (නිවාඩු ගැනීම) අඩු වීම, සෞඛ්‍ය සම්පන්න සේවා බලකායක් බිහිවීම
ආරක්ෂාව	ශූන්‍ය හානි	ආරක්ෂක පෙරහුරු, පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය තහවුරු කිරීම, අනතුරු වාර්තාකරණ පද්ධතිය	ශූන්‍ය මරණ අනුපාතය, ඉතා අවම අනතුරු අනුපාතය
තිරසාරභාවය	දිගුකාලීන සම්පත් කාර්යක්ෂමතාව	සූර්ය බලශක්ති නියමු ව්‍යාපෘති, ඉන්ධන අපතේ යාම (අලාභය) අවම කිරීම	මෙහෙයුම් පිරිවැය ඉතිරි වීම, හරිත ප්‍රතිරූපයක් ගොඩනැඟීම
නියාමන අනුකූලතාව	ජාතික සහ ගෝලීය EHSS ප්‍රමිතීන්ට අනුකූල වීම	අනුකූලතා විගණන පැවැත්වීම	ඇගයීමට ලක්වීම සහ අවදානම් අවම කරගැනීම
පාර්ශවකරුවන්ගේ සම්බන්ධතාවය	සියල්ලන් ඇතුළත් සහ විනිවිදභාවයෙන් යුත් EHSS සන්නිවේදනය	තිරසාරත්ව වාර්තා පිළියෙල කිරීම, ප්‍රජා උපදේශන	විශ්වාසය වැඩිවීම, ශක්තිමත් සම්බන්ධතා

උපායමාර්ගික අවධානය

අනාගතය දෙස බලන විට, CPSTL ආයතනය ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, ඩිජිටල් ඒකාබද්ධතාවය වේගවත් කිරීම. EHSS (පරිසර, සෞඛ්‍ය, ආරක්ෂණ සහ සුරක්ෂිතතා) කාර්යසාධනය නැංවීම සහ ජාතික බලශක්ති විවිධාංගීකරණ උපාය මාර්ග සඳහා සහාය වීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. චින්න චින්නම සංකීර්ණ වන මෙහෙයුම් පරිසරයක සාර්ථකව ඉදිරියට යාම සඳහා ශක්තිමත් පාලනය, කල්තියා අවදානම් කළමනාකරණය කිරීම සහ පාර්ශවකරුවන් කේන්ද්‍ර කරගත් මෙහෙයුම් අඛණ්ඩව ප්‍රධානතම සාධක ලෙස පවතිනු ඇත.

- ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව උත්ශ්‍රේණි කිරීම
- ඩිජිටල් ඒකාබද්ධතාවය
- බලශක්ති විවිධාංගීකරණය සහ අනාගත සන්නද්ධතාව

මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය සමාලෝචනය


2025 වර්ෂයේදී, අපගේ මූල්‍ය ප්‍රාග්ධනය අපගේ මෙහෙයුම්වල මූලික පදනම ලෙස පවතිමින්, බනිජතෙල් ක්ෂේත්‍රයට විශේෂිත සේවාවන් සැපයීමට සහ දිගුකාලීන ස්ථාවරත්වය පවත්වාගෙන යාමට මෙන්ම අපගේ පාර්ශවකරුවන්ගේ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීමට අපට හැකියාව ලබා දුන්නේය. වර්ෂය පුරාම, අපගේ ප්‍රධාන කොටස් හිමියන්ගේ අවශ්‍යතා සහ බලශක්ති ක්ෂේත්‍රයේ ඉහළ පිරිවැය අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද, විනයගරුක හා පැහැදිලි මූල්‍ය කළමනාකරණ උපායමාර්ගයක් අපි අනුගමනය කළෙමු.

අපගේ ආර්ථික මාර්ගසටහන මුදල් ප්‍රවාහය ආරක්ෂා කිරීම, ක්‍රියාකාරී ප්‍රාග්ධනය කාර්යක්ෂම කිරීම සහ යටිතල පහසුකම්, ආරක්ෂක ක්‍රියාමාර්ග සහ තාක්ෂණික කාර්යසාධනය සඳහා අත්‍යවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා අරමුදල් සැපයීම මත කේන්ද්‍රගත විය. පහත දැක්වෙන විස්තරය තුළින් අපගේ මූල්‍ය ප්‍රතිඵල සහ ප්‍රාග්ධන වෙන්කිරීම් ඉදිරිපත් කර ඇති අතර, සේවා ගිවිසුම් පවත්වාගෙන යාම, සේවක හැකියාවන් වර්ධනය කිරීම සහ උපායමාර්ගික ව්‍යාප්තිය අරමුණු කරගනිමින් අප සම්පත් භාවිතා කළ ආකාරය පැහැදිලි කරයි.

මූල්‍ය කාර්යසාධනය

ආදායම


විකුණුම් පරිමාව (කිලෝ ලීටර් මිලියන)



ලාභදායීතාවය

ආදායම් වර්ධන ප්‍රවණතාවයට අනුකූලව, සමාගමේ දළ ලාභය 2024 වර්ෂයේ රු. බිලියන 9.3 සිට 2025 වර්ෂයේදී රු. බිලියන 9.76 දක්වා ඉහළ ගියේය. 2024 වර්ෂය පුරා පවත්වාගෙන ගිය 49% දළ ලාභ ආන්තිකය සමඟ සසඳන විට, 2025 වර්ෂයේදීද දළ ලාභ ආන්තිකය 48% ලෙස ශක්තිමත්ව පවත්වාගෙන යාමට සමාගම සමත් විය.


ආදායම් සහ දළ ලාභ ආන්තික ප්‍රවණතාවය (රු. මිලියන)




පසුගිය වර්ෂයේ ලාභදායීතාව තවදුරටත් ශක්තිමත් කරමින්, සමාගම 2025 වර්ෂයේදී රු. බිලියන 5.1 ක මෙහෙයුම් ලාභයක් අත්කර ගැනීමට සමත් විය. මෙහෙයුම් ලාභ ආන්තිකය 25% මට්ටමේ පවත්වාගෙන යාමට හැකි වූ අතර, එය 2024 වර්ෂයේදීද 25% ආන්තිකයක් සමඟ වාර්තා කළ රු. බිලියන 4.6 ක ලාභය සමඟ සසඳන විට සමාගමේ අඛණ්ඩ මූල්‍ය ස්ථාවරත්වය පිළිබිඹු කරයි.

මෙහෙයුම් කාර්යසාධනය

මෙහෙයුම් කාර්යසාධනය



බදු ගෙවීමට පෙර සහ බදු ගෙවීමෙන් පසු ලාභ (රු. මිලියන)



සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ, සමාගම ඉහළ වර්ධන ප්‍රවණතාවක් අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති අතර, බදු ගෙවීමට පෙර ලාභය (PBT) 2024 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 4.9 සිට 2025 වර්ෂයේදී රු. බිලියන 5.5 දක්වා ඉහළ ගොස් ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ආදායම් කාර්යසාධනය අඛණ්ඩව ශක්තිමත්ව පවත්වාගෙන යාම සහ පුළුල් කළ ආයෝජන කළඹක් හේතුවෙන් ආයෝජන ආදායම 9% කින් ඉහළ යාම බලපා ඇත.

මූල්‍ය ආදායම, ස්ථාවර තැන්පතු සහ රිපෝ ගිවිසුම් මත ලැබෙන පොලී ආදායමෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර, එය ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස පවතී. අනෙකුත් ආදායම් මාර්ග ලෙස පරීක්ෂණාගාර ආදායම්, සේවක ණය මත පොලී ආදායම් සහ ආපසු නොගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ඇතුළත් විය.


පෙර වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් 12% කින් ඉහළ ගියද, සමාගම 2025 වර්ෂයේදී රු. බිලියන 3.8 ක බදු පසු ලාභයක් (PAT) ලබා ගැනීමට සමත් වූ අතර, එය 2024 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 3.3 ඉක්මවා ගොස් ඇත. මෙය ඉදිරිපත් කර ඇති වසර හයක කාලසීමාව තුළ වාර්තා වූ ඉහළම ලාභදායිතා මට්ටම නිරූපණය කරන අතර, සමාගමේ මූල්‍ය ශක්තිමත්භාවය තවදුරටත් තහවුරු කරයි.

සමාගමේ අනෙකුත් විස්තීර්ණ ආදායම (OCI) මෙම කාලසීමාව තුළ ප්‍රධාන වශයෙන් ඉඩම් හා ගොඩනැගිලි නැවත ඇගයීමෙන් ලැබූ ලාභ සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ක්‍රියාකාරී වාර්ෂික ගණනයන් (Actuarial Calculations) මගින් ඇති වූ අලාභයන් හේතුවෙන් බලපෑමට ලක් විය.

මූල්‍ය තත්ත්වය

මුළු වත්කම්

වත්කම්වල සංයුතිය




සමාගමේ වත්කම්වලින් 76.86% ක් දේපළ, පිරියත සහ උපකරණ (Property, Plant and Equipment) සඳහා වෙන් කර ඇති අතර, එය අපගේ ප්‍රාග්ධන මූලික වූ මෙහෙයුම් ස්වභාවය පිළිබිඹු කරයි. මෙම වෙන්කිරීම සමාගමේ මූලික මෙහෙයුම් ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සහ දිගුකාලීන ආදායම් උත්පාදන හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ගත් අපගේ දිගුකාලීන කැපවීම නිරූපණය කරයි.

සමාගමේ මුළු වත්කම්වලින් 15.30%ක් වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් (Trade and Other Receivables) ලෙස පැවතුණි. නිරෝගී මුදල් ප්‍රවාහයක් පවත්වාගෙන යාම සහ කාරක ප්‍රාග්ධනය (Working Capital) මත ඇති පීඩනය අවම කිරීම සඳහා, ණය අවදානම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හා ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීම සම්බන්ධයෙන් සමාගම අඛණ්ඩ අවධානය යොමු කරයි.

මුදල් හා මුදල් සමාන දෑ (Cash and Cash Equivalents) සමාගමේ මුළු වත්කම්වලින් 2.89%ක් නියෝජනය කළ අතර, එමඟින් දෛනික මෙහෙයුම් අවශ්‍යතා සහ කෙටි කාලීන වගකීම් සපුරාලීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව (Liquidity) සමාගම සතුව පවත්වාගෙන යනු ලැබේය.

මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)

මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)



සමාගමේ වත්කම් ව්‍යුහය ශක්තිමත් භෞතික යටිතල පහසුකම් මත පදනම් වී ඇති අතර, ද්‍රවශීලතාවය සහ ලැබිය යුතු මුදල් කළමනාකරණය සඳහා දැඩි උපායමාර්ගික ප්‍රවේශයක් පිළිබිඹු කරයි. අපගේ මූල්‍ය ප්‍රාග්ධන වෙන්කිරීම, වර්ධනය, කාර්යක්ෂමතාව සහ වටිනාකම් සංරක්ෂණය යන අපගේ දිගුකාලීන උපායමාර්ගික ඉලක්ක සමඟ අනුකූලව පවත්වාගෙන යයි.වෙනස් වන වෙළඳපොළ පරිසරය තුළ මෙහෙයුම් ශක්තිමත්භාවය සහ මූල්‍ය ස්ථාවරභාවය යන දෙකම තහවුරු කිරීම සඳහා අපගේ වත්කම් මිශ්‍රණය ප්‍රශස්ත කිරීම සඳහා අපි කැපවී සිටිමු.

2025 වසර අවසානයේදී, මූල්‍ය ප්‍රකාශනවල දීර්ඝකාලීන වත්කම් (Non-Current Assets) තුළ මුළු වත්කම් වලින් සැලකිය යුතු කේන්ද්‍රගත වීමක් දක්නට ලැබුණු අතර, ඒවායේ මුළු වටිනාකම රු. බිලියන 83.0ක් විය. ඒ අතරතුර, කෙටි කාලීන වත්කම් (Current Assets) රු. බිලියන 23.1ක් ලෙස වාර්තා විය.අපගේ ස්ථාවර වත්කම්වල වර්ධනයට ප්‍රධාන සාධකයක් වූයේ ඉඩම් හා ගොඩනැගිලි නැවත ඇගයීම (Revaluation) වන අතර, එය අපගේ දේපළ, පිරියත සහ උපකරණ (Property, Plant and Equipment) හි ගිණුම්ගත වටිනාකම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හේතු විය.

මුළු වත්කම් පදනම සැලකිය යුතු පරිවර්තනයකට ලක්ව 2025 වර්ෂයේදී රු. බිලියන 106.2ක් දක්වා (කෙටි කාලීන සහ දීර්ඝකාලීන වත්කම් එක්කර) ඉහළ ගොස් ඇත. මෙම සැලකිය යුතු වර්ධනය නැවත ව්‍යුහගත කිරීමේ ක්‍රියාමාර්ගවල බලපෑම සහ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්ය සාධනය යන දෙකම පිළිබිඹු කරයි.

එසේම, ඉහළ ආදායම් උත්පාදනය සහ දිගුකාලීන ලැබිය යුතු මුදල් සාර්ථකව එකතු කිරීම හේතුවෙන් මුදල් සහ මුදල් සමාන දේ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.


ක්‍රියාකාරී ප්‍රාග්ධනය

2020 සිට 2025 දක්වා වූ වසර හයක කාලසීමාව පුරාම සමාගම ශක්තිමත් ද්‍රවශීලතා (liquidity) තත්ත්වයක් පවත්වාගෙන ඇති අතර, එය විචක්ෂණශීලී මූල්‍ය ප්‍රාග්ධන කළමනාකරණය සහ වගකීම් සම්බන්ධ විධිමත් ප්‍රවේශයක් පිළිබිඹු කරයි.

ද්‍රවශීලතා තත්ත්වය මැනීමේ ප්‍රධාන දර්ශකයක් වන ජංගම අනුපාත අගය මුළු කාලසීමාව පුරාම 5.0 මට්ටමට වඩා ඉහළින් පවත්වාගෙන ගොස් ඇති අතර, එය සමාගමේ කෙටි කාලීන බැඳීම් පහසුවෙන් සපුරාලීමේ හැකියාව තහවුරු කරයි. 2025 වර්ෂයේදී මෙම අනුපාතය 7.01 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 2024 වර්ෂයේ වාර්තා වූ 5.53 සමඟ සැසඳීමේදී ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් නිරූපණය කරයි.

ඒ හා සමානව ක්ෂණික වත්කම් අනුපාතයද සැලකිය යුතු වර්ධනයක් පෙන්වමින් 2025 වර්ෂයේදී 6.75 දක්වා ඉහළ ගොස් ඇති අතර, 2024 වර්ෂයේ වාර්තා වූ 5.28 සමඟ සැසඳීමේදී වර්ධනයක් පෙන්නුම් කරයි. පෙර වර්ෂයේ අඩුවීම ක්‍රියාකාරී මෙහෙයුම් සඳහා සහාය වීම සඳහා 2023 දී රු. මිලියන 2,262 සිට 2024 දී රු. මිලියන 3,473 දක්වා කෙටි කාලීන වගකීම් ඉහළ යාම සමඟ සම්බන්ධ වූවක් වන අතර, 2025 වර්ෂයේදී ද්‍රව වත්කම් වර්ධනය එම වගකීම් වර්ධනයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි.

වත්මන්/ඉක්මන් වත්කම් අනුපාතය - වාර




වත්කම් පිරිවැටුම් අනුපාතය

වත්කම් පිරිවැටුම් අනුපාතය මඟින් සමාගම තම වත්කම් විකුණුම් උත්පාදනය සඳහා භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව මැනවින් නිරූපණය කරයි. 2025 මූල්‍ය වර්ෂයේදී, රු. මිලියන 20,520 ක ආදායමක් රු. මිලියන 106,161 ක මුළු වත්කම් පදනමකට සාපේක්ෂව ගණනය කිරීමෙන් මෙම අනුපාතය 19%ක් ලෙස වාර්තා විය. මෙය 2024 වර්ෂයේ වාර්තා වූ 40% සමඟ සැසඳීමේදී වෙනස්කමක් පෙන්නුම් කළද, මෑතකාලීන නැවත ඇගයීම් (revaluations) හේතුවෙන් සැලකිය යුතු ලෙස පුළුල් වූ වත්කම් පදනම එයට ප්‍රධාන හේතුව වේ.


පෙර වසරට සාපේක්ෂව, මුළු ආදායම ඉහළ අගයකින් වර්ධනය වූ අතර, 2025 වර්ෂයේදී රු. මිලියන 20,520 දක්වා ඉහළ ගොස් ඇත. මෙය පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 18,898 සමඟ සැසඳීමේදී ස්ථාවර වර්ධනයක් නිරූපණය කරයි. වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්ය සාධනය ද මෙම වර්ධනයට හේතු විය.

ඒ සමඟම, සමාගමේ සමස්ත වත්කම් පදනම 2024 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 61,285 සිට 2025 වර්ෂයේදී රුපියල් මිලියන 106,161ක් දක්වා විශාල ලෙස පුළුල් විය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වටිනාකමෙහි සිදු වූ මෙම සැලකිය යුතු වැඩිවීම ප්‍රධාන වශයෙන් ඉඩම්, ගොඩනැගිලි, ගබඩා ටැංකි සහ මෝටර් වාහන ඇතුළු දේපළ නැවත තක්සේරු කිරීම හේතුවෙන් සිදු විය.

වත්කම් පිරිවැටුම් අනුපාතය



අරමුදල් ව්‍යුහය



කොටස් හිමිකම් සහ වගකීම්

අරමුදල් ව්‍යුහය

CPSTL සමාගම ශක්තිමත් ප්‍රාග්ධන තත්වයක් පවත්වාගෙන යමින්, 2025 වසර අවසානය වන විට කොටස් හිමියන්ගේ අරමුදල් (Shareholders' Fund) රු. බිලියන 79.0ක් දක්වා ළඟා කර ඇත. 2016 වසරේදී සියලු ණය සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කිරීමෙන් පසු, සමාගම මේ වසරේදීද නව ණය ලබා නොගැනීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.


2025 වන විට සමාගමේ සමස්ත වගකීම් අතර දීර්ඝකාලීන වගකීම් (Non-Current Liabilities) රු. බිලියන 23.9ක් වන අතර, කෙටි කාලීන වගකීම් (Current Liabilities) රු. බිලියන 3.3ක් ලෙස වාර්තා වී ඇත.

සමාගමේ ප්‍රාග්ධන රාමුව විචක්ෂණශීලී ස්වභාවයකින් පවත්වාගෙන යන අතර, එය ශක්තිමත් කොටස් හිමිකම් පදනමකින් (equity base) සහාය ලබා ඇත. මෙම යහපත් මූල්‍ය පදනම CPSTL සමාගමට ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට හැකියාව ලබා දෙන අතර, වෙළඳපොළ තුළ ඇති අවදානම් සහ වෙනස්වීම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය නම්‍යශීලීභාවය සහ ස්ථායීභාවයද පවත්වාගෙන යාමට උපකාරී වේ.

හිමිකම් මත ප්‍රතිලාභය

සමාගම 2025 වර්ෂයේදී කොටස් හිමිකම් මත ප්‍රතිලාභය (Return on Equity) 4.8%ක් ලෙස වාර්තා කළ අතර, එය 2024 වර්ෂයේ ලබාගත් 7.2% සමඟ සැසඳීමේදී මධ්‍යස්ථ අඩුවීමක් නිරූපණය කරයි. පෙර වර්ෂයේ දැඩි ප්‍රතිසාධනයෙන් පසුව මෙම තත්ත්වය සමාගමේ මූල්‍ය ශක්තිමත්භාවය අඛණ්ඩව පවත්වාගෙන යාමේ මඟට යමින් පවතින ස්ථායීකරණ අවධියක් ලෙස සැලකිය හැක.


හිමිකම් මත ප්‍රතිලාභ %



තෝලනය සහ ප්‍රාග්ධන ව්‍යුහය


සමස්තයක් වශයෙන්, සමාගමේ තෝලනය (Gearing Ratio) 2023 වසර දක්වා අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වාගෙන ගොස් ඇති අතර එය ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් නිරූපණය කරයි. කෙසේ වෙතත්, 2025 වසර අවසානය වන විට ණය භාවිත මට්ටම (leverage profile) ඉහළ යාමක් දක්නට ලැබුණු අතර, තෝලන අනුපාතය 34% දක්වා ඉහළ ගොස් ඇත. මෙය 2024 වසර අවසානයේ වාර්තා වූ 31% සමඟ සැසඳීමේදී සැලකිය යුතු වර්ධනයක් නිරූපණය කරයි.

ප්‍රාග්ධන ව්‍යුහය (රු. මිලියන)



තෝලන අනුපාතය (වාර)

තෝලන අනුපාතය (වාර)



කොටස් හිමියන්ගේ වටිනාකම් නිර්මාණය

	2025	2024
කොටසකට ඉපයීම (රු)	0.51	4.51
කොටසක ශුද්ධ වත්කම අගය (රු)	11	62

2024 සිට 2025 දක්වා කොටසකට ඉපයීම (EPS) සහ කොටසක ශුද්ධ වත්කම අගය (NAVPS) යන දෙකම සැලකිය යුතු ලෙස වර්ධනය වීම, අතිශය කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් සහ ප්‍රාග්ධන වටිනාකම් වර්ධනයක් පෙන්වයි. මෙම ඉහළ යන ප්‍රවණතාවය සමාගම විසින් තම උපායමාර්ගික ආයෝජන සාර්ථකව සැබෑ ලාභදායී ප්‍රතිඵල බවට පරිවර්තනය කර ඇති බවට සාක්ෂිය.

නිෂ්පාදන ප්‍රාග්ධනය

කොලොන්නාව පර්යන්තයේ ඉන්ධන ගබඩා ටැංකි ප්‍රසම්පාදනය, ඉදිකිරීම සහ භාවිතයට එක් කිරීම



කොලොන්නාව පර්යන්තයේ ඉන්ධන ගබඩා ටැංකි හයක් (06) ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මුල්ගල් තැබීමේ උත්සවය 2025 සැප්තැම්බර් 17 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම සුවිශේෂී ව්‍යාපෘතිය රටේ ඉන්ධන ගබඩා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මෙමඟින් ජාතික ඉන්ධන ගබඩා ධාරිතාව ඉහළ නැංවීම, බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව , විශ්වසනීයත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය ධාරිතාව මීටර් කියුබ් 15,000 බැගින් වූ ටැංකි තුනකින් (03), මීටර් කියුබ් 7,000 බැගින් වූ ටැංකි දෙකකින් (02) සහ මීටර් කියුබ් 5,000 එක් (01) ටැංකියකින් සමන්විත වන අතර, එමඟින් සමස්තයක් ලෙස මීටර් කියුබ් 64,000 ක අතිරේක ධාරිතාවක් එක් කෙරේ.

රුපියල් මිලියන 2,225ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුතුව 2019 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කරන ලද මුල් කොන්ත්‍රාත්තුව, අදාළ කොන්ත්‍රාත්කරුගේ සෑහීමකට පත් නොවිය හැකි කාර්ය සාධනය හේතුවෙන්, දෙපාර්ශවයේම සුහද එකඟතාවයකින් පසුව 2022 වසරේදී අවලංගු කරන ලදී.

හදිසි ජාතික ගබඩා අවශ්‍යතා සපුරාලීම සහ නව බනිජතෙල් සමාගම් වෙළඳපොළට පිවිසීම (සහභාගීත්වය) ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, CPSTL ආයතනය එහි ඉතිරි වැඩ කොටස නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව, 2025 සැප්තැම්බර් 10 දිනැති කැබිනට් අනුමැතියට අනුකූලව, රුපියල් මිලියන 3,746.77 ක සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ 2025 සැප්තැම්බර් 17 වන දින M/s Indo East - Ceylex Engineering JV ආයතනය වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.



මාස 24ක් ඇතුළත නිම කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය මඟින්, ආනයනික භාණ්ඩ සහ පිරිපහදු නිෂ්පාදන හැසිරවීමට CPSTL ආයතනය සතු ධාරිතාව ඉහළ නංවන අතර, එමඟින් දින 30කට ආසන්න කාලයක් සඳහා ප්‍රමාණවත් ජාතික ඉන්ධන තොගයක් පවත්වාගෙන යාමට අවස්ථාව සැලසේ.

2025 දෙසැම්බර් 31 දින වන විට, මෙම ටැංකි 06 ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටසෙහි (Balance Work of 06 Tanks Project) සමස්ත භෞතික ප්‍රගතිය 7.5% ක් ලෙස සනිටුහන් වූ අතර, එහි ක්‍රියාත්මක කිරීමේ කටයුතු සංශෝධිත ඉදිකිරීම් කාලසටහනට සහ තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරියට යමින් පවතී.

ටැංකි ධාරිතාවයන්

ටැංකි අංකය	නිෂ්පාදන වර්ගය	ධාරිතාව (m^3)
B	ගැසොලින් 92 ඔක්ටේන්	15,000
C	ගැසොලින් 95 ඔක්ටේන්	15,000
D	ජෙට් A-1	15,000
G	ගෑස් ඔයිල් 500 ppm	7,000
H	භූමිතෙල්	7,000
J	ගෑස් ඔයිල් 10 ppm	5,000
එකතුව		**64,000**

කන්කසන්තුරේ (KKS) පැවතුණු ලංකා තොග ගබඩාව (LBD) වෙනත් ස්ථානයකට ගෙනයෑම

සමාලෝචන වර්ෂය තුළ උතුරු පළාතේ කන්කසන්තුරේ පිහිටි ලංකා තොග ගබඩාව (LBD) සාර්ථකව නව ස්ථානයකට ස්ථානගත කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වූයේ, මීට පෙර ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට (CPSTL) අයිති නැති ඉඩමක පවත්වාගෙන ගිය මෙහෙයුම් කටයුතු, ශ්‍රී ලංකා රජය සමඟ ඇති කරගත් දිගුකාලීන බදු ගිවිසුමක් යටතේ ලබාගත් ඉඩමක අලුතින් සංවර්ධනය කරන ලද ස්ථානයක් වෙත මාරු කිරීමයි.



KKS හි අලුතින් ඉදිකරන ලද පොම්පාගාරය

මීට පෙර, ඩීසල් සහ භූමිතෙල් ගබඩා කිරීම සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් භූමිය මත පිහිටි ඉන්ධන ගබඩා ටැංකි දෙකක් භාවිතා කරන ලදී. එහෙත්, එම සැකැස්ම හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය, ගබඩා ධාරිතාව වැඩිදියුණු කිරීම සහ නව තාක්ෂණික වැඩිදියුණු කිරීම් සිදු කිරීමේ හැකියාව අවහිර වුයේ හිමිකාරිත්ව හා මෙහෙයුම් පාලනයේ පැවති සීමාවන් නිසාය. තවද, මුල් භූමිය වෙනත් අරමුණක් සඳහා යොදා ගැනීමට රජය විසින් ගත් තීරණය හේතුවෙන් ගබඩාව නව ස්ථානයකට ස්ථානගත කිරීම අත්‍යවශ්‍ය විය.

නව ගබඩාව ඉදිකිරීම සඳහා CPSTL විසින් වසර 30ක බදු පදනමක් යටතේ අක්කර හයක පමණ භූමි ප්‍රමාණයක් ලබාගෙන ඇත. මෙම නව ස්ථානය මගින් යටිතල පහසුකම් සංවර්ධනය, මෙහෙයුම් කටයුතු සහ අනාගත පුළුල් කිරීම් කටයුතු පිළිබඳ පූර්ණ ස්වාධීනත්වයක් හිමි වන අතර, උතුරු ප්‍රදේශයේ වර්ධනය වන බනිජතෙල් ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය හැකියාවද සලසයි.

තවද, මෙම ප්‍රතිස්ථාපනය කිරීම සමඟ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට වාර්ෂිකව ගෙවිය යුතු බදු මුදල් ඉවත් වූ අතර, එමඟින් වසරකට රුපියල් මිලියන 15.24 ක පමණ පිරිවැය ඉතිරියක් අත්කර ගැනීමට හැකි විය.

මෙම ප්‍රතිස්ථාපනය කිරීම කන්කසන්තුරේ ධීවර වරායේ ව්‍යාප්තිය, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය සහ නව කාර්මික කලාප පිහිටුවීම ඇතුළු අනාගත කලාපීය සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය දක්වයි. තවද, හදිසි අවස්ථා හෝ ස්වාභාවික ආපදා තත්ත්වයන් තුළ උතුරු පළාත පුරා බාධාවකින් තොරව ඉන්ධන බෙදාහැරීම සහතික කිරීම මඟින් බලශක්ති සැපයුමේ ස්ථාවරභාවය තවදුරටත් ශක්තිමත් කරයි.

මෙමඟින් කලාපීය බලශක්ති ආරක්ෂාව තහවුරු කිරීම සහ තිරසාර යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා CPSTL ආයතනයේ කැපවීම තවදුරටත් ප්‍රකාශයට පත් කරයි.

අඟල් 14 ප්‍රධාන ඉන්ධන නල මාර්ගයේ සිට දකුණු ජැටිය (South Jetty) දක්වා අඟල් 8 ක විශ්කම්භයකින් යුත් නල මාර්ගයක් එලීම

කොළඹ වරායේ සියලුම බංකර් ඉන්ධන (නැව් සඳහා ඉන්ධන සැපයීමේ) මෙහෙයුම් මීට පෙර ඩොල්ෆින් ජැටියට (Dolphin Jetty) පමණක් සීමා වී තිබූ අතර, එම ජැටිය දේශීය ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා ද භාවිත කරන ලදී. මෙම ද්විත්ව භාවිතය හේතුවෙන් මෙහෙයුම් අවහිරතා ඇතිවූ අතර, බංකර් ඉන්ධන සැපයුමේ අඛණ්ඩතාවයට සහ වාණිජ මෙහෙයුම්වලටද බලපෑම් ඇති විය.

මෙම බාධාවන් අවම කිරීම සඳහා, CPSTL ආයතනය දකුණු ජැටියේ (South Jetty) සහායක යටිතල පහසුකම් ඉදිකරන ලදී. එහිදී බංකර් ඉන්ධන ලබාගන්නා නෞකාවන් සඳහා ඉහළ සල්ෆර් අඩංගු ඉන්ධන තෙල් (High Sulphur Fuel Oil - HSFO) පිරවීමේ කටයුතු පහසු කිරීම වෙනුවෙන්, දැනට පවතින අඟල් 14 තෙල් ප්‍රධාන නළ මාර්ගයෙන් වෑල්වි පීට් සිට දිගු වන ලෙස අඟල් 8 විෂ්කම්භයකින් යුත් ශාඛා නළ මාර්ගයක් ස්ථාපනය කරන ලදී.

නළ මාර්ග ස්ථාපන කටයුතු CPSTL ආයතනයේ සෘජු කාර්යමණ්ඩලය (Direct Labour Force) මඟින් සිදු කරන ලද අතර, ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, සහතික ලත් වෑල්ඩින් කටයුතු සහ සිවිල් ඉදිකිරීම් උප කොන්ත්‍රාත් පදනම මත බාහිරව සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය නඩත්තු අයවැය යටතේ රුපියල් මිලියන 14.18ක ඇස්තමේන්තුගත වියදමක් යටතේ සම්පූර්ණ කරන ලද අතර 2025 අගෝස්තු 22 වන දින සේවයට එක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මඟින් බංකර් ඉන්ධන මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු වූ අතර, පවතින යටිතල පහසුකම් උපරිම ලෙස භාවිතා කිරීමට හැකියාව ලැබිණි. ඒ අනුව ශ්‍රී ලංකාව කලාපීය සමුද්‍රීය ඉන්ධන මධ්‍යස්ථානයක් ලෙස ස්ථිරව ස්ථානගත කිරීම සඳහාද මෙමඟින් වැදගත් දායකත්වයක් ලබා දී ඇත.

දකුණු ජැටියේ සිට සේරම් ගේට්ටුව (SLPA) දක්වා අඟල් 12 ක විශ්කම්භයකින් යුත් කාබන් වානේ (Carbon Steel) නල මාර්ගයක් එලීම

කොළඹ වරාය තුළ බංකර් ඉන්ධන සැපයුම සහ ඉන්ධන හුවමාරු යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරී (SLPA) පරිශ්‍රය තුළ පිහිටි දකුණු ජැටියේ සිට සේරම් ගේට්ටුව (Seram Gate) දක්වා අඟල් 12ක විශ්කම්භයකින් යුත් කාබන් වානේ නල මාර්ගයක් එලීමේ කටයුතු CPSTL ආයතනය විසින් ආරම්භ කරන ලදී.

මෙම සංවර්ධන කටයුත්ත මඟින් ඉන්ධන හුවමාරු සම්බන්ධතාවය වැඩිදියුණු වන අතර, ඩොල්ෆින් ජැටියේ පවතින මෙහෙයුම් තදබදය අවම කරමින් බංකර් මෙහෙයුම් සහ ඉන්ධන බෙදා හැරීම සඳහා වන සැපයුම් දාමයේ (Logistical) නම්‍යශීලීභාවය ඉහළ නංවයි. එමෙන්ම, මෙය දකුණු ජැටියේ බංකර් ඉන්ධන ව්‍යාප්ති කටයුතු සඳහා මනා අතිරේක පිටුවහලක් ද සපයයි.

නාවික වෙළඳ කටයුතුවල වර්ධනයට සහය දක්වන අතරතුර, නෞකා වරාය තුළ රැඳී සිටින කාලය (Vessel Turnaround Time) අවම කිරීම, මෙහෙයුම් ආරක්ෂාව සහ ඉන්ධන හැසිරවීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් CPSTL ආයතනයේ පුළුල් වරාය යටිතල පහසුකම් උපරිම කාර්යක්ෂමතාවයට පත් කිරීමේ (Optimization) වැඩසටහනේ කොටසක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මඩකලපුව තොග ගබඩාවේ 05 වන ටැංකියේ ප්‍රතිසංස්කරණ කටයුතු

මඩකලපුව ලංකා තොග ගබඩාවේ (LBD Batticaloa) පිහිටි 05වන ටැංකිය, බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ඉදිකරන ලද, ඝන මීටර 175 ක ධාරිතාවයකින් (විශ්කම්භය: මීටර 4.6; උස: මීටර 10.5) යුත්, සිරස් අතට සවි කරන ලද ස්ථාවර වහලක් සහිත වෑල්ඩින් කරන ලද ටැංකියකි. මෙය එම ඩිපෝවේ පවතින

විශාලතම ගෑස් ඔයිල් (Gas Oil/ඩීසල්) ගබඩා ටැංකිය ද වේ.

ටැංකියේ පතුල සම්පූර්ණයෙන්ම ප්‍රතිස්ථාපනය කිරීම, වට ප්‍රමාණයේ (Shell Course) පහළම මිලිමීටර 300ක කොටස අලුත් කිරීම සහ සම්පූර්ණ වශයෙන් නැවත සායම් ආලේප කිරීම ඇතුළු මහා පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු මෙහිදී අත්‍යවශ්‍ය අවශ්‍යතාවන් ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අනුව, මෙම කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 10.82 ක අයවැයක් යටතේ 2024 නොවැම්බර් 29 වන දින ලාෆ්ස් ඉංජිනේරු (පුද්ගලික) සමාගම (M/s Laughs Engineering Pvt) වෙත පවරන ලදී.

දින 120 ක කාලසීමාවක් තුළ නිම කරන ලද මෙම ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් ටැංකියේ මෙහෙයුම් කාලය තවත් වසර 15කින් පමණ දීර්ඝ වූ අතර, අනපේක්ෂිත බිඳවැටීම් කාලසීමාවන් (Downtime) අවම කරමින් විශ්වාසදායක ඉන්ධන මෙහෙයුම් සහතික කිරීමට ද හැකි විය. මෙම ආයෝජනය වසර පහක් ඇතුළත නැවත උපයා ගැනීමට අපේක්ෂා කරන අතර, එහි ඇස්තමේන්තුගත අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR) 34.32% කි.

කොලොන්නාව - තොරතුරු පද්ධති කාර්යංශය නවීකරණය කිරීම

1991 වර්ෂයේ ඉදිකරන ලද නව ගොඩනැගිල්ලේ පිහිටි කොලොන්නාව තොරතුරු පද්ධති කාර්යංශය, අකාර්යක්ෂම ඉඩ භාවිතය, පැරණි යටිතල පහසුකම්, අබලන් විදුලි වයරින් පද්ධතිය සහ ප්‍රමාණවත් නොවන HVAC (වායුසම්පාදන හා වායුසීතලකරණ) පද්ධති හේතුවෙන් ප්‍රතිසංස්කරණය අවශ්‍යව තිබුණි.

ICT පුළුල් වීම සහ SAP ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ සේවක සංඛ්‍යාව වැඩිවීම නිසා කාර්යාල අවකාශය තදබදයට ලක්වූ අතර කාර්යක්ෂමතාවය අඩුවී තිබුණි.

මෙම තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් CPSTL ආයතනය විසින් Ergonomic නිර්මාණ සැලැස්මක් යටතේ පුළුල් කාර්යාල ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙයට විදුලි පද්ධති වැඩිදියුණු කිරීම, වායුසම්පාදන සහ වායුසීතලකරණ පද්ධති වැඩිදියුණු කිරීම, නවීන උපකරණ සවිකිරීම, කණ්ඩායම්කරණය කරන ලද වැඩ ස්ථාන (Clustered Workstations), ගෘහ භාණ්ඩ සහ විධිමත් තොරතුරු තාක්ෂණ රැහැන් පද්ධති ඇතුළත් විය.

මෙම ව්‍යාපෘතිය 2024 අගෝස්තු 26 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව රුපියල් මිලියන 37.56 ක අයවැයක් සහ දින 180 ක කාලසීමාවක් සඳහා ඩයස් බිල්ඩර්ස් (M/s Dias Builders) වෙත පිරිනමන ලද අතර 2024 අගෝස්තු 26 වන දින වැඩබිම ඔවුන් වෙත භාර දෙන ලදී. මෙම කොන්ත්‍රාත්තුව, මෙම ව්‍යාපෘතිය 2025 අප්‍රේල් 08 වන දින සාර්ථකව නිම කරන ලද අතර, එමඟින් වඩාත් ආරක්ෂිත මෙන්ම කාර්යක්ෂම ඩිජිටල් සේවා පරිසරයක් නිර්මාණය විය.

කොලොන්නාව නිමාව - ටැංකි අංක 21 අලුත්වැඩියා කිරීම

ටැංකි අංක 21 යනු 1998 වර්ෂයේ ඉදිකරන ලද, අභ්‍යන්තර පාවෙන වහලක් සහිත ස්ථාවර වහලකින් යුත් පෑස්සුම් කරන ලද ටැංකියකි. එහි ධාරිතාව 21,324m^3 වන අතර (විෂ්කම්භය: 41.04m, උස:17.06m) මෙය ගැසොලින් ගබඩා කිරීම සහ මුහුදු ජලයෙන් සේදීම (Seawater Flushing) සඳහා භාවිතා වේ.

2022 ජනවාරි මාසයේ සිදු කළ පරීක්ෂණ මඟින් පතුල් අලුත්වැඩියාව, වෑල්ඩ් ප්‍රතිස්ථාපනය සහ නැවත පින්තාරු කිරීම අවශ්‍ය බව හඳුනාගන්නා ලදී. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව CPSTL ආයතනය විසින් M/s UK Engineering Services Pvt වෙත රුපියල් මිලියන 41.54ක අයවැයක් යටතේ ගිවිසුම ප්‍රදානය කරන ලදී.

මෙම අලුත්වැඩියා කටයුතු 2024 නොවැම්බර් 01 වන දින ආරම්භ කර 2025 ජූලි 16 වන දින සාර්ථකව නිම කරන ලදී. එමඟින් ටැංකියේ සේවා ආයු කාලය වසර 10 කින් පමණ දීර්ඝ කරමින්, ව්‍යුහාත්මක ශක්තිමත්භාවය සහ මෙහෙයුම් විශ්වාසනීයතාවය තහවුරු කර ඇත.

මුතුරාජවෙල පර්යන්තයේ සූර්ය බලශක්ති (Solar PV) පද්ධතිය ඒකාබද්ධ කිරීම

2023 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් බලශක්ති පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේදී මුතුරාජවෙල පර්යන්තයේ සාමාන්‍ය මාසික විදුලි පරිභෝජනය කිලෝවොට් පැය (kWh) 103,792ක් වූ අතර, ඒ සඳහා වැය වූ පිරිවැය රුපියල් මිලියන 2.9ක් විය. කෙසේ වුවද, 2023 ඔක්තෝබර් මාසයේ සිදු වූ ගාස්තු සංශෝධනයෙන් පසුව, මාසික පිරිවැය රුපියල් මිලියන 6.5 ක් දක්වා දළ වශයෙන් ඉහළ ගිය අතර, එය 124%ක දැවැන්ත වැඩිවීමකි.

මෙලෙස ඉහළ යන බලශක්ති වියදම් අවම කර ගැනීම සඳහා, කාබන් විමෝචනය අඩු කරන අතරතුර පර්යන්තයේ විදුලි ඉල්ලුමෙන් කොටසක් සපයා ගැනීමට හැකි වන පරිදි, 'නෙට් මීටරින්' (Net Metering) ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන සූර්ය බලශක්ති උත්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීමට CPSTL ආයතනය පියවර ගන්නා ලදී

ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) මාර්ගෝපදේශවලට අනුව සූර්ය බලශක්ති පද්ධති ධාරිතාව ගිවිසුම්ගත උපරිම විදුලි ඉල්ලුමෙන් (Contracted Demand) 80% කට සීමා කර තිබුණ ද, වහලයේ පවතින ඉඩකඩ සීමිත වීම හේතුවෙන් එම උපරිම ධාරිතාව සම්පූර්ණයෙන්ම භාවිත කිරීමට නොහැකි විය.


ඒ අනුව, රුපියල් මිලියන 35.0 ක සහ ඇමරිකානු ඩොලර් 94,000ක ආයෝජනයක් සහිතව කිලෝවොට් (kWp) 270ක ධාරිතාවයකින් යුත් සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කරන ලදී. මෙම පර්යන්තය වෙත විදුලිය සැපයෙන්නේ 1,600 kVA ධාරිතාවයකින් යුත් ට්‍රාන්ස්ෆෝමරයක් (පරිණාමකයක්) මඟිනි.

අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පී.එල්.සී. (M/s Abans Electricals PLC) සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද මෙහි ඉදිකිරීම් කටයුතු 2024 නොවැම්බර් 05 වන දින ආරම්භ කර 2025 මාර්තු 12 වන දින නිම කරන ලදී. මෙමඟින් ආයතනයේ බලශක්ති පිරිවැය අඩු කර ගැනීමට සහ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට විශාල දායකත්වයක් ලැබුණි.

මානව ප්‍රාග්ධනය

අපේ මිනිසුන්: CPSTL හි හදවත

අපගේ සාර්ථකත්වයේ මූලික ශක්තිය වන්නේ ඉංජිනේරුවන්, මෙහෙයුම් නිලධාරීන්, පාරිසරික විශේෂඥයින් සහ පාරිභෝගික සේවා විශේෂඥයින් ඇතුළු වෘත්තිකයන් 2,000කට අධික සංඛ්‍යාවකින් සමන්විත විවිධත්වයෙන් යුතු අපගේ සේවක මණ්ඩලයයි.



අපගේ ආයතනික වගකීම

සාර්ථක සමාගමක් වීම යනු වඩාත් පුළුල් සමාජ යහපත උදෙසා දායක වීම බව අප විශ්වාස කරමු. CPSTL ආයතනය ප්‍රජා සංවර්ධනය, පාරිසරික සංරක්ෂණය සහ තිරසාර ව්‍යාපාරික භාවිතයන් සම්බන්ධයෙන් සක්‍රීය භූමිකාවක් ඉටු කරයි. අපගේ සියලුම මෙහෙයුම් කටයුතුවලදී ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගනිමින්, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රගතියට සහයෝගය දැක්වීමට අප කැපවී සිටිමු.

ප්‍රතිලාභ, ත්‍යාග සහ ඇගයීම්


CPSTL හි පාරිශ්‍රමික ව්‍යුහයන් විනිවිදභාවයකින් යුතුව සකස් කර ඇත. එය ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, ව්‍යාපාරය පුරා ඒකාකාරී ප්‍රමිතීන් පවත්වා ගනිමින් ශ්‍රේණිවලට සාපේක්ෂව සාධාරණව සහ සාධාරණ ලෙස සංසන්දනය (Benchmark) කර ඇත. සියලුම සේවකයින් නිර්වචනය කරන ලද කුසලතා රාමුවක් මත පදනම්ව, වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලට භාජනය වේ.

CPSTL හි ස්ථිර සේවා නියුක්තිකයන් වෙත සපයනු ලබන ප්‍රතිලාභ පහත පරිදි වේ:

සේවක ප්‍රතිලාභ	විස්තරය
වාර්ෂික නිවාඩු	දින 14 ක්
පෞද්ගලික (හදිසි) නිවාඩු	වැඩ කරන දින 7 ක්
වෛද්‍ය නිවාඩු	වැඩ කරන දින 21 ක්
ප්‍රසූති නිවාඩු	වැඩ කරන දින 84 ක්
	දින 84 ක් සඳහා අර්ධ වැටුප් නිවාඩු
	දින 84 ක් සඳහා වැටුප් රහිත නිවාඩු
අනතුරු නිවාඩු	රාජකාරියේ නිරතව සිටියදී සේවකයා අනතුරකට ලක්වීම වෙනුවෙන්
හිලව් නිවාඩු (Lieu leave)	මාසයේ සෙනසුරාදා දින 4 ක් වැඩ කරන සේවකයෙකුට දින 2 ක නිවාඩු සහ අතිකාල දීමනා (Overtime) ලබා ගත හැක
විශේෂ නිවාඩු	විශේෂ අවස්ථාවන්හිදී (මැතිවරණ, ඇඳිරි නීතිය ආදී කාලවලදී)
රාජකාරි නිවාඩු	නිල රාජකාරි සඳහා වන විශේෂ අවස්ථාවලදී
වැටුප් රහිත නිවාඩු	විදේශීය අධ්‍යයන, පුහුණු සැසි, වැඩමුළු ආදිය සඳහා
වැටුප් වර්ධක	සේවකයාගේ රාජකාරි ඉටුකිරීම්, පැමිණීම සහ හැසිරීම ඇගයීම මත පදනම් වේ
දීමනා	ආහාර දීමනා, ප්‍රවාහන දීමනා, සේවා අවසාන දීමනා, පැමිණීමේ දිරිගැන්වීමේ දීමනා, මුර (Shift) දීමනා, වාර්ෂික නිවාඩු දිරිගැන්වීමේ දීමනා, ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා, සති අන්ත දීමනා, නිල දුරකථන පහසුකම් ආදිය
ප්‍රසාද දීමනා	වෛද්‍ය ප්‍රසාද දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා
ණය - ආපදා ණය	මාස 10ක වැටුප, සරල සහන පොලී අනුපාතයක් යටතේ, මාස 60 කින් අයකර ගත හැක
ණය - නිවාස ණය	ඉඩම් හෝ නිවාස මිලදී ගැනීමට හෝ නිවාස ඉදිකිරීමට. සරල සහන පොලී අනුපාතයක් යටතේ, මාස 300කින් හෝ සේවකයාගේ ඉතිරි සේවා කාලයෙන් අඩු කාලසීමාව තුළ අයකර ගත හැක
ණය - නිවාස අලුත්වැඩියා ණය	නිවාස අලුත්වැඩියා කිරීම සඳහා, සරල සහන පොලී අනුපාතයක් යටතේ, මාසික වාරික 120 කින් අයකර ගත හැක
ණය - ගෘහ, නිවාස පහසුකම් ණය	ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා. සරල සහන පොලී අනුපාතයක් යටතේ, මාසික වාරික 60 කින් අයකර ගත හැක

සේවක ප්‍රතිලාභ	විස්තරය
ණය - සකසුරුවම් සමිති ණය	මාස 03 ක වැටුප, සරල සහන පොලී අනුපාතයන් යටතේ, මාසික වාරික 60 කින් අයකර ගත හැක.
ණය - මෝටර් රථ ණය	විධායක නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ. සරල සහන පොලී අනුපාතයක් යටතේ, මාසික වාරික 60 කින් අයකර ගත හැක.
ණය - මෝටර් සයිකල් සහ ත්‍රිරෝද රථ ණය	සරල සහන පොලී අනුපාතයක් යටතේ මාසික වාරික 60 කින් අයකර ගත හැක.
අත්තිකාරම් - උත්සව අත්තිකාරම්	පොලී රහිතයි. මාස 10 කින් අයකර ගත හැක.
අත්තිකාරම් - අලුත් අවුරුදු අත්තිකාරම්	සහන පොලී අනුපාතයක් යටතේ, මාස 10 කින් අයකර ගත හැක.
අත්තිකාරම් - පාසල් පොත් අත්තිකාරම්	පොලී රහිතයි. මාස 10 කින් අයකර ගත හැක.
ඇගයීම් සම්මාන පිරිනැමීම	සේවකයින්ගේ සේවා කාලය මත පදනම් වේ.
සුභසාධන ප්‍රතිලාභ	සෑම සේවකයෙකුටම තම පවුලේ අය සමඟ ඕනෑම CPSTL / CPC නිවාඩු නිකේතනයක (Circuit Bungalow) දින 3 ක් / රාත්‍රී 2 ක් නැවතී සිටීමට අයිතිය ඇත; CPSTL ක්‍රීඩා සමාජ ඉසව්වලට සහභාගී වීම; වාර්ෂික විනෝද චාරිකාව; ලේ දීමේ කඳවුර; CPSTL පරිශ්‍රයේ ඇති සමුපකාර වෙළඳසැල; CPSTL පරිශ්‍රය තුළ ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලැබේ.
වෛද්‍ය ප්‍රතිලාභ	CPSTL ආයතනය තුළ සිටින වෛද්‍ය නිලධාරී පහසුකම්, නොමිලේ ඖෂධ ලබාදීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය (Reimbursement); රෝහල්ගතවීම් සඳහා වෛද්‍ය රක්ෂණය; රසායනාගාර පරීක්ෂණ (Lab Tests) වියදම් ප්‍රතිපූරණය; විශේෂ පරීක්ෂණ (CT Scan, MRI ආදිය) වියදම් ප්‍රතිපූරණය
මරණාධාර ප්‍රතිලාභ	මරණ වන්දි මුදල්
සකසුරුවම් සමිති ප්‍රතිලාභ	සේවකයින්ගේ සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින්ගේ මරණයකදී ලබාදෙන මරණාධාර; ව්‍යවස්ථාපිත පාරිතෝෂිකයට (Statutory Gratuity) සමානව පාරිතෝෂික දීමනා පිරිනැමීම.
විශ්‍රාම ප්‍රතිපාදන	ව්‍යවස්ථාපිත පාරිතෝෂික දීමනාව (Statutory Gratuity)
වෙනත් පහසුකම්	විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම් සැපයීම, රාත්‍රී මුර සේවයේ යෙදෙන සේවකයින් සඳහා ආහාර සැපයීම.

CPSTL ආයතනය, සේවකයින්ගේ දරුවන්ට උසස් අධ්‍යාපනය සඳහා දිරිගැන්වීමක් ලෙස උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනමයි. මෙම වසර තුළදී විවිධ ක්ෂේත්‍රයන්හි උපාධි හදාරන දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 81 ක් පිරිනමා ඇත.



සේවකයින්ගේ දරුවන් වෙනුවෙන් පිරිනමන ලද ශිෂ්‍යත්ව - 2025

සමාගම තුළ නිශ්චිත සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් ඇගයීමට ලක් කිරීම (උපහාර පිදීම) සමාගම විසින් වාර්ෂිකව සිදු කරනු ලබයි.

සම්පූර්ණ කරන ලද සේවා කාලය	සේවකයින් සංඛ්‍යාව
වසර 20	31
වසර 30	7
වසර 35	15
වසර 40	1

පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය

තම මානව ප්‍රාග්ධන සංවර්ධන ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, CPSTL ආයතනය සේවක නිපුණතා නැංවීම, කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ සමස්ත ආයතනික වර්ධනයට සහාය වීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

පුහුණු වැඩසටහන	කාලසීමාව	සහභාගී වූ සංඛ්‍යාව	පැය ගණන
ප්‍රථමාධාර (First Aid)	14	10	140
මෝටර් රථ අංශය සඳහා පරිගණක පුහුණු වැඩසටහන	7	13	91
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024 (Procurement Guideline 2024)	7	52	364
ඵලදායී ලෙස වාර්තා තබා ගැනීම (Effective Record Keeping)	7	60	420
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2 වන කණ්ඩායම	7	35	245
“AAPS /4HANA පද්ධති උත්ශ්‍රේණි කිරීමේ ව්‍යාපෘතිය” පිළිබඳ, හඳුන්වාදීමේ සැසිය	7	21	147
අරමුණු සැකසීම සහ ඒවා අනුගත කිරීම	7	50	350
කාර්මික නීතිය සඳහා වන සමාජ ආරක්ෂණය	7	36	252
නිල ලිපි ලිවීම	7	35	245
MS Excel පුහුණුව	14	42	588
ඉදිරිපත් කිරීමේ කුසලතා	7	64	448
අරමුණු සැකසීම සහ ඒවා අනුගත කිරීම	7	56	392
Excel පුහුණු වැඩසටහන	14	38	532
AI මෙවලම් සමඟ වඩාත් කාර්යක්ෂමව වැඩ කිරීම	7	19	133
AI මෙවලම් සමඟ වඩාත් කාර්යක්ෂමව වැඩ කිරීම II	7	48	336
Microsoft Excel	14	33	462
ISO 9001: 2015 ගුණාත්මක කළමනාකරණ පද්ධතිය සඳහා අභ්‍යන්තර විගණනය	14	30	420
විඛාදන පාලනය හා නඩත්තුව	7	40	280
රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීමේ සහ විසඳීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම	7	22	154
ආරක්ෂිත රිය පැදවීම සහ වාහන නඩත්තුව	7	48	336
අරමුණු සැකසීම සහ ඒවා අනුගත කිරීම	7	70	490
විඛාදන පාලනය හා නඩත්තුව	7	43	301
ISO 9001:2015 ප්‍රමිතිය සහ ගුණාත්මක කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	14	10	140
ISO 19011:2018 ප්‍රමිතීන්ට අනුව අභ්‍යන්තර විගණනය	7	29	203
තොග චලන හා තොග නිෂ්පාදන අංශවලට අනුයුක්ත, අලුතින් උසස්වීම් ලැබූ ෆෝමන්වරුන් (Foreman) සඳහා වන අභ්‍යන්තර පුහුණුව මුළු පුහුණු පැය ගණන	14	6	84
මුළු පුහුණු පැය ගණන			**7,553**

අද දින සීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරය තුළ, වෙනස්කම්වලට අනුගත වීමේ හැකියාව (Adaptability) සහ අඛණ්ඩ සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා අඛණ්ඩ ඉගෙනීම අත්‍යවශ්‍ය වේ.ආයතනයේ දැක්ම සාක්ෂාත් කර කරගැනීම සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සඳහා තම සේවක මණ්ඩලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන බව CPSTL ආයතනය පිළිගනී. ඒ අනුව, උපායමාර්ගික ප්‍රමුඛතාවන් ක්‍රියාත්මක කිරීම සහ වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තරඟකාරී දක්ෂතාවලින් යුත් සේවකයින් සංවර්ධනය කිරීම සහ ඔවුන් ආයතනය තුළ රඳවා තබා ගැනීම ප්‍රධාන සාධකයක් ලෙස පවතී.

අපගේ පුහුණු හා මානව සම්පත් සංවර්ධන අංශය, සේවකයින්ගේ වෘත්තීය සහ පෞද්ගලික සංවර්ධනය අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීමට කැපවී සිටී. මේ යටතේ, පුහුණු අවශ්‍යතා ක්‍රමවත් ලෙස හඳුනාගැනීම, කුසලතා පරතරයන් පියවීම සහ අඛණ්ඩ ඉගෙනීම හා සංවර්ධනය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගීම සිදු කරයි.

කාර්ය සාධන ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් (Performance Feedback) සහ ව්‍යුහාත්මක දක්ෂතා සාකච්ඡා (Talent Discussions) මඟින් පුහුණු අවශ්‍යතා ඇගයීමට ලක් කෙරේ. ආයතනික අභ්‍යන්තර පුහුණු වැඩසටහන් මෙන්ම පිළිගත් වෘත්තීය ආයතන සහ පුහුණු සංවිධාන මඟින් පවත්වනු ලබන බාහිර වැඩසටහන් සඳහාද ක්‍රියාකාරිව සහභාගී වීමට සේවකයින් දිරිමත් කරනු ලැබේ.

මෙම වසර තුළදී, සේවකයින්ගේ තාක්ෂණික විශේෂඥතාව ශක්තිමත් කිරීම, මෘදු කුසලතා (Soft Skills) නැංවීම සහ නායකත්ව නිපුණතා ගොඩනැගීම අරමුණු කරගත් ඉලක්කගත පුහුණු වැඩසටහන් මාලාවක් CPSTL විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම සාමූහික උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස, සේවක සංවර්ධනය වෙනුවෙන් සමස්තයක් ලෙස පුහුණු පැය 7,553 ක ආයෝජනයක් සිදු කිරීමට හැකි විය.

සමාගම සැමවිටම සේවකයින්ගේ වෘත්තීය දියුණුව කෙරෙහි උනන්දුවක් දක්වන අතර, පිළිගත් වෘත්තීය ආයතන සමඟ සම්බන්ධ වීමට කැමති සේවකයින්ට ඒ සඳහා සහාය ලබා දෙයි. එමෙන්ම ඔවුන් වෘත්තීය සංවර්ධනය සඳහා දිරිමත් කරන අතර, MBA සහ අනෙකුත් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ද සපයයි. මීට අමතරව, වෘත්තීය ආයතනවල වාර්ෂික සාමාජික ගාස්තු ප්‍රතිපූරණය (Reimburse) කිරීමට සමාගම කටයුතු කරන අතර, එම ආයතන මඟින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වන ගාස්තු ප්‍රතිපූරණය කරමින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ප්‍රවර්ධනය කරයි.

වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව





සෑම සේවකයෙකුටම සුරක්ෂිත සහ අනතුරු වලින් තොර සේවා පරිසරයක් සහතික කරමින්, සියලුම මෙහෙයුම් කටයුතුවලදී ඉහළම සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා CPSTL ආයතනය සිය නොසැලෙන කැපවීම දිගටම පවත්වාගෙන යයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තෙල් පර්යන්ත මෙහෙයුම්කරු ලෙස, අධික ලෙස ගිනිගන්නාසුළු නිෂ්පාදන කළමනාකරණය කිරීමේ වගකීම සමාගම වෙත පැවරී ඇති අතර, එය සහජයෙන්ම ඉහළ අවදානමක් සහිත කාර්යයකි. ජාතික බලශක්ති සැපයුම් දාමය තුළ අප සතු ප්‍රමුඛ කාර්යභාරය සැලකිල්ලට ගත් කල, කිසියම් විශාල ගිනි අනතුරක් සිදුවුවහොත් එය රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් වල්ල කළ හැකිය. ඒ අනුව, කාර්මික සහ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව අපගේ මෙහෙයුම් ව්‍යුහය තුළ ප්‍රධානතම ප්‍රමුඛතාවයක් ලෙස අන්තර්ගත කර ඇත.

මිනිස් ජීවිත සහ දේපළ යන දෙකම ආරක්ෂා කිරීම සඳහා CPSTL ආයතනය පැය 24 පුරා ක්‍රියාත්මක වන පහත සඳහන් විශේෂිත සම්පත් පවත්වාගෙන යනු ලබයි:

- **ගිනි නිවීම් සහ ආරක්ෂක අංශය** - සියලුම මෙහෙයුම් කටයුතු ආරක්ෂිතව සිදු කිරීම සහතික කිරීම සඳහා ඕනෑම මොහොතක කඩිනමින් යෙදවීමට සූදානම්ව ඇති, දවසේ පැය 24 පුරාම සහ සතියේ දින 7 පුරාම ක්‍රියාත්මක වන, පූර්ණ පහසුකම් සහිත ආයතනික ගිනි නිවන බලකායක් මෙයට ඇතුළත් වේ.
- **රසායනාගාර ඒකකය** - පැය 24 පුරා ක්‍රියාත්මක වන ආයතනික ගිලන්රථ සේවාවක සහාය ඇතිව, සේවකයින් සඳහා අඛණ්ඩ සෞඛ්‍ය නිරීක්ෂණ සහ හදිසි වෛද්‍ය ප්‍රතිචාර සපයන පූර්ණ ක්‍රියාකාරී පහසුකමකි.
- **පර්යේෂණාගාර අංශය** - සියලුම තෙල් නිෂ්පාදනවල ඉහළම ගුණාත්මකභාවය සහ ආරක්ෂණ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා නවීනතම පහසුකම් සහිත ආයතනික පර්යේෂණාගාරයක් අඛණ්ඩව ක්‍රියාත්මක වේ. උසස් තත්ත්වයේ පරීක්ෂණ පහසුකම් සහ නිපුන වෘත්තිකයන්ගෙන් සමන්විත මෙම අංශය මඟින් නිෂ්පාදනවල සහතික කිරීම් සහ ඒවායේ නිවැරදි ප්‍රමිතිය සුරක්ෂිත කරනු ලබයි. මෙමඟින් වෙළඳපොළට නිකුත් කිරීමට පෙර සෑම නිෂ්පාදන කාණ්ඩයක්ම දැඩි ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කරන අතර, මෙහෙයුම් විශ්වාසනීයත්වය මෙන්ම පාරිභෝගික විශ්වාසයද ආරක්ෂා කරයි.





සෑම ක්‍රියාකාරකමකදීම සිදුවිය හැකි මෙහෙයුම් අවදානම් තුරන් කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, සමාගම සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දෙයි. ඒ යටතේ අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රයන් මෙසේය:

- මෙහෙයුම් ආරක්ෂාව සහ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සේවා පද්ධති සැපයීම සහ නඩත්තු කිරීම.
- ශක්තිමත් ආරක්ෂණ ක්‍රමවේද සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් (Best Practices) හරහා ඉන්ධන ආරක්ෂිතව පරිහරණය කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම.
- සේවකයින්ට තමන්ගේ රාජකාරි ආරක්ෂිතව ඉටු කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුවත්භාවය ලබා දීම අරමුණු කරගනිමින් අදාළ තොරතුරු, පුහුණුව සහ අධීක්ෂණය සැපයීම.
- සේවකයින්ගේ යහපැවැත්ම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ත සේවා ස්ථාන තත්ත්වයන් පවත්වාගෙන යාම.
- ක්‍රමවත් ලෙස අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම මඟින් සෞඛ්‍ය හා ආරක්ෂක උවදුරු කල්තියා වළක්වා ගැනීම.



බෞද්ධ ධර්ම දේශනා

CPSTL බෞද්ධ සංගමය විසින් බෞද්ධ දින දර්ශනයේ ප්‍රධාන පෝය දින තුන වන වෙසක්, පොසොන් සහ ඇසළ යන දිනයන්හිදී කාර්යාල පරිශ්‍රය තුළ විශේෂ ආගමික වත්පිළිවෙත් සංවිධානය කරනු ලබයි. එමඟින් සේවකයින් අතර ආත්මීය පරීක්ෂාව, ආධ්‍යාත්මික වර්ධනය සහ සාමූහික සමඟිය සඳහා අර්ථවත් අවස්ථා සලසා දෙයි.

සිහිනුවණ, කරුණාව සහ සදාචාරාත්මක ජීවන රටාව වැනි වටිනාකම් ප්‍රවර්ධනය කරන මෙම වැඩසටහන් සඳහා සහභාගී වන ලෙස සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට උණුසුම්ව ඇරයුම් කරනු ලැබේ. මෙම මුලපිරීම්, සේවකයින්ගේ සමස්ත යහපැවැත්ම උදෙසා CPSTL හි ඇති පුළුල් කැපවීමේ කොටසක් වන අතර, එමඟින් අභ්‍යන්තර ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, සේවා ස්ථානයේ සබඳතා වර්ධනය කිරීම සහ සමතුලිත මෙන්ම ගෞරවනීය ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම සිදු කෙරේ.

මෙවැනි ආධ්‍යාත්මික වශයෙන් පොහොසත් මැදිහත්වීම් තුළින්, CPSTL තම සේවක මණ්ඩලයේ චිත්තවේගීය හා සදාචාරාත්මක යහපැවැත්ම අඛණ්ඩව සුරක්ෂිත කරන අතර, උද්‍යෝගිමත්, හික්මුණු සහ අරමුණක් සහිත කණ්ඩායමක් ගොඩනැගීමේදී එහි ඇති වැදගත්කම අගය කොට සලකයි.









නත්තල් සැමරුම

2025 නත්තල් උත්සවය වෙනුවෙන්, CPSTL කතෝලික සංගමය විසින් ආයතනය තුළ එකමුතුකම සහ ප්‍රීතිය සංකේතවත් කරමින් අලංකාර ලෙස සැරසූ නත්තල් ගසක් සහ ගව ලෙනක් ඇතුළත් උත්සව වැඩසටහනක් සංවිධානය කරන ලදී. සේවකයින්ගේ සහ විශ්‍රාමික සාමාජිකයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන්, ගරු ප්‍රියන්ත සිල්වා පියතුමාගේ මඟපෙන්වීම යටතේ කොලොන්නාව සාන්ත ජෝසප් දේවස්ථානයේදී විශේෂ දිව්‍ය පූජාවක් පවත්වන ලදී. සහෝදරත්වයේ සහ භක්තිවන්තකමේ හැඟීම මැනවින් පිළිඹිබු කළ මෙම උත්සවය, මුළු මහත් දේශයටම සාමය, සතුට සහ ආශීර්වාදය ප්‍රාර්ථනා කරමින් සිදුකළ යාච්ඤාවන්ගෙන් නිමාවට පත්විය.










ආයතනික පාලනය




TK-37
TK-31
TK-31

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය

CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලන මූලධර්ම අනුගමනය කිරීමට දැඩි ලෙස කැපවී සිටින බවත්, ආයතනික පාලන භාවිතයන් පිළිබඳ ආයතනික පාලන වාර්තාව සාධාරණ හා නිවැරදි විස්තරයක් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටිමි.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම කාර්ය මණ්ඩලය අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ අනුගතව ක්‍රියාකර ඇති බව මම ප්‍රකාශ කරමි.

ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා
සභාපති

CPSTL හි ආයතනික පාලනය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වයේ වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කරන ශක්තිමත් සහ ඵලදායී ආයතනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යුහගත කර ඇත. එය සියලු ගනුදෙනු වලදී සාධාරණත්වය සහතික කරන අතර සංවිධානය කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැගීමට දායක වේ. ආයතනික පාලනයේ මූලික අරමුණ වන්නේ සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන ඵලදායී, ව්‍යවසායක සහ විචක්ෂණශීලී කළමනාකරණය සක්‍රීය කිරීමයි.

- දැක්ම, මෙහෙවර, අරමුණු සහ උපාය මාර්ග සැලසුම් කර සන්නිවේදනය කරන ආකාරය,
- වටිනාකම් සමඟ මනාව අනුකූලවන ආකාරය,
- අවදානම් කළමනාකරණය කරන ආකාරය,
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය,
- තිරසාරව මෙහෙයුම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- අනාගත නායකයින් දිරිමත් සහ සංවර්ධනය කරන ආකාරය,
- ආයතනයට ඇල්මැති පාර්ශවකරුවන්ගේ වටිනාකම් ඉහළ නැංවීම සඳහා ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය


ශ්‍රී ලංකාව තුල බනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ ප්‍රධාන පහසුකම් සපයන්නා ලෙස, රටේ නියාමන ආයතන විසින් සකස් කරන ලද නීති, රෙගුලාසි සහ සංග්‍රහවලට අනුගතව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර, එය සමාගම විසින් සකසන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට ද අනුකූල වේ.

ආයතනික පාලන ව්‍යුහය

CPSTL පාලන ව්‍යුහය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය, එහි අනු කමිටු, ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය, කොටස් හිමියන්, නියාමකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර මූලික සබඳතා මෙහෙයවනු ලැබේ.

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ආයතනික පාලන ව්‍යුහය පහත ප්‍රධාන කරුණු තුන මත රඳා පවතී.

1. අනුකූලතාව
2. අභ්‍යන්තර පාලන ව්‍යුහය
3. සහතික වීම සහ පාලනය



AMC - විගණන සහ කළමනාකරණ කමිටුව
SRC - තොග සමාලෝචන කමිටුව
DPC - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

01. අනුකූලතාව

සමාගමේ ආයතනික පාලන භාවිතයන් පහත සඳහන් නීති, ප්‍රඥාප්ති සහ ස්වේච්ඡා භාවිතයන්ට අනුකූල වේ.

- 2023 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය.
- 2021 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ.
- 2007 අංක 7 දරණ සමාගම් පනත.
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත, එහි සංශෝධන සහ අනෙකුත් ප්‍රඥාප්ති.
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති.
- සමාගම් රෙගුලාසි.
- ව්‍යාපාර චර්යා සංග්‍රහය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ කළමනාකරණ කමිටුවල නිදර්ශන නියමයන්.

02. අභ්‍යන්තර පාලන ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් හරහා සමාගමේ සියලුම ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. පාලනයේ අරමුණ වන්නේ ඵලදායී සහ විචක්ෂණශීලී කළමනාකරණය තුළින් දිගුකාලීන තිරසාර කොටස්හිමියන්ගේ වටිනාකමක් නිර්මාණය කිරීමයි.

අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ:

- ආයතනයේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් උපාය මාර්ග සැකසීම සහ මග පෙන්වීම.
- උපාය මාර්ගික මාර්ගෝපදේශ සැපයීම සහ ආයතනික උපාය මාර්ග සහ සමාගමේ කාර්ය සාධන අරමුණු ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරීම.
- වාර්ෂික සැලසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම.
- යහපාලන පද්ධති සහ ඊට අනුකූලවීම අධීක්ෂණය කිරීම.
- මූල්‍ය සහ අනෙකුත් වාර්තාකරණ භාවිතයන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ප්‍රධාන අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- විධායක මට්ටම් දක්වා පවරන ලද අභිමතයන්/අධිකාරියන් සඳහා වෙනස්කම් තීරණය කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය

2025 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පහත පරිදි විය.

1. ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා - සභාපති
2. ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා - කළමනාකාර අධ්‍යක්ෂ
3. ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා - විධායක අධ්‍යක්ෂ
4. දීපක් දාස් මහතා - අධ්‍යක්ෂ
5. අවිනාශ් සිංහාල් මහතා - අධ්‍යක්ෂ
6. සුනිල් කේ මහාරණ මහතා - අධ්‍යක්ෂ
7. එච්.ටී.පී. චන්දන මහතා - අධ්‍යක්ෂ
8. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ

2025 වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වෙනස්වීම්

	අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ දිනය	අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වූ දිනය	තනතුර
1	ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා	26.09.2024		සභාපති
2	ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා	26.09.2024		MD
3	ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා	26.09.2024		ED
4	දීපක් දාස් මහතා	14.04.2023		NED
5	අවිනාශ් සිංහාල් මහතා	22.08.2024		NED
6	සුනිල් කේ. මහාරණ මහතා	22.08.2024		NED
7	එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා	03.10.2024	21.07.2025	NED
8	එස්. හේමන්ත විජිත කුමාර මහතා	09.10.2024	30.06.2025	NED
9	ඒ.ජේ.එල්. විමලරත්න මහතා	26.09.2024	23.01.2025	NED
10	එච්.ටී.පී. චන්දන මහතා	27.02.2025		NED
11	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා	30.06.2025		NED
NED විධායක නොවන අධ්‍යක්ෂ **MD** කළමනාකාර අධ්‍යක්ෂ **ED** විධායක අධ්‍යක්ෂ				

වාර්ෂික වාර්තාවේ පිටු 20 සිට 24 දක්වා වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පළපුරුද්ද, උපාය මාර්ග පිළිබඳ ස්වාධීන විනිශ්චයක් සැපයීමට ප්‍රමාණවත් හැකියාව, කාර්ය සාධනය මෙන් ම සමාගමට වැදගත්වන සම්පත් සහ ව්‍යාපාරික භාවිතයන් ආදිය දැක්වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල තුලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික පාලන රාමුවෙහි ප්‍රධානම සංරචකය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සතු කුසලතා, දැනුම, අත්දැකීම්, වෘත්තීය සුදුසුකම්, වයස, ජාතිකත්වය ආදියෙහි පවතින විවිධත්වය, කුසලතා සංචිතය සහ සම්පත් භාවිතා කිරීම පිළිබඳ වඩා ඵලදායී තීරණ ගැනීම මෙන් ම එමගින් වඩා හොඳ ප්‍රතිලාභ ලබාගැනීමට ඉවහල් වෙයි.

සමාලෝචිත වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය සහ පළපුරුද්ද සහිත ප්‍රශස්ත කුසලතා සම්මිශ්‍රණයක් ඇති අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය.

අධ්‍යක්ෂවරුන් පත් කිරීම

සාංගමික ව්‍යවස්ථාවලියේ කොන්දේසි මත, අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ය. ඒ සඳහා අපේක්ෂකයින් සලකා බැලීමේදී ඔවුන් සතු අත්දැකීම්වල පරාසය, ව්‍යාපාරයේ මූල්‍ය ගැටළු පිළිබඳ අවබෝධය, නිවැරදි විනිශ්චයන් ලබාදීමේ හැකියාව, විවිධත්වය, නායකත්වය, සහ අත්දැකීම් මෙන් ම ව්‍යාපාරයට සහ කර්මාන්තයට බලපාන කාරණාවල දී ලබා ඇති ජයග්‍රහණ යනාදිය සැලකිල්ලට ගනු ලැබේ.

වගකීම් බෙදීයාම

2023 ඔක්තෝබර් මස 10 වන දින සිට සභාපතිවරයාගේ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන්, වගකීම්වල පැහැදිලි වෙනසක් සහිතව වෙන්කර ඇත. එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය සහ සමාගමේ මෙහෙයුම් සඳහා විධායක කළමනාකරණය අතර වගවීම සහ අධිකාරියේ තුලනයක් සහතික විය.

ඒ අනුව, 2024 සැප්තැම්බර් මස 26 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ නව සභාපතිවරයා ලෙස ඩී.ජේ.ඒ.එස්.ද එස්. රාජකරුණා මහතා පත්කරන ලද අතර, එම දිනයේ සිටම ක්‍රියාත්මක වන පරිදි නව කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා පත්කරන ලදී.

සභාපතිවරයාගේ කාර්යභාරය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, කාර්යක්ෂම සංවිධානයක් සහතික කිරීම හා එහි කාර්යයන් ඉටුකිරීම සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාවයේ විශ්වාසනීයත්වය සහ ඵලදායීතාවය තහවුරු කිරීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික දිශාව, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සංවිධානයේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මෙහෙයුම් උප කාණ්ඩ ලෙස එනම්, කොලොන්නාව පර්යන්තයේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා පිහිටි ලංකා තොග ගබඩාවල මෙහෙයුම් ලෙස වර්ග කළ හැකි ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් කටයුතු පර්යන්ත කළමනාකාර (මුතුරාජවෙල) ගේ ප්‍රධානත්වයෙන් සිදුවෙයි. කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ ප්‍රධානියා මෙහෙයුම් කළමනාකාර (අක්වෙරළ) වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ලංකා තොග ගබඩාවල ප්‍රධානත්වය දරන්නේ ගබඩා අධිකාරීවරුන් විසිනි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍යතා මත කැඳවනු ලැබෙයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෝ ද ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙති.

නාය පත්‍රයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස පවත්වනු ලබන අතර රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂවරුන්ට, ආයතනික කළමනාකරණය විසින් විස්තීර්ණ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. 2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වනු ලැබිණි.

මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම

	නම	ජන 24	පෙබ 28	අප්‍රේ 2	මැයි 8	ජූනි 11	ජූලි 21	අගෝ 26	ඔක් 7	නොවැ 12
1	ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා	P	P	P	P	P	P	P	P	P
2	ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා	P	P	P	P	P	P	P	P	P
3	ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා	P	P	P	P	P	P	P	P	P
4	දීපක් දාස් මහතා	P	P	P	P	P	P	P	P	Ab
5	අවිනාශ් සිංහාල් මහතා	P	P	P	P	P	P	P	P	P
6	සුනිල් කේ. මහාරණ මහතා	P	P	P	P	P	P	P	P	P
7	එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා	P	P	Ab	Ab	P				
8	එස්. හේමන්ත විජිත කුමාර මහතා	P	P	P	P	Ab				
9	එච්.ටී.පී. චන්දන මහතා			P	P	P	P	P	P	P
10	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා						P	P	P	P

P පැමිණීම **Ab** නොපැමිණීම

බලය බෙදීම සහ කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු හැර, වෙනත් කරුණු සඳහා උප කමිටු වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට නිශ්චිත වගකීම් පවරා ඇති පහත සඳහන් කමිටුවල සහාය ලැබේ.

ආ) විගණන සහ කළමනාකරණ කමිටුව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරනු ලැබේ. විගණන සහ කළමනාකරණ කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියා කරන අතර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

CPSTL විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. විගණන සහ කළමනාකරණ කමිටු සංයුතිය සහ සිදු කරනු ලබන කාර්යයන් මෙම වාර්ෂික වාර්තාවේ 76-77 පිටුවේ ඉදිරිපත් කර ඇත.

ඇ) තොග සමාලෝචන කමිටුව

CPSTL කාර්ය මණ්ඩලයේ සහ CPC/LIOC නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ඉන්ධන තොග සමාලෝචන කමිටුව සතිපතා පවත්වනු ලැබේ. පවතින ඉන්ධන තොග සමාලෝචනය කරන අතර, ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කල් ඇතිව සැලසුම් කෙරෙයි. රටේ ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන ශක්‍යතාව සහ ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු ආනයනය කළ යුතු ප්‍රමාණය හඳුනා ගනේ. දෛනිකව සිදු කෙරෙන සමීප නිරීක්ෂණ රට තුළ ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සමාගමට හැකියාව ලබා දෙයි.

ඈ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

BEC (ලංසු ඇගයීම් කමිටුව) සහ DPC (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව) ප්‍රසම්පාදන කාර්යයේ විනිවිදභාවය සහතික කිරීම සඳහාත්, සැපයුම් ප්‍රමාදයන් අවම කිරීම සහ ගුණාත්මකව හොඳම සේවාවන් ලබාගැනීම සඳහාත්, මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසි ලබා ගැනීමටත්, පත්කර ඇති අතර සමාගම විසින් නිෂ්පාදන, භාණ්ඩ, වැඩ සහ සේවා, මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කරයි.

මෙම කමිටුවේ ප්‍රධානත්වය දරන්නේ CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

තොරතුරු සහ සම්පත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරී සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කළමනාකරණ සහ සංවිධාන තොරතුරු ලබාගැනීමටත් සම්පත් පරිහරණයටත් අසීමිත අවසරයක් ඇත. විධායක කළමනාකරණය විසින් මෙහෙයුම් සැලසුම් කාර්ය සාධනය, උපාය මාර්ග, මූල්‍ය කළමනාකරණය, පිරිවැය, වත්කම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ නියාමන වෙනස්කම් ඇතුළු කරුණු සම්බන්ධයෙන් විවිධ ඉදිරිපත් කිරීම් කරයි. මෙහිදී අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදෙස් සහ තොරතුරු ලබාගත හැකි අතර වියදම සමාගම විසින් දරනු ලැබේ.

සමාගම් ලේකම්වරු

අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරී ඉටු කිරීම සහ වගකීම් සම්බන්ධයෙන් මග පෙන්වීම සහ ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කරමින්, ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරයි. සමාගම් ලේකම් සමඟ සියලුම අධ්‍යක්ෂවරුන්ට කටයුතු කළ හැක. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් උප කමිටු රැස්වීම් සංවිධානය කිරීම සහ අදාල වාර්තා සටහන් පවත්වා ගැනීම සමාගම් ලේකම් විසින් සිදුකරනු ලබයි.

03. සහතික කිරීම සහ පාලනය

මූල්‍ය වාර්තාකරණය

මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිතව ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) එනම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) සහ LKAS වලට අනුවය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ඇති අනුකූලතාව, යෝග්‍යතාවය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණු පිළිබඳව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමඟ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත

විනිවිදභාවය සහ අනුකූලතාවය

සියලුම ගනුදෙනුවලදී නීති සහ රෙගුලාසි සමඟ දැඩි අනුකූලතාව සහතික කරමින්, සදාචාරාත්මක ප්‍රමිතීන්, කම්කරු හා මානව හිමිකම් සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කරමින්, විනිවිදභාවය පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

- 1961 අංක 28 දරණ ලංකා බනිජතෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි විධිවිධානවලට අනුව සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිර්මාණය කර ඇත.
- 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව විගණකාධිපති විසින් ආයතනයේ බාහිර විගණනය සිදු කරන ලදුව, මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- වගවීම සහතික කිරීම සඳහා, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) සහ අනෙකුත් අදාල රෙගුලාසිවලට, සමාගම අනුගත වේ.

අභ්‍යන්තර පාලනය

මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහාත්, මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය සහ අදාල නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහ අවදානම් කළමනාකරණය සඳහාත් අභ්‍යන්තර පාලන පද්ධතියක් නිවැරදිව ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙය මූල්‍ය හා ගිණුම්කරණයේ තොරතුරුවල අඛණ්ඩතාව තහවුරු කරන අතර මෙහෙයුම් සහ ලාභදායීතාවය පිළිබඳ ඉලක්ක සපුරාලීම සඳහාත්, කළමනාකරණ ප්‍රතිපත්ති සංවිධානය පුරා සම්ප්‍රේෂණය කිරීමටත් ඉතා වැදගත් වේ. ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියකට සහතික කළ හැක්කේ සාධාරණ කාල සීමාවක් තුළ දෝෂ සහ අක්‍රමිකතා ඇති බව හෝ ඉදිරිපත් කරනු ඇති බව පිළිබඳ සාධාරණ සහතිකයක් මිස නිරපේක්ෂ සහතිකයක් නොවේ.

CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන පද්ධතිය තුල ආයතනය කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව අභ්‍යන්තර විගණන කාර්යාංශය සහතික කරයි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය, ස්වාධීන කළමනාකරණයක් සහිත අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ සංවිධානයක සියලුම ක්‍රියාකාරකම් පාලනය කිරීම දැඩිව තබා ගැනීමයි. කළමනාකරණයට මූල්‍ය වාර්තාවල අව්‍යාජභාවය පිළිබඳ සහ සංවිධානයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සහතිකයක් අවශ්‍ය වේ. විගණනය මේ අවශ්‍යතා දෙකම තහවුරු කිරීමට උපකාරී වේ. නීති රෙගුලාසිවලට හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවට එය නිසියාකාරව සහතික කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය පහත පරිදි වේ.

- සියලුම ව්‍යාපාරික ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට පෙර පවතින නීති හා රෙගුලාසිවලට අනුකූලව නිසි ලෙස පූර්ව අනුමත කර ඇතිබව සහතික කිරීම.
- සියලුම ගිණුම් තොරතුරු නිසි පරිදි SAP හි නිසි ලෙස වාර්තා කර ඇති බවටත්, ප්‍රාථමික වාර්තා නිවැරදිව නඩත්තු කෙරෙන බවටත්, කාර්යක්ෂම කළමනාකරණය සහතික කිරීම සඳහා අදාල සංඛ්‍යා ලේඛන සහ පාලන දත්ත නිසි ලෙස නිර්මාණය කර ඇති බවටත් තහවුරු කිරීම.
- මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශයන් සංවිධානයේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ නිරූපණයක් කරන බව සහතික කිරීම.
- ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම.
- පද්ධති පදනම් ප්‍රවේශය යොදාගනිමින් පහත කරුණු සමාලෝචනය සහ ඇගයීම.
    - ◊ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීම මැනීමට කළමනාකරණය විසින් භාවිත කරන සියලුම පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
    - ◊ කළමනාකරණ සැලසුම්, ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති සහ අනෙකුත් අවශ්‍යතා නීති සම්පාදනයට අනුකූල වීමේ මට්ටම.
    - ◊ වත්කම් අත්පත් කර ගැනීම, බැහැර කිරීම සහ ආරක්ෂා කිරීම, වංචා අක්‍රමිකතා සහ අක්‍රමිකතාවලින් පැන නගින පාඩු ඇතුළු පොළිය.
    - ◊ ආර්ථික සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය වළක්වා ගැනීම.
    - ◊ තීරණගැනීම සහ වගවීම සඳහා සපයනු ලැබෙන තොරතුරුවල ප්‍රමාණවත් බව, විශ්වාසනීයත්වය සහ අඛණ්ඩතාව මෙන් ම භාවිතා කරන තොරතුරු ප්‍රමාණය.

බාහිර විගණනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සාධාරණ හා සත්‍ය නියෝජනය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා බාහිර විගණකවරුන් වගකිව යුතුය.

1971 අංක 38 දරණ මුල්‍ය පනත සහ 2018 ජාතික විගණන පනතට අනුව, ආයතනයේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සභාගතකළ යුතු ය.

2023 වසරේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච්ඡේද සංග්‍රහයට අනුකූලතාව.

අංකය	ආයතනික පාලන ප්‍රතිපත්ති	අනුකූලතාව පිළිබඳ විස්තර	අනුකූලතාවයේ තත්ත්වය
A	අධ්‍යක්ෂකවරු		
A.1	අධ්‍යක්ෂ මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩලය උපාය මාර්ගික දිශානතිය සැකසීමේදී සහ සාර්ථක පාලන රාමුවක් ස්ථාපිත කිරීමේදී නායකත්වය ලබා දෙයි.	අනුකූල වේ
A1.1	නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර, අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලැබේ. • අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණීම 58 වන පිටුවෙහි ඇති වගුවේ විස්තර කර ඇත.	අනුකූල වේ
A1.2	අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරයන් සහ වගකීම්	අධ්‍යක්ෂ මණ්ඩලය පහත වගකීම් භාරගනිමින් ව්‍යවසායකත්වමය නායකත්වය ලබාදිය යුතුය. • උපාය මාර්ග සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. • ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කුසලතා සහ අනුප්‍රාප්තිය. • තොරතුරුවල අඛණ්ඩතාව, අභ්‍යන්තර පාලන, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් කළමනාකරණය. • නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම. • තීරණ ගැනීමේ දී සියලූ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සලකා බැලීම. • තිරසාර ව්‍යාපාර සංවර්ධනය. • සුදුසු හිඟුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ මූල්‍ය රෙගුලාසි සමග, අනුකූලතාවය.	අනුකූල වේ
A1.3	රටේ නීතිවලට අනුකූලව කටයුතු කිරීම	සමාගම අදාල නියමයන්, නීති සහ රෙගුලාසි සියල්ලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.	අනුකූල වේ
A1.4	සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය	• ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වයි. • ඕනෑම නව නීති සහ පිළිපැදිය යුතු රෙගුලාසි පිළිබඳව ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙයි.	අනුකූල වේ
A1.5	ස්වාධීන විනිශ්චය	අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල කාරණා සම්බන්ධයෙන් ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමට සමාන අවස්ථා තිබේ.	අනුකූල වේ
A1.6	අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සමාගමේ කරුණු සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කිරීම	සෑම රැස්වීමකටම පෙර දැන්වීම, න්‍යාය පත්‍රය සහ ලිපි ලේඛන සියලුම අධ්‍යක්ෂවරුන්ට සපයනු ඇත. එසේ කරනුයේ එය සමාලෝචනය කිරීමට සහ අතිරේක තොරතුරු විමසීමට හෝ පැහැදිලි කරගැනීම් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීමටය.	අනුකූල වේ
A1.7	අවශ්‍ය නම්, සමාගමේ අවශ්‍යතාව සඳහා, අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 පිරිසකට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට යෝජනාවක් ඉල්ලා සිටිය හැක.		අදාල නොවේ
A1.8	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය සහ පුහුණුව	සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින්, අභ්‍යන්තර හා බාහිර පරිසරය සම්බන්ධ අදාල තොරතුරු ගැන, අධ්‍යක්ෂවරුන් නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ.	අනුකූල වේ

අංකය	ආයතනික පාලන ප්‍රතිපත්ති	අනුකූලතාව පිළිබඳ විස්තර	අනුකූලතාවයේ තත්ත්වය
A.2	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවල වගකීම් බෙදීම	සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල, වගකීම් සහ පාලනය පිළිබඳ පැහැදිලි බව සහතික කිරීම සඳහා සභාපතිවරයාගේ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන් වෙන් කරන ලදී.	අනුකූල වේ
A.2.1	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවන් ඒකාබද්ධ කිරීම සාධාරණීකරණය කිරීම (එක් පුද්ගලයෙකු තුළ)		අදාල නොවේ
A.3	යහපත් ආයතනික පාලනයක් පවත්වාගැනීමේදී සභාපතිවරයාගේ වගකීම	සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර, • අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සහභාගීත්වය සහ දායකත්වය තහවුරු කරයි. • සලකා බලනු ලබන ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරයි. • අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කටයුතු සම්පූර්ණයෙන්ම පාලනය කරන අතර සියලුම පාර්ශවකරුවන් වෙත එහි බැඳීම පිළිබඳ අනතුරු අඟවයි.	අනුකූල වේ
A.4	ආයතනය සතු මූල්‍ය ඥානය	සමාගමේ මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමේදී, අවශ්‍ය මූල්‍ය දැනුම සහ ප්‍රවීණත්වය ඔස්සේ මග පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූල්‍ය වෘත්තිකයන් තිදෙනෙකු ඇත. • අවිනාශ් සිංහාල් මහතා දිල්ලි විශ්ව විද්‍යාලයේ, හින්දු විද්‍යාලයේ වාණිජ උපාධිධාරියෙකු වන අතර, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරීවරයෙකි. • ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා ඕස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබාගෙන ඇත. එසේම, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) (ගෞරව) උපාධිය ද ලබා ඇත. • එච්.ටී.පී. චන්දන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි (ACA). ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහුගේ ආයතනික පළපුරුද්දට අමතරව, චන්දන මහතා CP Associates හි වසර අටකට වැඩි කාලයක් හවුල්කරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර, මූල්‍ය හා ව්‍යාපාර උපදේශන ක්ෂේත්‍රයන්ට සිය ප්‍රවීණත්වය ලබා දී ඇත.	අනුකූල වේ
A.5	අධ්‍යක්ෂ මණ්ඩල තුලනය	• 2025 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අට දෙනාගෙන් පස් දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.	අනුකූල වේ
A.6	සුදුසු විධිවිධාන සහ කාලෝචිත තොරතුරු	• නියමිත රැස්වීමට පෙර අධ්‍යක්ෂවරුන්ට අදාළ තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සැපයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ න්‍යාය පත්‍රය කල්තියා බෙදා හරිනු ලැබේ.	අනුකූල වේ
A.7	අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්	• සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහා සභා රැස්වීමක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු පත් කරනු ලැබේ. 2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම් 57 පිටුවේ ඇති වගුවේ දක්වා ඇත.	අනුකූල වේ
B	**අධ්‍යක්ෂවරුන්ගේ වේතනය**		
B.1	විධායක සහ අධ්‍යක්ෂ වේතන පිළිබඳ ප්‍රතිපත්තිය සංවර්ධනය සඳහා ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම		අනුකූල වේ
B.2	වේතන මට්ටම සහ සැකැස්ම		අනුකූල වේ
B.3	ගෙවන ලද අධ්‍යක්ෂ මණ්ඩල වේතන අනාවරණය කිරීම	මූල්‍ය තොරතුරු - විස්තරාත්මක ආදායම් ප්‍රකාශය	අනුකූල වේ

අංකය	ආයතනික පාලන ප්‍රතිපත්ති	අනුකූලතාව පිළිබඳ විස්තර	අනුකූලතාවයේ තත්ත්වය
C	**කොටස් හිමියන් සමග සබඳතා**		
C.1	වාර්ෂික මහා සභා රැස්වීම (AGM) සහ මහා සභා රැස්වීම් පැවැත්වීම ඵලදායී ලෙස භාවිතා කිරීම.		අනුකූල වේ
C.2	කොටස් හිමියන් සමග සන්නිවේදනය	• කාලෝචිත තොරතුරු බෙදා හැරීම සඳහා කොටස් හිමියන් දෙදෙනා සමග සමාගමට විධිමත් මාධ්‍යයක් ඇත.	අනුකූල වේ
C.3	සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු ඇතුළු ප්‍රමාණාත්මක ගනුදෙනු අධ්‍යක්ෂවරුන් විසින් කොටස් හිමියන්ට අනාවරණය කළ යුතුය.		අනුකූල වේ
D	**වගවීම සහ විගණනය**		
D.1	මූල්‍ය වාර්තාකරණය	• වාර්ෂික වාර්තාව මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා සියලූ උත්සාහයන් ගනු ලැබේ. • වාර්ෂික වාර්තාව සහ අනෙකුත් අතුරු වාර්තා සකස් කිරීමේදී සමාගමට අදාල නීති සහ රෙගුලාසි වලට අනුකූල විය. • පහත සඳහන් අනාවරණයන් සංග්‍රහය මගින් උපදෙස් ලබාදී ඇති පරිදි වාර්ෂික වාර්තාවේ ඇතුලත් වේ. i. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය 29 - 51 පිටු. ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 74 - 75 පිටු. iii. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය 90 පිටුව. iv. අඛණ්ඩ පැවැත්ම පිළිබඳ 74 පිටුව. v. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 74 - 75 පිටුව. vi. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 83 - 89 දක්වා පිටු. vii. සභාපතිගේ සහ කළමනාකාර අධ්‍යක්ෂගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 16 - 19 පිටු. viii. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 19 හි අනාවරණය කර ඇති සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු. ix. කැඳවීමට බරපතල ප්‍රාග්ධන අලාභ නොමැත. • රජයේ චක්‍රලේඛවලට අනුව සමාගම විසින් අමාත්‍යාංශය ඉල්ලා සිටි අවශ්‍ය අනෙකුත් අතුරු වාර්තා ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ
D.2	අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය	විගණන සහ කළමනාකරණ කමිටුවේ මගපෙන්වීමෙන් සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන්, ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන සහ කාලීන නියාමන වලින් සමන්විත ඉතා ඉහළ අවදානම් කළමනාකරණ රාමුවක් සමාගම විසින් ස්ථාපිත කර ඇත. 65 - 73 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ සහ 76 - 77 පිටුවල විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාවේ මේවා විස්තර කර ඇත.	අනුකූල වේ
D.3	විගණන සහ කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වෙයි. එයට අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලැබේ. එහි සංයුතිය සහ විගණන කමිටුව විසින් සිදු කරනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ 76 - 77 පිටුවල සඳහන් වෙයි.	අනුකූල වේ

අංකය	ආයතනික පාලන ප්‍රතිපත්ති	අනුකූලතාව පිළිබඳ විස්තර	අනුකූලතාවයේ තත්ත්වය
E	**ආයතනික ආයෝජකයින්**		
E.1	කොටස් හිමියන්ගේ ඡන්දය	කොටස් හිමියන්ගේ රැස්වීම්වලට සහභාගී වීමට සියලුම ආයතනික කොටස් හිමියන් දිරිගන්වනු ලබන අතර ඔවුන්ගේ අදහස් අදාළ සියල්ලන්ටම දැනුම් දෙනු ලැබේ.	අනුකූල වේ
E.2	පාලනය හෙළිදරව් කිරීම් ඇගයීම	වාර්ෂික වාර්තාව ආයතනික පාලන ක්‍රියාවලිය විස්තර කරයි.	අනුකූල වේ
G	**අන්තර්ජාලය සහ සයිබර් ආරක්ෂාව**		
	සයිබර් අවදානම් කළමනාකරණයට හා සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු තාක්ෂණ උපාංග ආයතන ජාලයට සම්බන්ධ කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතුයි.	• ආපදා ප්‍රතිසාධන කළමනාකරණ මධ්‍යස්ථාන (DRMC) ව්‍යාපෘතිය ක්‍රියාකාරීව ඇත. • සැක සහිත ජාල ක්‍රියාකාරකම් නිතිපතා පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය සමග ජාල පරාමිති ආරක්ෂා කිරීම, දත්ත නැතිවීම, සයිබර් වංචා කිරීම, බෙදා හැරීමේ සේවා ප්‍රතික්ෂේප කිරීම, ජංගම දුරකථන උපාංග සහ සැක සහිත සයිබර් ක්‍රියාකාරකම් නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා ජාල ආරක්ෂණ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම. • උපස්ථ සේවාදායකය (Backup server) සහ ප්‍රතිසාධන සේවාදායකය (recovery server). • වැඩිදුර විස්තර වාර්තාව 65 - 73 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ විස්තර කර ඇත.	අනුකූල වේ
H	**පාරිසරික හා සමාජීය සාධක පාලන පිළිබඳ වාර්තාකරණය (ESG)**		
	ESG කාර්ය සාධනයේ ප්‍රමාණවත් අනාවරණය	වාර්ෂික වාර්තාව කාර්ය සාධනය පිළිබඳ පරිපූර්ණ සමාලෝචනයක් සපයයි. සමූහය විසින් භාවිතා කරන විවිධ අංශවල කාර්ය සාධනය වාර්තාවේ වෙනම කොටස්වල විස්තර කර ඇත.	අනුකූල වේ

අවදානම් කළමනාකරණය

ආයතනයේ තිරසාර සහ දිගුකාලීන වර්ධනය උදෙසා අත්‍යවශ්‍ය අංගයක් ලෙස අවදානම් කළමනාකරණය පිළිබඳව, CPSTL ආයතනය දැඩි අවධානයක් යොමු කරයි. අපගේ මූලික අරමුණ වන්නේ සියලුම ආයතනික වැඩපිළිවෙලවල් මඟින් උත්පාදනය කරන වටිනාකම තවදුරටත් ශක්තිමත් කිරීමයි. මෙම කැපවීම තුළ අපගේ අඛණ්ඩ මෙහෙයුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි සාධක හා සම්බන්ධ විභව ප්‍රතිලාභ මෙන්ම අවාසි පිළිබඳවද ඉතා සැලකිලිමත් ඇගයීමක් සිදු කරනු ලබයි. අපගේ අවදානම් කළමනාකරණ රාමුව ගතික මෙන්ම කඩිනම් ප්‍රතිචාර දැක්විය හැකි පරිදි සකස් කර ඇති අතර එය ආයතනික උපායමාර්ග ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ අත්‍යවශ්‍ය අංගයකි.

අපගේ ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවන අවදානම් විවිධ මූලාශ්‍රවලින් පැන නඟින අතර ඒවායෙන් බොහොමයක් අපගේ සෘජු පාලනයෙන් ඔබ්බට පවතී. මෙවැනි බාහිර බලපෑම් මෙන්ම ආයතනික කීර්තිනාමය, ආරක්ෂාව, පාරිසරික බලපෑම්, සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව නිශ්පාදන ගුණාත්මකභාවය සහ තොරතුරු තාක්ෂණය වැනි පුළුල් ව්‍යාපාරික අවදානම් නිරන්තරයෙන් හා දැඩි ලෙස අධීක්ෂණය කරනු ලබයි. මෙවැනි සෑම අංගයක්ම අපගේ විස්තීර්ණ සහ පූර්ව ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ තීරණාත්මක කොටසක් වේ.

ආයතනික අවදානම් කළමනාකරණ (ERM) රාමුව

ආයතනික අවදානම් කළමනාකරණ (ERM) රාමුව ආයතනයේ තිරසාර සහ දිගුකාලීන වර්ධනය උදෙසා අත්‍යවශ්‍ය අංගයක් ලෙස අවදානම් කළමනාකරණය පිළිබඳව, CPSTL ආයතනය දැඩි අවධානයක් යොමු කරයි. එය උපායමාර්ගික සැලසුම්කරණය, කළමනාකරණ තීරණ ගැනීම සහ දෛනික මෙහෙයුම් ක්‍රියාවලීන් තුළ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කර ඇත. CEYPETCO, LIOC, SINOPEC සහ RM Parks සඳහා තොග බනිජතෙල් නිශ්පාදන භාරකරුවෙකු ලෙස CPSTL හි ඇති අතිශය වැදගත් වගකීම සැලකිල්ලට ගනිමින්, මෙහෙයුම් අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රමවේද අත්‍යවශ්‍ය බව සමාගම අවබෝධ කර ගෙන ඇත. ඉතා ඉහළ අවදානම් සහ සංවේදී පරිසරයක ක්‍රියාත්මක වන CPSTL, ව්‍යාපාරික අරමුණු වලට බාධා ඇති විය හැකි අවදානම් කල්තියා හඳුනා ගැනීම සහ අවම කිරීම ප්‍රමුඛත්වයක් ලෙස සලකයි. ව්‍යාපාර සැලසුම්කරණය, වාර්තාකරණය, විගණන ක්‍රියාවලීන් සහ තොරතුරු පද්ධති තුළ අවදානම් විශ්ලේෂණයන් ඒකාබද්ධ කිරීම මඟින්, සමාගම ක්‍රමානුකූල, විනයගරුක සහ අනාගත-නැඹුරු (Forward-looking) අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් තහවුරු කරයි.

සමාගම විසින් ආයතනය පුරා ක්‍රියාත්මක වන ශක්තිමත් හා සවිස්තරාත්මක අවදානම් පාලන රාමුවක් ස්ථාපිත කර ඇත. ආයතනයේ සංස්කෘතිය සමඟ සමීපව ඒකාබද්ධ කර ඇති මෙම රාමුව ආයතනයේ අවදානම් කළමනාකරණයේ (Enterprise Risk Management - ERM) පදනම ලෙස ක්‍රියා කරයි. ආයතනයේ සංස්කෘතිය මඟින් සමාගමේ ආචාරධාර්මික මූලධර්මල වටිනාකම, විශ්වාස, ආකල්ප සහ අවදානම් පිළිබඳ සාමූහික අවබෝධය ප්‍රකාශ වේ. එය සංවිධානයේ සියලු මට්ටම්වල අවදානම් පිළිබඳ දැනුවත් මනෝභාවයක් වර්ධනය කිරීම සහ සේවක හැසිරීම් සමාගමේ උපායමාර්ගික අරමුණු සමඟ අනුගත වන බව තහවුරු කිරීම සඳහා වැදගත් භූමිකාවක් ඉෂ්ට කරයි.

ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් මඟින් වගවීම, සදාචාරාත්මක තීරණ ගැනීම සහ අවදානම් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමේ විනිවිදභාවය ප්‍රවර්ධනය කරයි. එමඟින් දෛනික මෙහෙයුම්වලදී මෙන්ම උපායමාර්ගික තීරණ ගැනීමේදී ද අවදානම් පිළිබඳ සාධක සැලකිල්ලට ගැනීම සහතික කෙරේ. මීට අමතරව, අවදානම්වලට අදාළ තොරතුරු කාලෝචිතව සහ විනිවිදබාවයකින් යුතුව සන්නිවේදනය කිරීමට හිතකර පරිසරයක් මෙවැනි රාමුව මඟින් නිර්මාණය කරයි. එමඟින් සංවිධානයට නව අවදානම් කල්තියා හඳුනා ගැනීමටත් ඇතිවිය හැකි අවස්ථා උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමටත් හැකි වේ.

මෙම රාමුව මඟින් සමස්ථ ආයතනය පුරා අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා ක්‍රමානුකූල සහ ස්ථාවර ප්‍රවේශයක් ස්ථාපිත කරයි. ඉදිරිපෙළ සේවක පිරිසේ සිට ජ්‍යෙෂ්ඨ නායකත්වය දක්වා සෑම සේවකයකුම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ තමන්ගේ කාර්යභාරය සහ වගකීම් පැහැදිලිව වටහා ගැනීම එමඟින් සහතික කෙරෙන අතර, එය ඒකාබද්ධ වූත්, අරමුණු සමඟ සමපාත වූත් ආයතනික ප්‍රයත්නයක් ගොඩනඟීමට ඉවහල් වේ. මෙම රාමුව එකිනෙකට සම්බන්ධ වූ අංග හයකින් සමන්විත අතර, ඉන් සෑම අංගයක්ම අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියයක් පෝෂණය කිරීමට සහ නිවැරදි තොරතුරු මත පදනම් වූ ඵලදායී තීරණ ගැනීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

i. **අවදානම, අවදානම් කළමනාකරණය සහ ආයතනික අවදානම් කළමනාකරණය**
ආයතනය පුරා පොදු අවබෝධයක් ඇති කිරීම සඳහා මූලික සංකල්ප පැහැදිලි කරයි.

ii. **මෙහෙවර, දැක්ම, මූලික වටිනාකම සහ ආයතනික අවදානම් කළමනාකරණ** (ERM) **මූලධර්ම**
අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් මෙහෙයවීමට උපායමාර්ගික පසුබිම සහ මූලික වටිනාකම ලබාදෙයි.

iii. **අවදානම් රුචිය**
සංවිධානය තම අරමුණු සාධනය කිරීමේදී පිළිගැනීමට සූදානම් අවදානම් ප්‍රමාණය සහ වර්ගය නිර්වචන කරයි.

iv. **කළමනාකරණ අරමුණු**
අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්, ව්‍යාපාරික ඉලක්ක සහ කාර්ය සාධන ප්‍රතිඵල සමඟ සමපාත කරයි.

v. **සංවිධාන පුරා විහිදුණු අවදානම් පාලන ව්‍යුහය**
ආයතනය පුරා ERM පාලනය සහ වගවීම තහවුරු කරන කාර්යභාරයන්, වගකීම්, අධීක්ෂණ යාන්ත්‍රණ සහ වාර්තාකරණ ක්‍රමවේද විස්තර කරයි.

vi. **අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය**
අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, අවම කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා වූ ක්‍රමානුකූල පියවරයන් දක්වයි.




සැලසුම් කිරීම | ක්‍රියාත්මක කිරීම | නිරීක්ෂණය කිරීම | අනුගත කිරීම

මෙම කරුණු හය එක් ව ගත් කල, අවදානම් පිළිබඳ දැනුවත්භාවය CPSTL හි සංස්කෘතියට, උපායමාර්ගික දිශානතියට සහ දෛනික මෙහෙයුම්වලට බද්ධ කරන පුළුල් සහ ඒකාබද්ධ වූ ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් නිර්මාණය කරයි. අවදානම් කළමනාකරණය ආයතනික අරමුණු සමඟ සමපාත කිරීමෙන්, සියලු මට්ටම් හරහා වගකීම් පැහැදිලිව නිර්වචනය කිරීමෙන් සහ ව්‍යුහගත මෙන්ම විනයගරුක ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන්, අවිනිශ්චිතතාවයන් කල්තියා හඳුනා ගැනීමටත්, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමටත්, සියලු පාර්ශ්වකරුවන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීමටත් CPSTL මැනවින් සන්නද්ධ වී ඇත. මෙම රාමුව මඟින් වඩාත් ගතික සහ අවදානම් සහගත වෙමින් පවතින පරිසරයක් තුළ විනිවිදභාවය, වගවීම සහ තිරසාර වර්ධනය වෙනුවෙන් CPSTL සතු කැපවීම මනාව තහවුරු කරයි.

අවදානම් පාලන ව්‍යුහය

අවදානම් පාලනය, සමාගමේ පුළුල් ආයතනික පාලන රාමුවේ අත්‍යවශ්‍ය අංගයකි. එය අවදානම් කළමනාකරණය සංවිධානය පුරා අන්තර්ගත වී ඇති බවත්, උපායමාර්ගික සැලසුම්කරණය, තීරණ ගැනීම සහ දෛනික මෙහෙයුම් සමඟ සම්පූර්ණයෙන් ඒකාබද්ධ වී ඇති බවත් සහතික කරයි. හොඳින් සැලසුම් කළ අවදානම් පාලන ව්‍යුහයක් වගවීම ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ දිගුකාලීන සංවිධානීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහය වීම සඳහා උපකාරී වේ.



සමාගමේ අවදානම් පාලන ව්‍යුහය මඟින් සියලුම ක්ෂේත්‍රයන්හි අවදානම් කළමනාකරණයට අදාළ භූමිකාවන් සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ඇත. මෙවැනි වගකීම් අධීක්ෂණ, මෙහෙයුම් සහ සමාලෝචන කාර්යභාර දරන පාර්ශවයන් අතර බෙදා දී ඇති අතර, එමඟින් සම්බන්ධීකරණය වූත් සහ සවිස්තරාත්මක අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමට හැකියාව සලසයි.

මෙවැනි ව්‍යුහ ලොව පුරා පුළුල් ලෙස පිළිගත් හොඳම ප්‍රායෝගික රාමුවක් වන ආරක්ෂක වළලු තුනේ ආකෘතිය (Three Lines of Defense Model) සමඟ සමීපව අනුගත වන අතර, සංවිධානයක් තුළ අවදානම් හිමිකාරිත්වය, අධීක්ෂණය සහ සහතික කිරීම යන විවිධ මට්ටම් පැහැදිලිව වෙන්කර හඳුනා ගනී.


අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් කළමනාකරණය යනු සමාගමේ කාර්යසාධන සමාලෝචන සහ තීරණ ගැනීමේ ක්‍රියාවලින් සමඟ පූර්ණ ලෙස ඒකාබද්ධ වූ අඛණ්ඩ ක්‍රියාවලියකි. මෙහි මූලික අරමුණ වන්නේ ගැටළු පැන නැඟීමට පෙර ඒවා හඳුනා ගැනීම වන අතර, එමඟින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට විල්ල විය

හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පෙර සූදානමක් සහිතව (Proactively) අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සැලසේ. අවදානම් කළමනාකාරණ ක්‍රියාවලියට පහත සඳහන් ප්‍රධාන පියවර ඇතුළත් වේ.

1. **පරිසරය ස්ථාපිත කිරීම** - සංවිධානය ක්‍රියාත්මක වන අභ්‍යන්තර හා බාහිර පරිසරය, අරමුණු, විෂය හා අවදානම් කළමනාකරණයේ ක්‍රියාමාර්ග සඳහා මූලධර්ම නිර්වචනය කරයි. මෙවැනි පියවර මඟින් සම්පූර්ණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට පදනම ලෙස ක්‍රියා කරයි.
2. **අවදානම් ඇගයීම** - ව්‍යාපාරික අරමුණු ඉෂ්ට කිරීමේදී අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රවලින් ඉදිරිපත් විය හැකි අවදානම් හඳුනාගෙන, විශ්ලේෂණය සහ ඇගයීම සිදු කිරීමේ ක්‍රමානුකූල ක්‍රියාවලියකි. මෙවැනි ඇගයීම සංවිධානයේ උපායමාර්ගික සහ මෙහෙයුම් අරමුණු වලට සාපේක්ෂව එක් එක් අවදානමේ ඇති වැදගත්ම (හෝ බරපතලකම) තීරණය කිරීමට උපකාරී වේ.
3. **අවදානම් නිරාකරණය / අවදානම් අවම කිරීම** - අවදානම් ස්වභාවය සහ තක්සේරු කරන ලද බරපතලකම මත පදනම්වල ඒවාට පිළියම් යෙදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මෙයට ඇතුළත් වේ. අවදානම ඇති වීමේ හැකියාව සහ එමඟින් සිදුවිය හැකි බලපෑම මත පදනම්ව, අවදානම් මඟහැරීම වෙනත් පාර්ශවයකට පැවැරීම (මාරු කිරීම), අවම කිරීම හෝ අවදානම පිළිගැනීම මෙහෙදී ගත හැකි පිළියම් (විකල්ප) අතර වේ.
4. **වාර්තා කිරීම, නිරීක්ෂණය සහ සමාලෝචනය** - අවදානම් සහ පාලන උපක්‍රමය නිතිපතා සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ පිරිපහදු කිරීම සහතික කරන අඛණ්ඩ ක්‍රියාවලියකි. මෙවැනි පියවර මඟින් අවදානම් පරිසරයේ සිදුවන වෙනස්කම් හඳුනා ගැනීමට උපකාරී වන අතර, අවදානම් අවම කිරීමේ උපායමාර්ග ඵලදායී හා අදාළ මට්ටමකින් පවතින බව සහතික කරයි.
5. **සන්නිවේදනය සහ උපදේශනය** - අවදානම් කළමනාකරණ රාමුව පුරා අන්තර්ගත වී ඇති අඛණ්ඩ ක්‍රියාවලියකි. එමඟින් සියලුම මට්ටම්වල සිටින සේවකයින් සංවිධානයේ අවදානම් උපායමාර්ගික ප්‍රමුඛතා සහ වෙනුවට පැවැරී ඇති වගකීම් මැනවින් වටහාගෙන ඇති බව සහතික කරයි.

අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය කිරීම-ශක්තිමත් අභ්‍යන්තර සන්නිවේදනයක් සහතික කිරීම සහ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනයන් පිළිබඳ බාහිර වාර්තාකරණයේ වගවීම භාර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛ (මූලික i) භූමිකාවක් ඉෂ්ට කරයි.



සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
තරඟකරුවන්ගේ අවදානම		
අඩු මිල ගණන් යටතේ සමාන ගබඩා ධාරිතාවක් ලබාදිය හැකි වෙනත් පර්යන්ත සමාගම් වලින් ඇති වන තරඟකාරිත්වය සමාගමේ මූල්‍ය කාර්යසාධනය සහ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලවලට අවාසිදායක ලෙස බලපෑම් කළ හැකිය. තවද, 2002 අංක 33 දරන බනිජතෙල් නිශ්පාදන (විශේෂ විධිවිධාන) පනත 2022 ඔක්තෝබර් 21 දින සංශෝධනය කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව තුළ බනිජතෙල් නිශ්පාදන ආනයනය හා බෙදාහැරීම සඳහා පුද්ගලික ආයතනවලට බලපත්‍ර ලබා ගැනීමට අවසර ලබා දී ඇත. මෙම නියාමන වෙනස හේතුවෙන් ඉදිරියේදී කර්මාන්තය තුළ තරඟකාරී පීඩනය වැඩිවිය හැකි අතර, එමගින් සමාගම වෙළෙඳපොළ ප්‍රතිඵල අවදානම්වලට වැඩි වශයෙන් නිරාවරණය වීමට ඉඩ ඇත.	• CPSTL සමාගමේ කොටස් හිමිකරුවන් වන CPC සහ LIOC ඇතුළු අනෙක් පර්යන්ත සමාගම්වලින් විල්ලවන තරඟකාරිත්වයට මුහුණ දීමට සිදුවේ. • බනිජතෙල් කර්මාන්තයට පුද්ගලික ආයතනවලට පිවිසීමට අවසර ලබාදීම, ඉදිරියේදී තරඟකාරී පීඩනය වැඩිවීමට ඉඩ ඇති කරයි.	• විශේෂයෙන්ම ගබඩා ධාරිතාව වැඩි කිරීම සහ යටිතල පහසුකම් නවීකරණය කිරීම මගින් පවතින පර්යන්ත පුළුල් කිරීම. • ටැංකි රථ සංචිතය වැඩි කිරීම. • උසස් සේවා ප්‍රමිතීන් පවත්වාගෙන යාමක් සඳහා ඉහළ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීම සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ මාර්ගෝපදේශනය මගින් ඔවුන් සවිබල ගැන්වීම. • වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා වලට ගැළපෙන නව තාක්ෂණයෙන් පිරිපුන් සේවාවන් සපයාදීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය හරහා නවෝත්පාදන මත අඛණ්ඩව රැඳෙමින්, අපගේ තරඟකරුවන්ට වඩා ඉදිරියෙන් සිටීමට අපි අවධානය යොමු කරමු.
සේවක රඳවාගැනීමේ අවදානම		
අපගේ අනාගත සාර්ථකත්වය විධායක නිලධාරීන් සහ අනෙක් ප්‍රධාන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අඛණ්ඩ දායකත්වය මත බෙහෙවින් රඳා පවතී. මෙම දක්ෂතාවෙන් යුත් කණ්ඩායමෙන් එක් හෝ වැඩිදෙනෙකු අහිමි වීම සමාගමේ ව්‍යාපාර කාර්ය සාධනය, මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි අවාසිදායක ලෙස බලපෑ හැකිය. මීට අමතරව මෑත වසරවලදී රට තුළ පැවති දිගුකාලීන ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය දක්ෂ සේවකයින් විදේශගත වීම යාමට හේතු වී ඇති අතර, එයින් පළපුරුදු සහ ඉහළ පුහුණුවක් ලද සේවකයින් අහිමි වීමේ අවධානම වැඩි වී ඇත. මෙම ප්‍රවණතාවය අත්‍යවශ්‍ය දක්ෂයින් රඳවා ගැනීමට සහ මෙහෙයුම් අඛණ්ඩතාව පවත්වාගෙන යාමට සමාගමට ඇති හැකියාවට තවදුරටත් අභියෝග විල්ල කළ හැකිය.	• රටේ ආර්ථික හා දේශපාලන අස්ථිරතාවය • පවතින උසස්වීම් ක්‍රමවේදය සහ ක්‍රියාපටිපාටි පිළිබඳ සේවක අසතුට • වෘත්තීය සංවර්ධන අවස්ථා අඩුවීම. • තමන් අගය නොකරන ලද බවට ඇති හැඟීම • දුර්වල නායකත්වය • නම්‍යශීලීභාවය අඩුවීම.	• ප්‍රධාන තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීම • සේවකයින්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ආයතනයේ වේතන සහ වෘත්තීය වර්ධන රාමුව සමඟ සම්බන්ධ කිරීම. අනාගත වැටුප් වර්ධක සහ වෘත්තීය දියුණුව පිළිබඳ තීරණ මෙම ස්ථාපිත නිර්ණායක මත පදනම් ව ගනු ඇත. • උසස් තත්ත්වයේ දක්ෂතා ආරක්ෂණය කර ගැනීම සඳහා “Skill Fit” වැඩසටහන ක්‍රියාත්මක කිරීම. • සේවක වටිනාකම යෝජනාවලිය හරහා අඛණ්ඩ පිළිගැනීම සහ කාර්ය සාධනය මත පදනම් වූ උස්සවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් ඉහළ කාර්ය සාධනයට වැටුප් වර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය ලබාදීම. • වෘත්තීය ප්‍රගතිය අවස්ථා වැඩිදියුණු කිරීම. • අඛණ්ඩ සේවක සම්බන්ධතාවය පවත්වාගෙන යමින් සමාජ හා සුබසාධන වැඩසටහන් පැවැත්වීම. • සියලු සේවකයන්ගේ කුසලතා වර්ධනය සඳහා සම්පූර්ණ සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් හරහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
ආර්ථික අවදානම්		
අපගේ මූල්‍ය කාර්ය සාධනය රඳා පවතින්නේ සහැල්ලූ සහ බර පිරිපහදු කළ නිෂ්පාදන, බොරතෙල් සඳහා ඇති ඉල්ලුම සහ අපගේ පර්යන්ත මඟින් සපයන සම්බන්ධිත සේවාවන් මතය.	• බොරතෙල් මිලට අනුකූලව සකස් කරන ලද මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීම මඟින් දේශීය ඉන්ධන මිල ගෝලීය වෙළෙඳපල ගතිකත්වයට අනුකූලව පවතින බව සහතික කරයි. මෙම යාන්ත්‍රණය මඟින් ජාත්‍යන්තර වෙළෙඳපොළේ තෙල් බැරලයක මිලෙහි සිදුවන උච්චාවචනයන්ට ප්‍රතිචාර වශයෙන් සිල්ලර මිල ගණන් විනිවිදභාවයකින් යුතුව සකස් කිරීමට ඉඩ සලසයි. • රජයේ මූල්‍ය හා මුදල් ප්‍රතිපත්තිවල සිදුවන වෙනස්වීම්, විශේෂයෙන්ම තීරබදු, බදු සහ පොලී අනුපාත සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. මීට අමතරව, උද්ධමනය සහ බලශක්ති මිලකරණයේ සිදුවන උච්චාවචනයන් ජාතික වෙළෙඳපල පුරා බනිජතෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම සෘජුවම පාලනය කරන තීරණාත්මක සාධක ලෙස ක්‍රියා කරයි.	• ආර්ථික උච්චාවචනයන් හේතුවෙන් ඇතිවන අවදානම් අවම කිරීම සහ අහිතකර වෙළෙඳපොළේ තත්ත්වයන්හිදී ද්‍රවශීලතාවය සහතික කිරීම සඳහා අපි කෙටි කාලීන හා දිගු කාලීන මූල්‍ය උපකරණවලින් සමන්විත උපායමාර්ගික ආයෝජන කළඹක් පවත්වාගෙන යන්නෙමු. • පර්යේෂණාගාර පරීක්ෂණවල තෙවන පාර්ශ්ව ක්‍රියාකරුවන් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් උපකරණ නඩත්තු සේවා සහ කුලී ආදායම් උපරිම කිරීම ඇතුළු අනුබද්ධ සේවා පුළුල් කිරීම මඟින් අපගේ ආදායම් ප්‍රභවය විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. • විදේශ විනිමය සීමා හේතුවෙන් ඇතිවිය හැකි ඉන්ධන සැපයුම් බාධා අවම කිරීම සඳහා රජය බනිජතෙල් අංශය ලිහිල් කිරීමට පියවර ගෙන ඇත. පොද්ගලික පාර්ශවයන්ට වෙළෙඳපලට ඇතුළුවීමට අවසර දීම මඟින් දේශීය සැපයුම් දාම ස්ථාවර කිරීම සහ ජාතික විදේශ විනිමය සංචිත මත ඇති සෘජු පීඩනය අඩු කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණු වේ.
දේශපාලන අවදානම්		
සමාගම ශ්‍රී ලංකාවේ බනිජතෙල් කර්මාන්තය තුළ ක්‍රියාත්මක වන බැවින්, දේශපාලන ගතිකත්වයන් සහ නියාමන වෙනස්කම් ව්‍යාපාර පරිසරයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අතර, ඒ අනුව CPSTL මුහුණ දිය හැකි ප්‍රධාන දේශපාලන අවදානම් පහත පරිදි වේ.	• **නියාමන වෙනස්කම්:** 2002 අංක 33 දරන බනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතට මෑතකදී සිදු කරන ලද සංශෝධනය ශ්‍රී ලංකාවේ බනිජතෙල් අංශය ලිබරල්කරණය (නිදහස්) කිරීම අරමුණු කරගත් වැදගත් ව්‍යවස්ථාදායක සන්ධිස්ථානයක් ලෙස ක්‍රියා කරයි. මෙම ප්‍රතිපත්තිමය වෙනස්වීම වෙළෙඳපල තරගකාරීත්වය වැඩි කිරීමට මඟ පාදන අතර කර්මාන්තයේ පහළ පෙළේ මෙහෙයුම් සඳහා පුළුල් සහභාගීත්වයක් ලබා ගැනීමට අවස්ථාව සලසයි. • **ඉන්ධන මිල පාලනයන්** • **විදේශ විනිමය පාලන:** බාහිර අංශයේ අසමතුලිතතාවයන් හෝ පුළුල් ආර්ථික අස්ථාවරතාවයක් පවතින කාල පරිච්ඡේදවලදී රජය විසින් දැඩි විදේශ විනිමය පාලනයන් ක්‍රියාත්මක කළ හැකිය. එය වැනි ක්‍රියාමාර්ග මඟින් සැලකිය යුතු ද්‍රවශීලතා සීමා පැනවිය හැකි අතර, එමඟින් අත්‍යවශ්‍ය ආනයන සහ ජාත්‍යන්තර ගෙවීම් බැඳීම් සඳහා අවශ්‍ය විදේශ විනිමය සලසා ගැනීමට CPSTL සතු හැකියාවට බාධා එල්ල වේ.	• CPSTL විසින් විස්තීර්ණ සහභාගීත්ව රාමුවක් හරහා දේශපාලන සහ නියාමන අවදානම් සඳහා සක්‍රීයව විසඳුම් ලබා දෙයි. මෙයට රජයේ පාර්ශව කරුවන් සමඟ අඛණ්ඩ සහයෝගීතාවය සහ නියාමන විශිෂ්ටත්වය සඳහා වන නොසැලෙන කැපවීම ඇතුළත් වන අතර, එමඟින් ප්‍රතිපත්තිමය වෙනස්කම් මධ්‍යයේ වුවද ආයතනය ශක්තිමත්ව පවතින බව සහතික කෙරේ. • රජයේ සහ නියාමන ආයතන සමඟ අඛණ්ඩ සහ ක්‍රමවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම මඟින් නීති හා ප්‍රතිපත්ති වෙනස්කම්වලට සමාගම සූදානම් කිරීම. • නියාමන අනුකූලතාව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම. • ව්‍යාපාර ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරීම.

සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
	• **භූ දේශපාලනික ආතතීන්:** ශ්‍රී ලංකාවේ කලාපීය සහ ගෝලීය සම්බන්ධතා බනිජතෙල් සැපයුම් දාමයේ ස්ථායීත්වයට වැදගත් වේ. භූ-දේශපාලන වෙනස්කම් මඟින් ද්විපාර්ශ්වික බලශක්ති ගිවිසුම් සහ මුහුදු මාර්ග ආරක්ෂාවට අදාළ සැපයුම් අවදානම් ඇති විය හැකිය. වෙනස් වන භූ දේශපාලනික ගතිකතාවයන් මඟින් පද්ධතිමය අස්ථාවරත්වයක් ඇති කළ හැකි අතර, එය ද්විපාර්ශ්වික බලශක්ති ගිවිසුම්වලට සහ අපගේ සාගර සැපයුම් මාර්ගවල සමස්ථ ආරක්ෂාවට බලපෑම් එල්ල කරයි.	
සේවක සම්බන්ධතා අවදානම		
අපගේ සේවකයන්ගෙන් ආසන්න වශයෙන් 99%ක් වෘත්තීය සංගමවල (Unionized) සාමාජිකයන් වන අතර, එය සමාගම විසින් සංවිධානය වීමේ නිදහස පිළිගැනීම පිළිබිඹු කරයි. වසර තුළ රාජ්‍ය ආයතන පොෞද්ගලීකරණය කිරීමේ යෝජනා සහ බනිජතෙල් පනතේ සංශෝධනයන් ඇතුළත් පුළුල් ජාතික කරුණු වලට ප්‍රතිචාර වශයෙන් සේවක මූලික විරෝධතා කිහිපයක් පැවැත්විණි.	• වෘත්තීය සංගම් මඟින් සිදුකෙරෙන වැඩ වර්ජන මෙහෙයුම් කටයුතු වලට අනිසි බාධා ඇති කළ හැකිය.	• මෙහෙයුම් ස්ථායීත්වයට බලපාන ගැටලු ඇතිවීමට පෙර ඒවා විසඳා ගැනීම සඳහා, අප වෘත්තීය සංගම් සමඟ සහයෝගී හවුල්කාරිත්වයක් පවත්වාගෙන යාමට සහ විවෘත සන්නිවේදන මාර්ග භාවිතා කිරීමට කැපවී සිටිමු. • ගැටලු හඳුනා ගැනීම සහ විසඳීම සඳහා වෘත්තීය සංගම් නියෝජිතයන් සමඟ නිතර හා ව්‍යුහගත සාකච්ඡා පැවැත්වීම. • සේවකයන්ට තම ගැටලු නිදහසේ ඉදිරිපත් කළ හැකි විවෘත දොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
ස්වාභාවික අනතුරු සහ අවිනිශ්චිතතා		
අපගේ පාලනයන් බැහැර වූ ස්වාභාවික ව්‍යසනයන් සහ වෙනත් අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් අපගේ මෙහෙයුම්වලට බලපෑම් ඇති විය හැකිය.	• ගංවතුර නායයෑම් සහ දරුණු කුණාටු හේතුවෙන් ඇතිවන බාධාවන් • ත්‍රස්තවාදී ක්‍රියා	• හඳුනාගත් ඇතැම් අවදානම්වලට එරෙහිව රක්ෂණ ආවරණ ලබාගෙන ඇත. • ජාතික ආර්ථිකයේ වැදගත් අංශයක් ලෙස, සමාගම සිය තීරණාත්මක මෙහෙයුම් සහ යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා දැඩි ආරක්ෂිත පියවර සහ උසස් පාලන පද්ධති පවත්වාගෙන යයි.
මෙහෙයුම් අවදානම		
මෙහෙයුම් සම්බන්ධ අවදානම් සමාගමට බලපෑම් ඇති කළ හැකිය.	• නළ මාර්ග තුළ අනපේක්ෂිත කාන්දුවීම් හෝ හානි සිදුවීම මෙහෙයුම් ප්‍රමාදයන් ඇති කළ හැකිය. • සැපයුම් යටිතල පහසුකම් හෝ ලෝජිස්ටික් පද්ධතිවල බාධා ඇතිවීම. • අනතුරු සිදුවීම්. • විශාල පරිමාණ ගිනි අනතුරු.	• කාන්දුවීම් සහ හානි අවම කිරීම සඳහා නළ මාර්ග නිතර සේවා කිරීම සහ නඩත්තු කිරීම. • හානිකර බලපෑම් අවම කිරීම සඳහා සේවකයන්ට ප්‍රමාණවත් පුහුණුව ලබාදීමට. • CPSTL සතුව විශේෂ වත්මන් අභ්‍යන්තර ගිනි නිවීමේ ඒකකයක් (In-House Fire Unit) පවත්වාගෙන යාම.

සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
නීතිමය අවදානම		
අපගේ මෙහෙයුම්, නිශ්පාදන ගුණාත්මක ප්‍රමිතීන් සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති හා නියාමනවලට යටත් වේ. බෙදාහැරෙන ඕනෑම නිශ්පාදනයක් අවශ්‍ය ප්‍රමිතීන් සපුරා නොතිබීම සමාගමට වෙළෙඳ නියෝජිතයන්ගෙන් පැමිණිය හැකි ඉල්ලීම් සහ මූල්‍ය වගකීම් ඇති වීමට හේතු විය හැකිය.	• ඉන්ධන සංයුතිය සම්බන්ධ නීතිමය අවශ්‍යතා නිරන්තරයෙන්ම වෙනස් වන අතර, ඒ අනුව අපගේ මෙහෙයුම් ක්‍රියාත්මක වේ. සල්ෆර් ප්‍රමාණය, වාෂ්ප පීඩනය මිශ්‍රණ අනුපාත වැනි ප්‍රධාන ගුණාත්මක පරාමිතීන් සියල්ල නියාමනය හා පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාමට අප දැඩි පාලනයක් පවත්වාගෙන යමු. • නීතිමය නිශ්පාදන ගුණාත්මක ප්‍රමිතීන් උල්ලංඝනය වුවහොත් සමාගමට දැඩි නියාමන දඩ සහ දඩුවම්වලට මුහුණ දීමට සිදුවිය හැකිය. එසේනම්, එය වැනි උල්ලංඝනයන් සමාගමේ සන්නාම වටිනාකමට කෙරෙහි දැඩි අවදානමක් ඇති කරන අතර, එමඟින් කීර්ති නාමයට දිගුකාලීන හානි සිදු වීමට සහ මහජන විශ්වාසය ගිලිහී යාමට ඉඩ ඇත. ප්‍රමිතියෙන් අඩු හෝ නියමිත විශේෂණයන්ට නොගැලපෙන නිශ්පාදන බෙදාහැරීම පාරිභෝගිකයන්ගේ වාහනවලට හානි, එන්ජින් කාර්ය සාධන අඩුවීම හෝ යාන්ත්‍රික දෝෂ ඇති වීමට හේතු විය හැකිය. එය වැනි සිදුවීම් මඟින් සිදු වූ හානි සඳහා විශාල වන්දි හිමිකම්පෑම් වලට සමාගම නිරාවරණය වන අතර, දරුණු කීර්ති නාම හානියක් සහ අහිතකර මහජන ආකල්ප ඇති වීමේ අවදානමක් ද දරයි.	• සියලු බනිජතෙල් නිශ්පාදන සඳහා උසස් විශ්ලේෂණාත්මක පරීක්ෂණ හැකියාවන් භාවිතා කරමින් දැඩි තත්ව සහතික ක්‍රමවේද පවත්වාගෙන යාම සහ සියලු නීතිමය අවශ්‍යතා සපුරාලීමත් සමඟ ඉහළම කර්මාන්ත ප්‍රමිතීන් පවත්වාගෙන යාම අපගේ අරමුණ වේ.
සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම		
පාරිසරික සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගමට සැලකිය යුතු වියදම් සහ වගකීම් දැරීමට සිදුවිය හැකි අතර, මෙම නීති සංකීර්ණ වීම සහ නිතර වෙනස් වීම හේතුවෙන් එය තවදුරටත් අභියෝගාත්මක වේ.	• අපගේ ප්‍රාථමික නිශ්පාදන වල පවතින ඉහළ ප්‍රමාණයේ වාෂ්පශීලී ස්වභාවය හේතුවෙන්, CPSTL හි මෙහෙයුම් අවදානම් කාණ්ඩයකට අයත් වේ. එක් මෙහෙයුම් අසාර්ථක වීමක් මඟින් මහ පරිමාණ ගින්නක් ඇති විය හැකි අතර, එය සමාගමේ යටිතල පහසුකම් අක්‍රීය කරනවා පමණක් නොව ජාතික ආර්ථිකයටද දැඩි බාධාවක් විල්ල කරන ව්‍යසනයකාරී තර්ජනයක් වේ. • අපගේ මූලික ලෝජිස්ටික්ස් (ප්‍රවාහන) සහ ගබඩා කිරීමේ කොටස් මඟින් වාෂ්පශීලී සංයෝග සහ අනෙකුත් අනතුරුදායක ද්‍රව්‍ය වායූන් ලෙස පිටවීමට හේතු විය හැකි බව අපි පිළිගනිමු. උසස් වාෂ්ප ප්‍රතිසාධන පද්ධති සහ පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම මඟින් ඉන්ධන හැසිරවීම හා ප්‍රවාහනයෙන් ඇතිවන පාරිසරික බලපෑම අවම කිරීමට අප උත්සාහ කරමු.	• විශේෂිත ගිනි නිවන ඒකකයක් සහ විස්තීර්ණ ආරක්ෂාව පුහුණු මූලපිරීම් හරහා අපි හදිසි අවස්ථා සූදානම සඳහා ප්‍රමුඛතාවය දෙන්නෙමු. අපගේ වැළැක්වීමේ නඩත්තු රාමුව මඟින් සයිරන්, ජල ඉසින පද්ධති සහ ගිනි නිවීමේ දෘඩාංග නිතිපතා සේවා කිරීම හරහා තීරණාත්මක ජීවිත-ආරක්ෂක උපකරණ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යන බව සහතික කරයි. • පරිසර සුරක්ෂිතතාවයට අප ගේ කැපවීමේ කොටසක් ලෙස, බැහැර කිරීම. • දැඩි තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාවලියක් මඟින් කළමනාකරණය කරමු. මෙය මඟින් අපද්‍රව්‍ය බලයලත් පාර්ශ්වයන් විසින් පරිසරයට හානි නොවන ආකාරයෙන් බැහැරි කිරීම සහ තිරසාර මෙහෙයුම් ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහතික කෙරේ. • අපගේ ජල කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳව අපි දැඩි අධීක්ෂණයක් සිදු කරන අතර, සියලුම බැහැරකිරීම් නිරන්තරයෙන්ම අවශ්‍ය පාරිසරික තත්ත්ව මිණුම් සලකුණු සපුරන හෝ ඒවා ඉක්මවා යන බව සහතික කරමු.

සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
	• අපගේ මෙහෙයුම් ස්වභාවය අනුව බනිජතෙල් හෝ අනතුරුදායක ද්‍රව්‍ය අහඹු ලෙස කාන්දු වීම හා බැඳුණු සහජ අවදානම් වලට අපගේ ව්‍යාපාරය යටත්වේ. එවැනි සිදුවීම් මඟින් අවට ප්‍රදේශ වලට සැලකිය යුතු පාරිසරික බලපෑමක් ඇති කළ හැකි අතර, විස්තීර්ණ පරීක්ෂණ කාන්දුවීම් පාලනය කිරීම සහ පාරිසරික ප්‍රතිසංස්කරණය සඳහා විශාල මූල්‍ය වගකීම් දැරීමට සිදු විය හැකිය. • පාරිසරික, සෞඛ්‍යය සහ ආරක්ෂණ (EHS) නියෝගයන්ට අනුකූල නොවීම අපගේ මෙහෙයුම් වල අඛණ්ඩතාවයට සැලකිය යුතු අවදානමක් ඇති කරයි. එවැනි අසාර්ථකවීම් මඟින් දැඩි නියාමන සම්බාධක පැනවිය හැකිය. එනම් විශාල සිවිල් හෝ අපරාධ දඩ මුදල් අත්‍යවශ්‍ය මෙහෙයුම් බලපත්‍ර අවලංගු කිරීම හෝ අප ගේ මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් සීමා කරන හෝ අත්හිටුවන අධිකරණ නියෝග ඊට ඇතුළත් වේ.	• නිසි කුණු වෙන්කිරීමේ සහ බැහැර කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. • නළ මාර්ග සහ වෙරළින් ඔබ්බෙහි සිදුවන කාන්දුවීම් හැසිරවීම සඳහා මනාව පුහුණු වූ කාර්ය මණ්ඩලයක් යොදවා ඇත.
සයිබර් අවදානම		
අපගේ වත්කම් කළමනාකරණය කිරීමට සහ අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට අපි තාක්ෂණික පද්ධති යෝදා ගන්නෙමු. මෙම පද්ධතිවලට විල්ලවිය හැකි සයිබර් ප්‍රහාරයක් හෝ වෙනත් ආරක්ෂක උල්ලංඝනයක් සිදුවුවහොත්, එමඟින් අපගේ තීරණාත්මක මෙහෙයුම් හෝ මූල්‍ය පාලනයන් අවදානමට ලක්විය හැකි අතර, අපගේ මෙහෙයුම්, වාණිජ ක්‍රියාකාරකම් හෝ මූල්‍ය ක්‍රියාවලීන් අඩාළ වීමට ඉඩ ඇත.	• බාහිර පාර්ශවයන් විසින් සිදු කරනු ලබන සංකීර්ණ ඉලක්කගත ප්‍රහාරවල සිට ලෝක මට්ටමේ අනපේක්ෂිත සිදුවීම්වල අතුරු බලපෑම් දක්වා විවිධ සයිබර් තර්ජන ගැන සක්‍රීය අවධානයෙන් සිටී. • අපගේ ආරක්ෂක රාමුව තුළ, අභ්‍යන්තර අවදානම්ද සහ අහම්බෙන් සිදුවන දත්ත උල්ලංඝන සහ බහු-මාර්ග ප්‍රහාර (Multi-Vector Attacks) ද සැලකිල්ලට ගනු ලැබේ.	• අපි උසස් පරිමිත ආරක්ෂණ සහ දත්ත අහිමි වීම වැළැක්වීමේ (DLP) ප්‍රොටෝකෝල් වලින් සමන්විත ශක්තිමත් සයිබර් ආරක්ෂක රාමුවක් ක්‍රියාත්මක කර ඇත්තෙමු. මෙම බහු-ස්තර උපාය මාර්ගය මඟින් සයිබර් වංචා සහ සේවා ප්‍රතික්ෂේප කිරීමේ (DDoS) ප්‍රහාරවලින් සිදුවන අවදානම් අවම කරන අතරම, ජංගම පර්යන්ත සුරක්ෂිත කරයි. එසේම නිරන්තර පරීක්ෂණ සහ පාලන සත්‍යාපනයන් හරහා සැකකටයුතු ක්‍රියාකාරකම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහතික කරයි. • සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන ආපදා ප්‍රතිසාධනද කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබීම. • උපස්ථ සේවාදායකයක් (Backup Server) සහ ප්‍රතිසාධන සේවාදායකයක් (Recovery Server) පවත්වාගෙන යාම.
තොග, දේපළ සහ උපකරණ ආශ්‍රිත අවදානම්		
ගබඩා කර ඇති නිෂ්පාදනවල පවතින ගිනිගන්නා සුළු (Flammable) ස්වභාවය හේතුවෙන්, රක්ෂණ ආවරණයේ පවතින යම් ප්‍රමාණවත් නොවීමක් හෝ අපහැදිලි බවක් රක්ෂණ සමාගම් විසින් වන්දි හිමිකම්පෑම් ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැකිය.		• ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ (IRCSL) ලියාපදිංචි පිළිගත් සමාගම්වලින් රක්ෂණ ආවරණ ලබා ගැනීම. • CPSTL විසින් ශක්තිමත් රක්ෂණ ප්‍රතිපත්ති මාලාවක් හරහා විස්තීර්ණ අවදානම් හුවමාරු රාමුවක් පවත්වාගෙන යනු ලැබේ. මෙයට ගිනි හා වාණිජ වගකීම් සඳහා ආවරණ, වෙරළින් ඔබ්බෙහි ඇති නළ මාර්ග සඳහා විශේෂ හල් රක්ෂණ, සහ නිෂ්පාදන, ගබඩා යටිතල පහසුකම් සහ විශේෂිත උපකරණ සඳහා පුළුල් ආරක්ෂාව ඇතුළත් වේ.

සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය		
අවදානම	**අවදානමේ විස්තරය**	**අවදානම අවම කිරීමේ උපායමාර්ග**
බනිජතෙල් පර්යන්ත කර්මාන්තයට අදාළ විශේෂිත කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් නොමැති වීම හෝ සීමිත වීම		
බනිජතෙල් තොග කර්මාන්තයට අදාළ විශේෂිත කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් නොමැති වීම හෝ සීමිත වීම.		• දේශීය පාර්ශවයන් වෙත කාර්යයන් බාරදීම මඟින් ඔවුන් ව සංවර්ධනය කිරීම. • දේශීය පාර්ශවයන් සමඟ සන්ධාන හවුල්කරුවන් (Consortium Partners) ලෙස කටයුතු කිරීමට හැකියාව ඇති විදේශීය පාර්ශවයන්ට සහභාගි වීමට අවස්ථාව සලසා දීම.
දේශීය ප්‍රජා සම්බන්ධතා ආශ්‍රිත අවදානම්		
අප මෙහෙයුම් සිදුකරන ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික සංවර්ධනය සවිබල ගැන්වීම සහ ඊට සහයෝගය දැක්වීම සමාගමේ කීර්ති නාමය ශක්තිමත් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.		• ඉහළ මට්ටමේ ප්‍රජා සහභාගිත්වයක් (Community Engagement) පවත්වා ගැනීම සහ අපගේ ප්‍රජාවන් සමඟ අර්ථාන්විත සම්බන්ධතා වර්ධනය කිරීම. • දැනට ක්‍රියාත්මක වන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම.
වංචා සහ නීති විරෝධී ක්‍රියා		
කළමනාකරණ වංචා, සේවක අයථා හැසිරීම් සහ අනෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් ඇතිවීමේ අවදානම		• CPSTL විසින් අපගේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්හි ඵලදායීතාවය පිළිබඳව අපක්ෂපාතී සහතිකයක් ලබා දීම සහ ආයතනික පාලනයේ උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා කැපවූ ස්වාධීන අංශයක් පවත්වාගෙන යෑම. • අභ්‍යන්තර විගණන අංශයේ උපායමාර්ගික අධීක්ෂණය යටතේ සහ අංශ ප්‍රධානීන්ගේ iDU අධීක්ෂණය මත කළමනාකරණය වන පරිදි, සියළුම මෙහෙයුම් ක්‍රියාවලීන් සඳහා පැහැදිලි බලතල පැවරීමේ රාමුවක් අපි ස්ථාපිත කර ඇත්තෙමු. • බාහිර විගණකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය සහ අබණ්ඩතාව ඇගයීමට ලක් කිරීම.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2007 අංක. 7 දරණ සමාගම් පනතට අනුව පිළියෙල කළ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා, සමාගමේ කටයුතු පිළිබඳ වූ වාර්ෂික වාර්තාව පිළිගැන්වීමට ලැබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුට ප්‍රකාශ කරමු.

ප්‍රමුඛ ක්‍රියාකාරිත්වය

සමාගමේ ප්‍රමුඛ ක්‍රියාකාරිත්වය වන්නේ ශ්‍රී ලංකාවේ බනිජතෙල් තොග ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවා ඇති පොදු පරිශීලක පහසුකම සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310 - 8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග, බවුසර් ඇණියෙන් සමන්විත ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරිත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව විසින් තුක්තිවිඳින කොලොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තයන්, දිවයින පුරා පිහිටි තොග ගබඩා හා ඒ ආශ්‍රිත පහසුකම්, කොළඹ වරායේ තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ/හෝ බදු අයිතිය, එකස්ථාන පාවෙන බෝයාවේ සිට මුතුරාජවෙල පර්යන්තය දක්වා වූ කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා නළ මාර්ගයේ සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ පර්යන්ත සහ තොග ගබඩා තුල පිහිටි නළ මාර්ග සහ/ හෝ කාර්යයන් ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත්ය.

මෙහෙයුම් සහ මූල්‍යමය විශ්ලේෂනා සමාලෝචනය

රු.3,840,369,483/-ක ශුද්ධ ලාභයක් සමග රු. 20,520,096,045/-ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

විස්තර	31.12.2025	31.12.2024
ආදායම	20,520,096,045	18,898,875,688
බදුවලට පෙර ලාභය	5,537,001,990	4,998,057,255
බදුවලට පසු ලාභ/අලාභ (PAT)	3,840,369,483	3,381,228,846

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.7,500,000,000/-කි. කොටස් හිමිකාරිත්වයේ බෙදීයාම පහත පරිදි වේ.

සාමාන්‍ය කොටස්	
ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව	500,000,000
ලංකා IOC සමාගම	250,000,000

දේපළ, පිරියත සහ උපකරණ

වසර තුල දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් පිළිබඳ දත්ත මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන - 10 යටතේ දක්වා ඇත.

ලාභාංශ

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා එක් කොටසකට රු. 0.20 ක අන්තර්කාලීන ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද අතර, එය 2025 මැයි 7 දින ගෙවන ලදී. එමෙන්ම, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා එක් කොටසකට රු. 0.32 ක තවත් අන්තර්කාලීන ලාභාංශයක් 2026 පෙබරවාරි 20 දින ප්‍රකාශයට පත් කරන ලදී.

ලාභාංශ ගෙවීමෙන් අනතුරුව සමාගම ධනාත්මක ද්‍රවශීලතා තත්ත්වයක පවතින බව කළමනාකාරිත්වය විසින් තහවුරු කිරීම මත අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට තීරණය කළේය. අන්තර්කාලීන ලාභාංශ ගෙවීම සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ද්‍රවශීලතා සහතිකය 2025 මාර්තු 24 දින ලබාගෙන ඇති අතර, 2026 පෙබරවාරි 20 දින ප්‍රකාශයට පත් කරන ලද මීළඟ අන්තර්කාලීන ලාභාංශ ගෙවීම සඳහා සමාන ද්‍රවශීලතා සහතිකය 2026 අප්‍රේල් 2 දින විගණකාධිපතිවරයාගෙන් ලබාගෙන ඇත.

2025 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරු

2025 දෙසැම්බර් 31 දිනට ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය:

ඩී.ජේ.ඒ.එස්.ද සිල්වා රාජකරුණා මහතා
ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා
දීපක් දාස් මහතා
ඩබ්.එස්.එච්. කුමාර මහතා
ඒ. සිංහාල් මහතා
එස්.කේ. මහාරණ මහතා
එච්.ටී.පී. චන්දන මහතා
සමන්ත බණ්ඩාර මහතා

අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්

අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්, මූල්‍ය ප්‍රකාශනයේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

සම්බන්ධතා ලේඛනය

2007 අංක. 07 දරණ සමාගම් පනත අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වා ගනියි. 2007 අංක. 07 දරණ සමාගම් පනතෙහි 192(2) දරණ වගන්තිය අනුව සියලු අධ්‍යක්ෂවරු ප්‍රකාශ නිකුත් කොට ඇත. අදාල දත්ත සමාලෝචිත වර්ෂය තුල සම්බන්ධතා ලේඛනයට ඇතුලත් කොට ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම

සමාගම රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලු ව්‍යවස්ථානුකූල ගෙවීම් තම අවබෝධයට අනුව මේ දක්වා ගෙවා ඇති බවට හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත.

අඛණ්ඩ පැවැත්ම

සිය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. අඛණ්ඩ පැවැත්මේ පදනම මූල්‍ය වාර්තා සැකසීමට යොදාගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරයි.

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇතිකරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක. 22 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් නොමැත.

විගණකවරු

19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව, සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ විගණන කටයුතු ජාතික විගණන කාර්යාලය විසින් සිදුකරන ලදී. විගණකවරුන්ට සිදුකළ ගෙවීම් මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

විගණකවරුන්ට සමාගම හෝ සමාගම් සමූහය සමග කිසිදු සම්බන්ධයක් (විගණකවරයෙක් වශයෙන් හැර) නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධයයි. ඔවුන් වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආචාර ධර්ම මාලාවට අනුකූල බවත්, ස්වාධීන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන්

සභාපති

අධ්‍යක්ෂ

DELOITTE CORPORATE SERVICES (PRIVATE) LIMITED
PV 4150

DIRECTOR / COMPANY SECRETARY

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඩිලොයිට් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) යනු අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ විධිමත් ලෙස පිහිටුවා ඇති අනුකමිටුවකි. එය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර වගවීමට බැඳී සිටී. විගණන සහ කළමනාකරණ කමිටුවේ මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහ විශ්වාසනීයත්වය සහතික කරන අතරම සමාගමේ පාලන ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය ක්‍රියාත්මක කිරීම, ගැටළු විසඳීම සහ සහාය වීමයි. එය ජාත්‍යන්තර හොඳම භාවිතයන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිර්වචනය කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අදාළ දේශීය නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කරයි.

සංයුතිය

2025 පෙබරවාරි මස 20 වන දින දක්වා CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන පහත සඳහන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් 02 දෙනෙකුගෙන් සමන්විත විය.

- එස් හේමන්ත විජිත කුමාර මහතා - සභාපති
- ඒ. සිංහාල් මහතා - සාමාජික

2025 ජූලි මස 28 වන දින සිට පහත සඳහන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුව නියෝජනය කළහ.

- ආර්.වීම්.වීස්.පී.වීස්. බණ්ඩාර මහතා - සභාපති
- වීච්.ටී.පී. චන්දන මහතා - සාමාජික
- ඒ. සිංහාල් මහතා - සාමාජික

විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යයන්

ක්‍රියාවලීන්ගේ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය වාර්තාකරණයේ සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයන්හි අනුකූලතාව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සමපාත වීම කමිටුව සමාලෝචනය කරයි. එමෙන්ම සමාගමේ මූල්‍ය වාර්තාකරණයට අනුකූල වීමේ අවශ්‍යතාව, සමාගම් පනතට අදාළ තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණයට අදාල රෙගුලාසි සහ අවශ්‍යතා කමිටුව සමාලෝචනය කරයි. තවද කමිටුව අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව ද, ස්වාධීනත්වය සහ බාහිර විගණකවරුන්ගේ කාර්ය සාධනය ද තක්සේරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම ද කමිටුව සමාලෝචනය කරයි. එසේම සමාගම අවදානමකට නිරාවරණය වී ඇත්නම් වීවා කළමනාකරණය කිරීම සහ වීවැනි අවදානම් වලින් පැන නගින බලපෑම අවම කිරීම සඳහා සමාගම විසින් ගත යුතු ක්‍රියාමාර්ග ද යෝජනා කරයි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යාංශය, කළමනාකාර (අභ්‍යන්තර විගණන) වෙනුවට 2025 වර්ෂයේ සිට මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය අභ්‍යන්තර විගණන කළමනාකාර ඒ.ආර්. සේරසිංහ මහතා (CBA, DISSCA) විසිනි. අභ්‍යන්තර විගණන කණ්ඩායමට මූල්‍ය, තොරතුරු තාක්ෂණය, තොරතුරු ආරක්ෂාව, වංචා විමර්ශනය ඇතුළු විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ සම්මිශ්‍රණයක් ඇති අතර, කාර්යාංශය විසින් අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ ගෝලීය හොඳම භාවිතයන් යොදා ගනී.

වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මෙන් ම පද්ධතිය මත විශ්වාසය තැබිය හැකි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ සඵලතාවය තක්සේරු කිරීමට අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂය පථය සහ ආවරණය විගණන සහ කළමනාකරණ කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යාංශය සමාගම තුළ ස්ථාපිත කර ඇත. ක්‍රියාත්මක වෙමින් පවතින විගණන නිර්දේශ තහවුරු කර ගැනීමට වරින් වර පසු විපරම් සමාලෝචන සැළසුම් කර ඇත.

අවදානම් පාදක අභ්‍යන්තර විගණනය යනු 2018 දී අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් කිරීම සඳහා අලුතින් හඳුන්වා දුන් ප්‍රවේශයකි. අවදානම් ශ්‍රේණිගත කිරීම තුලින් වීවැනි ගැටළු කෙරෙහි ක්ෂණික පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය තුළ වැඩි අවධානයක් යොමු කරවයි. අභ්‍යන්තර විගණන ප්‍රඥාප්තිය මගින් අභ්‍යන්තර විගණන විෂය පථය පාලනය කෙරෙයි.

ව්‍යවස්ථාපිත විගණනය

කමිටුව, 2018 ජාතික විගණන පනතට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂය පථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ විගණකවරුන් සමග ද සාකච්ඡා කරයි. මතුවන ලද ගැටළුවලට සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සඵලතාවයට කළමනාකාරිත්වය ගනු ලබන පියවර ද සාකච්ඡා කෙරෙයි.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා ඇත.

වසර තුළ විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් පහතින් සටහන් වේ.

අනු අංකය	දිනය	කමිටුවේ ශක්තිය	සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව	සාමාජිකයින්ගේ නම්
01.	20.02.2025	02	02	එස්. හේමන්ත විජිත කුමාර මහතා - සභාපති ඒ. සිංහාල් මහතා - සාමාජික ඒ.ඒ.එස්. ප්‍රේමජයන්ත මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය) කේ. එච්. රණවක ආරච්චිගේ මිය (නිරීක්ෂක - බලශක්ති අමාත්‍යාංශය)
02.	28.07.2025	03	03	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - සභාපති එච්.ටී.පී. චන්දන මහතා - සාමාජික ඒ. සිංහාල් මහතා - සාමාජික ඒ.ඒ.එස්. ප්‍රේමජයන්ත මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය) කේ. එච්. රණවක ආරච්චිගේ මිය (නිරීක්ෂක - බලශක්ති අමාත්‍යාංශය)
03.	03.11.2025	03	03	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - සභාපති එච්.ටී.පී. චන්දන මහතා - සාමාජික ඒ. සිංහාල් මහතා - සාමාජික ඒ.ඒ.එස්. ප්‍රේමජයන්ත මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය) කේ. එච්. රණවක ආරච්චිගේ මිය (නිරීක්ෂක - බලශක්ති අමාත්‍යාංශය)

විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාවට නැඟිය හැකි උපායමාර්ගික කරුණු හා සබැඳි තීරණගණනාවක් සහ නිර්දේශ කිහිපයක් විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කර ඇත.

- කළමනාකාරිත්වය සමඟ, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් සමඟ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනයන්හි විනිවිදභාවය, අවබෝධය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම මගින් මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- සිදු කරන ලද සහ සවිස්තරාත්මක විශ්ලේෂණය සහ අධ්‍යනයන්වලින් අලාභය සඳහා හේතු සහ බලපෑම් හඳුනා ගැනීම සහ වහාම අදළ අංශයන්හි අලාභ මගහැරවීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම.
- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකිය යුතු විගණන සොයාගැනීම් සහ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම.
- විස්තීරණ සහ අඛණ්ඩ ලෙස අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහතික කිරීමෙන් පිළිගත හැකි මට්ටමට අවදානම අවම කිරීම.
- ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහිත පුළුල් කැපවීමක් ඇති සංවිධානයක් ඉහළ ස්ථරයෙහි නිර්මාණය කිරීම.
- නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, ආචාර ධර්ම, විෂමාචාර හෝ වංචා විමර්ශනය සම්බන්ධ ආයතනික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- පවත්නා තත්ත්වය, ප්‍රගතිය සහ නව ප්‍රවණතා මෙන් ම ගැටළු සහිත කරුණු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ අඛණ්ඩව සන්නිවේදනය කිරීම.

ආයතනික කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුවේ ප්‍රධාන නිර්දේශ

- ඉඩම් සහ ගොඩනැගිලි හැර අනෙකුත් වත්කම් නැවත තක්සේරු කිරීම පිළිබඳ විගණකාධිපති වාර්තාවේ දීර්ඝකාලීන විගණන නිරීක්ෂණයට විසඳුම් සෙවීම සඳහා, රු. 50,000/-ට අඩු වත්කම් නැවත තක්සේරු නොකළ යුතු බවත්, ඒ වෙනුවට ඉදිරි වසර දෙක තුන තුළ සැලසුම් කළ වත්කම් සත්‍යාපන වැඩසටහනක් යටතේ භෞතික සත්‍යාපනයට යටත් විය යුතු බවත් කමිටුව නිර්දේශ කළේය.
- වාහන බැහැර කිරීම සම්බන්ධ කරුණු විසඳීම සඳහා විධිමත් වාහන බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ වත්කම් ලේඛනය කාලෝචිත ලෙස යාවත්කාලීන කිරීම කමිටුව නිර්දේශ කළේය.



ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

තිරසාරභාවය පිළිබඳ දළ විශ්ලේෂණය

තිරසාරත්වය පිළිබඳව දළ විශ්ලේෂණය ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරසරික අනාගතය වෙනුවෙන් වගකිවයුතු බලශක්ති කළමනාකරණය සතු තීරණාත්මක කාර්යභාරය හඳුනාගනිමින් ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සිය ප්‍රධාන මෙහෙයුම් සඳහා තිරසාර භාවිතයන් ඒකාබද්ධ කිරීමට නිරන්තරයෙන් කැපවී සිටියි. අපගේ තිරසාරත්ව ප්‍රවේශය මෙහෙයුම් කාර්යක්ෂමතාවය, පාරසරික භාරකාරත්වය සහ සමාජීය වගකීම මත පදනම් වන අතර එමඟින් පාර්ශවකරුවන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීම සහතික කරයි.

දර්ශකය	ඒකක	2025	2024	%
මුළු ඉන්ධන ප්‍රමාණය	KL	4,756,164	4,404,557	7.98%
ශක්ති පරිභෝජනය	kWh	4,417,848	4,683,218	-5.67%
ජල පරිභෝජනය	KL	177,245	177,054	0.11%
ආරක්ෂාව සේවක පුහුණු පැය	පැය	7,553	4,424	70.73%

පාරිසරික වගකීම

පාරිසරික වගකීම වාර්තාකරණ කාලසීමාව තුළ, CPSTL ආයතනය පාරිසරික බලපෑම් අවම කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් තම පාරිසරික කළමනාකරණ පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කළේය. ඉන්ධන ගබඩාකරණ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම වායුවිමෝචන අවම කිරීම සහ ජාතික නියාමක ප්‍රමිතීන්ට අනුකූල වන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වැඩසටහන් අතර විය.

එසේම සියලුම ටර්මිනල් මෙහෙයුම්වලදී ආරක්ෂක සහ පාරිසරික මාර්ගෝපදේශයන්ට දැඩි ලෙස අනුගත වීම තහවුරු කරමින් ඉන්ධන කාන්දුවීම් වැළැක්වීම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා ඇති සූදානම ද ආයතනයේ ප්‍රමුඛ අවධානයක් විය.

බලශක්ති කාර්යක්ෂමතාව හා සම්පත් කළමනාකරණය

CPSTL ආයතනය සිය පහසුකම් පුරා බලශක්ති ප්‍රශස්තකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීයව කටයුතු කළේය. ඒ අතර,

- බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා උපකරණ නවීකරණය කිරීම.
- ඉන්ධන අලාභ නිරීක්ෂණය කිරීම සහ ප්‍රතිසාධන පද්ධති වැඩිදියුණු කිරීම.
- මෙහෙයුම් කටයුතු තුළ ජලය හා විදුලිය වගකීමෙන් යුතුව භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම ඇතුළත් විය.

මෙවැනි වැඩසටහන් මඟින් මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට දායක වූ අතර ජාතික තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ද සහය විය.

සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසරය (HSE)

සෞඛ්‍යය ආරක්ෂාව සහ පාරිසරික ආරක්ෂාව CPSTL ආයතනයේ මෙහෙයුම් දර්ශනයේ මූලික අංගයන් ලෙස පවතී. ආරක්ෂිත සේවා පරිසරයක් පවත්වාගෙන යාම සඳහා නිතිපතා ආරක්ෂක විගණන, සේවක පුහුණු වැඩසටහන් සහ හදිසි අවස්ථා සඳහා සූදානම් වීමේ අභ්‍යාස ක්‍රියාත්මක කරන ලදී. CPSTL තම සේවකයන්ගේ, වත්කම්වල සහ අවට ප්‍රජාවන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව ආරක්ෂා කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබා දෙයි. මෙහෙයුම් අවදානම් කල්තියා හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රවේශයක් අනුගමනය කරමින් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි.

- ආරක්ෂිත මෙහෙයුම් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ උපකරණ සහ වැඩ පද්ධති නිසි පරිදි සැපයීම නඩත්තු කිරීම සහ ඒවායේ විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- බනිජතෙල් නිශ්පාදන ආරක්ෂිතව හැසිරීවීම, ගබඩාකිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා දැඩි ක්‍රියාපටිපාටි හා කර්මාන්තයේ හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීම.
- ශක්තිමත් ආරක්ෂක සංස්කෘතියක් සහ මෙහෙයුම් පිළිබඳ දැනුවත්භාවයක් ප්‍රවර්ධනය කිරීම සඳහා සේවකයන්ට ප්‍රමාණවත් පුහුණුව තොරතුරු සහ අධීක්ෂණය ලබා දීම.
- සේවක සුබසාධනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ආරක්ෂිත සනීපාරක්ෂක සහ සුදුසු සේවා පරිසරයක් පවත්වාගෙන යාම.
- සෞඛ්‍ය හා ආරක්ෂක අවදානම් අවම කිරීම සඳහා ඇතිවිය හැකි අනතුරුදායක තත්ත්වයන් ක්‍රමානුකූලව හඳුනාගෙන වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

ප්‍රජා සහභාගීත්වය සහ සමාජ වගකීම

ප්‍රජා සම්බන්ධතා හා සමාජ වගකීම CPSTL තම මෙහෙයුම් සිදුකරන ප්‍රදේශවල ප්‍රජාවන් වෙත ඇති වගකීම හඳුනාගෙන කටයුතු කරයි. වාර්තාකරණ වර්ෂය තුළ, සමාගම පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළේය.

- ප්‍රජා සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනයට සහය වීම.
- පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- බලශක්ති ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජාතික ප්‍රයත්නයන්ට සහය වීම.

මෙවැනි උත්සාහයන් CPSTL ආයතනය වගකීම් සහිත ආයතනික පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමට දක්වන කැපවීම පිළිබිඹු කරයි.

පාලනය හා අනුකූලතාව

CPSTL ආයතනයේ තිරසාරත්වය ශක්තිමත් පාලන ක්‍රියාපටිපාටි සහ නියාමක රාමු වලට අනුකූලතාව මත පදනම් වේ. සියලුම මෙහෙයුම්වලදී විනිවිදභාවය ආචාරධර්මීය හැසිරීම සහ වගවීම තහවුරු කරන අතර ජාතික ප්‍රතිපත්ති සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුගතව කටයුතු කරයි.

අනාගත දැක්ම

ඉදිරියට CPSTL ආයතනය තම උපායමාර්ගික රාමුව තුළ තිරසාරත්වය තවදුරටත් අන්තර්ගත කිරීමේ අරමුණින් පිරිසිදු බලශක්ති ක්‍රියාපටිපාටිවල ඩිජිටල් නිරීක්ෂණ පද්ධති සහ වැඩිදියුණු කළ පාරිසරික ආරක්ෂණ ක්‍රමවේද සොයා බලයි. ශ්‍රී ලංකාවේ වඩාත් තිරසාර සහ ප්‍රතිරෝධී බලශක්ති ක්ෂේත්‍රයක් වෙත සංක්‍රමණය වීමට සහය වීමට සමාගම තම කැපවීම තහවුරු කර ඇත.

අභ්‍යන්තර පාලන ඇගයීම් වාර්තාව

අරමුණ

CPSTL හි අභ්‍යන්තර විගණන කාර්යාංශය, විගණන හා කළමනාකරණ කමිටුවට සහ කළමනාකාරිත්වයට ආයතනික පාලනය (Governance), අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්හි ප්‍රමාණවත්කම හා කාර්යක්ෂමතාව පිළිබඳ ස්වාධීන හා පක්ෂපාතීත්වයෙන් තොර සහතිකයක් ලබා දීම අරමුණු කරයි. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියට (Internal Audit Charter) අනුව, මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය, මෙහෙයුම් කාර්යක්ෂමතාව, අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව සහ ආයතනික වත්කම් ආරක්ෂා කිරීම ඇගයීම මඟින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම කාර්යය දායක වේ.

එමෙන්ම, පාලන දුර්වලතා හඳුනා ගැනීම, ඒවා වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වීම, අධීක්ෂණය කිරීම තුළින් ආයතනික පාලනය ශක්තිමත් කිරීම සඳහාද අභ්‍යන්තර විගණනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සාම්ප්‍රදායික මූල්‍ය විගණනයට අමතරව, මෙහෙයුම්, පද්ධති සහ අවදානම් පදනම් කරගත් සමාලෝචන සිදු කිරීම මඟින් ආයතනයේ සියලුම ක්‍රියාකාරී අංශ සඳහා වටිනාකමක් එක් කරයි.

විෂය පථය

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ CPSTL හි ප්‍රධාන ක්‍රියාකාරී අංශ සියල්ලම අභ්‍යන්තර පාලන ඇගයීමට ඇතුළත් කරන ලදී. මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතා සහ පද්ධති සම්බන්ධ ක්‍රියාවලීන් මෙන්ම මූල්‍ය, මානව සම්පත්, ඉංජිනේරු, බෙදාහැරීම්, නීති සහ තොරතුරු තාක්ෂණ පද්ධති (SAP ERP ඇතුළුව) යන අංශද මෙහිදී සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියට අනුකූලව, ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය, මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම, මෙහෙයුම්වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඇගයීම, නීතිමය හා නියාමන අනුකූලතා සමාලෝචනය, වත්කම් ආරක්ෂා කිරීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඇගයීම සිදු කරන ලදී. මීට අමතරව, පෙර විගණනවලදී හඳුනාගත් කරුණු සම්බන්ධයෙන් පසු විපරම් සමාලෝචනද ක්‍රියාත්මක කරන ලදී.

විගණන ප්‍රවේශය

අභ්‍යන්තර විගණන කාර්යය ව්‍යුහගත අවදානම් පදනම් කරගත් විගණන ප්‍රවේශයක් අනුගමනය කළේය. වාර්ෂික විගණන සැලැස්ම අවදානම් ඇගයීම් මත සකස් කර විගණන කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

විගණන ක්‍රමවේදය යටතේ පද්ධති සමාලෝචන, ගනුදෙනු පරීක්ෂණ, SAP දත්ත විශ්ලේෂණය, නියැදි පදනම් කරගත් තහවුරු කිරීම්, භෞතික පරීක්ෂණ, අනුකූලතා පරීක්ෂණ සහ අඛණ්ඩ පසු විපරම් සිදු කරන ලදී. සිය කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය තහවුරු කරමින් අවශ්‍ය සියලුම පද්ධති සහ තොරතුරු වෙත සීමාවකින් තොර ප්‍රවේශය පවත්වාගෙන යන ලදී.

වර්ෂය තුළ සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම්

- අනුමත වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා විගණන පැවැත්වීම.
- ප්‍රධාන ක්ෂේත්‍රවල අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම.
- නිර්දේශ සහිත විගණන වාර්තා නිකුත් කිරීම.
- වැදගත් විගණන නිරීක්ෂණ (Significant Audit Findings – SAF) අධීක්ෂණය කිරීම.
- SAP පද්ධති සමාලෝචන සහ දත්ත වලංගුභාවය තහවුරු කිරීම.
- වත්කම් සහ තොගවල භෞතික සත්‍යාපනය සිදු කිරීම.
- විශේෂ විමර්ශන සහ උපදේශන සේවා සැපයීම.
- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.

නිගමනය

සිදු කරන ලද විගණනවල ප්‍රතිඵල අනුව, CPSTL ආයතනයේ ප්‍රතිපත්ති හා පද්ධති මඟින් සහාය දක්වන මධ්‍යස්ථ මට්ටමේ අභ්‍යන්තර පාලන රාමුවක් ස්ථාපිත කර ඇත. කෙසේ වෙතත්, සමස්ත පාලන පරිසරය සාධාරණ ලෙස ඵලදායී බවට තක්සේරු කර ඇති අතර, පද්ධති ඒකාබද්ධ කිරීම, පාලන ක්‍රමවල අනුකූලතාව සහ දත්ත නිරවද්‍යතාව තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

ලැබිය යුතු මුදල් කළමනාකරණය, වත්කම් කළමනාකරණය, වැටුප් පරිපාලනය, SAP පද්ධතියේ ප්‍රශස්ත භාවිතය සහ අනුකූලතා ක්ෂේත්‍රයන්හි ප්‍රධාන පාලන හිඩැස් නිරීක්ෂණය විය. එමෙන්ම, මෙහෙයුම් අකාර්යක්ෂමතා සහ අතින් සිදු කරන ක්‍රියාවලීන් මත පවතින යැපීම හේතුවෙන් වඩාත් කාර්යක්ෂම සැලසුම්කරණය හා ස්වයංක්‍රීයකරණය අවශ්‍ය බවද අනාවරණය විය.


නිර්දේශයන්හී ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීම, SAP පද්ධතිය වැඩිදියුණු කිරීම, අංශ අතර සම්බන්ධීකරණය ඉහළ නැංවීම, සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs) විධිමත් කිරීම සහ වගකීම් සහගතභාවය වැඩි කිරීම කෙරෙහිය. අභ්‍යන්තර පාලන පරිසරය තවදුරටත් ශක්තිමත් කිරීම සහ ආයතනික අරමුණු සාර්ථක කර ගැනීම සඳහා නිර්දේශ අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

(අත්සන් කළේ)

අභ්‍යන්තර විගණන කළමනාකාර

මූල්‍ය ප්‍රකාශන





විගණන වාර්තා



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ENR/C/CPSTL/AR/2025
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 19 June 2026

සභාපති
ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික සහ නියාමන නිර්දේශ හා බැඳී විගණකාධිපතිවරයාගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කල මතය

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (සමාගම) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත, 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන අනුව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම පේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2025 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 16) දේපළ, පිරියත හා උපකරණ හි 36 වන ඡේදයට අනුව, යම් වත්කමක් ප්‍රතිතක්සේරු කරනු ලබන්නේ නම්, එයට අයත් සමස්ත වත්කම් පන්තියම ප්‍රතිතක්සේරු කළ යුතුය. එසේ වුවද, ඉඩම්, ගොඩනැගිලි සහ ගබඩා ටැංකිවලින් සමන්විත රු. මිලියන 154.97ක එකතුවන දරන අගයක් සහිත වත්කම් ප්‍රතිතක්සේරු කර නොතිබුණි. තවද, ප්‍රතිතක්සේරු කිරීමෙන් බැහැර කරන ලද එම වත්කම්වල ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 37) ප්‍රතිපාදන, අනාගත වගකීම් සහ අනාගත වත්කම් හි 28 සහ 86 වන ඡේදවලට අනුව, ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් පිටතට ගලා යාමේ හැකියාව ඉතා අවම වන අවස්ථාවන් හැර, අනාගත වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. එසේ වුවද, සමාගම විසින් 2010 සිට 2025 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ටැංකි දෙකක් විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව භාවිත කර තිබූ බව නිරීක්ෂණය විය. සිදුකරන ලද ඇගයීම අනුව, 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව සඳහා රු. මිලියන 251.4ක කුලී වගකීමක් හඳුනාගෙන තිබුණද, LKAS 37 හි අනාවරණ අවශ්‍යතාවලට පටහැනිව එම අසම්භාව්‍ය වගකීම අනාගත වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 01 හි 17(සි) ඡේදයට අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) හි නිශ්චිත අවශ්‍යතාවලට අනුකූල වීම පමණක් ආයතනයේ මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්යසාධනය කෙරෙහි විශේෂ ගනුදෙනු, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන්ගෙන් ඇතිවන බලපෑම පරිශීලකයන්ට ප්‍රමාණවත් ලෙස අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, අතිරේක අනාවරණයන් සිදු කළ යුතුය. එසේ වුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු. මිලියන 10,753ක සෘජු වියදම් හඳුනාගැනීමේදී, සමාගම විසින් එම වියදම් වාර්ෂික මුළු වියදමෙන් ප්‍රතිශතයක් ලෙස හඳුනාගෙන තිබූ අතර, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සෘජුවම අදාළ වන වියදම් වෙනම හඳුනාගෙන නොතිබුණි. තවද, එම සෘජු වියදම් හඳුනාගැනීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) 2025 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමට ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) වෙතින් අයවිය යුතු මුදල රු. මිලියන 13,110.64ක් විය. එහෙත්, CPC විසින් තහවුරු කර එකඟ වී තිබූ ශේෂය රු. මිලියන 12,376.60ක් වූ බැවින්, තහවුරු නොකළ ශේෂය රු. මිලියන 734.04ක් විය. එමෙන්ම, මෙම තහවුරු නොකළ ශේෂයන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සැකයක් පවතින බව නිරීක්ෂණය විය. තවද, මෙම ලැබිය යුතු ශේෂයන්ගේ කාල විශ්ලේෂණය (Ageing Analysis) අනුව, වසර 5 සිට 11 දක්වා කාලයක් ඉක්මවා පැවති රු. මිලියන 981.29ක දිගුකාලීන ලැබිය යුතු ශේෂ පවතින බව නිරීක්ෂණය විය. එසේ වුවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 9 හි අවශ්‍යතාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ එම ලැබිය යුතු මුදල් සඳහා හානි අලාභ ප්‍රතිපාදනයක් (Impairment Provision) හඳුනාගෙන නොතිබුණි.

(ඉ) ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම. රු. මිලියන 3,313.98ක සෘජු පුද්ගල පිරිවැය සහ රු. මිලියන 3,790.83ක පුද්ගල පිරිවැය සම්බන්ධයෙන් වැටුප් ලේඛන, දීමනා අනුමැතියට අදාළ ලේඛන සහ අතිකාල (OT) ගණනය කිරීම් ඇතුළු උපකාරක ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වියදම් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuSs) අනුව විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිති යටතේ මාගේ වගකීම්, මෙම වාර්තාවේ "මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්" යන කොටසේ වැඩිදුරටත් විස්තර කර ඇත. මා විසින් ලබාගත් විගණන සාක්ෂි, මාගේ තත්ත්වගත විගණන මතයට පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් හා සුදුසු බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2025 වාර්ෂික වාර්තාවට ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු ලෙස අදහස් කරන්නේ සමාගමේ 2025 වාර්ෂික වාර්තාවට ඇතුළත් වන, නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණන වාර්තාව ඇතුළත් නොවන තොරතුරුය. මෙම විගණන වාර්තාවේ දිනයට පෙර එම අනෙකුත් තොරතුරු මා විසින් ලබාගෙන ඇත. අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් වගකීම කළමනාකාරිත්වය සතු වේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් ප්‍රකාශ කර ඇති විගණන මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සහතික කිරීමේ නිගමනයක් මා විසින් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත සඳහන් අනෙකුත් තොරතුරු ඒවා ලබාගත හැකි වන විට කියවා, එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී මා ලබාගත් දැනුම සමඟ සැලකිය යුතු ලෙස නොගැළපේද, නැතහොත් ඒවායේ සැලකිය යුතු වැරදි ප්‍රකාශනයක් පවතින බවක් පෙනී යන්නේද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනයට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් මා විසින් සිදු කළ කාර්යය මත පදනම්ව, එම අනෙකුත් තොරතුරුවල සැලකිය යුතු වැරදි ප්‍රකාශනයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, ඒ පිළිබඳව වාර්තා කිරීම මාගේ වගකීම වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කිසිවක් නොමැත.

1.4. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ සහ පාලනය සඳහා වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහාත්, වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් ඇතිවිය හැකි සැලකිය යුතු වැරදි ප්‍රකාශනයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකි වන පරිදි කළමනාකාරිත්වය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම සඳහාත් වගකීම කළමනාකාරිත්වය සතු වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සමාගම අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව ඇගයීම, අදාළ අවස්ථාවන්හිදී අඛණ්ඩ ව්‍යාපාර සම්බන්ධ කරුණු අනාවරණය කිරීම සහ සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට කළමනාකාරිත්වය අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති අවස්ථාවක හැර, අඛණ්ඩ ව්‍යාපාර පදනම මත ගිණුම්කරණය සිදු කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකිව යුතුය.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම පාලනය සඳහා වගකිව යුතු පාර්ශවයන් සතු වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුව, සමාගමට අදාළ වාර්ෂික සහ කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකි වන පරිදි, සමාගමේ සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධ නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාමට සමාගම බැඳී සිටී.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙහි ලා විගණකවරයාගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පදනම් වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීමේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

වෙනත් කරුණුද සමඟ, මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලන දුර්වලතා ඇතුලත්ව, විගණනයේදී සොයා ගනු ලබන සුවිශේෂී කරුණු පාලනයට සම්බන්ධ පාර්ශව වෙත සන්නිවේදනය කරන ලදී.

2. අනෙකුත් නෛතික හා නියාමන නිර්දේශ මත වන වාර්තාව

2.1. පහත අවශ්‍යතා සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනත, සහ 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසෙහි විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීමේ මා ලබා ගත්තෙමි. මගේ නිරීක්ෂණයට පෙනෙන ආකාරයට, වර්ෂ 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ නිර්දේශවලට අනුව සමාගම් විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඩී)(iii) වගන්තියේ අවශ්‍යතාවය අනුව, පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුකූල වන අතර, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කිරීමේ පදනම යන කොටසේ විස්තර කර ඇති 1.2 දරණ විගණන කරුණු හැර අනෙකුත් කරුණු සඳහා එය අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඩී)(iv) වගන්තියේ අවශ්‍යතාවය අනුව, පෙර වර්ෂයේ මා විසින් ඉදිරිපත් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් කර ඇති අතර, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කිරීමේ පදනම යන කොටසේ විස්තර කර ඇති 1.2.(ඊ) දරණ විගණන කරුණ හැර අනෙකුත් නිර්දේශ ඇතුළත් කර ඇත.

2.2 මා විසින් සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, ඒවා වැදගත් වන කරුණු සඳහා පමණක් සීමා වූ බැවින්, මාගේ අවධානයට කිසිදු කරුණක් යොමු වී නොමැත;

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඩී) වගන්තියේ අවශ්‍යතාවය අනුව, සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බැහැරව සමාගම විසින් ඇතුළත් කර ඇති කිසියම් ගිවිසුමකට අදාළව සමාගමට සෘජු හෝ වක්‍ර උනන්දුවක් පවතින බව ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි කිසිදු කරුණක් අනාවරණය වී නොමැත.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(එෆ්) වගන්තියේ අවශ්‍යතාවය අනුව, සමාගම පාලනය කරන ආයතනය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ නියෝගයන්ට සමාගම අනුකූල නොවී ඇති බව ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි කිසිදු කරුණක් අනාවරණය වී නොමැත, පහත සඳහන් කරුණු හැර;

නීති/රෙගුලාසි සඳහා යොමුව	විස්තරය
ඒ. රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ චක්‍රලේඛය සහ 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 70 වන වගන්තිය (i) 5.3 වගන්තිය	ශක්‍යතා පරීක්ෂණය (Solvency Test) සපුරාලීමෙන් අනතුරුව, බදු ගෙවීමෙන් පසු ලැබෙන ශුද්ධ ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් (30%) ඒකාබද්ධ අරමුදලට/කොටස් හිමියන් වෙත ලාභාංශ ලෙස බෙදා හැරිය යුතු බව අපේක්ෂා කෙරේ. එසේ වුවද, 2024 වර්ෂයේදී රු. මිලියන 100 ක් සහ 2025 වර්ෂයේදී රු. මිලියන 160 ක් පමණක් ලාභාංශ ලෙස ගෙවා ඇති අතර, ගෙවිය යුතු ලාභාංශ ප්‍රමාණයන් පිළිවෙළින් රු. මිලියන 1,014.3 ක් සහ රු. මිලියන 1,152.1 ක් විය. ඒ අනුව, සමස්තයක් ලෙස රු. මිලියන 1,906.4 ක මුදලක් ලාභාංශ ලෙස ගෙවා නොමැති බව නිරීක්ෂණය විය.

(ii) 1 වගන්තිය	සමාගම සතු පවතින ආයතනික පාලන ව්‍යුහය සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා නිකුත් කර ඇති මෙහෙයුම් අත්පොතෙහි නිර්දේශිත රාමුව අතර අනුකූලතාවය ඇගයීම සඳහා පරතර විශ්ලේෂණයක් (Gap Analysis) සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නිර්දේශිත යහපාලන ක්‍රියාපටිපාටිවලින් සිදුවන වෙනස්කම් හඳුනා නොගෙන සහ ඒවාට අවශ්‍ය පිළියම් නොයොදා පැවතිය හැකි අතර, එය සමාගමේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ සමස්ත ආයතනික පාලන ක්‍රියාවලියේ ඵලදායීතාවයට බලපෑම් ඇති කළ හැකිය.
ඛී. 2021 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තිය සහ 2023 සැප්තැම්බර් 27 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද PED 01/2021(iii) චක්‍රලේඛයට අනුව සංශෝධනය කර ඇත.	සියලුම රාජ්‍ය ව්‍යවසායන් විසින් මෙම අත්පොතෙහි අදාළ විධිවිධානවලට අනුකූලව තමන්ගේම පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමත කරවා ගත යුතු අතර, එම අත්පොත් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත් විය යුතුය. තවද, එම අත්පොත් කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. එසේ වුවද, දැනට භාවිතා කරනු ලබන පරිපාලන හා මූල්‍ය අත්පොත සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
සී. මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාපටිපාටි 2025 හි 12.1.5 වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පමණක් අනුමත කරන ලද මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාපටිපාටි 2025 හි 12.1.5 වගන්තියට අනුව, ආපදා ණය සඳහා උපරිම සීමාව මූලික වැටුපෙන් මාස 10කට සමාන මුදලක් වේ. එසේ වුවද, සමාගම විසින් ආපදා ණය ලබාදීමේදී මූලික වැටුපට වෘත්තීය දීමනාව එකතු කර ගණනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයකදී, විධායක නිලධාරීන් 27 දෙනෙකු වෙත බලය නොමැතිව රුපියල් මිලියන 7.2ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.
ඩී. 2025 දෙසැම්බර් 02 දිනැති PED 02/2025 චක්‍රලේඛයේ 1.3 වගන්තිය	2024 මූල්‍ය වර්ෂය තුළ බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30ක මුදලක් ලාභාංශ ලෙස හෝ ඒකාබද්ධ අරමුදලට අය කිරීමක් ලෙස ගෙවා නොතිබුණි. එම චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, සමාලෝචනයට ලක් කළ වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ලෙස රුපියල් මිලියන 386.94ක මුදලක් ගෙවා තිබුණි.
ඊ. 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/1992 සහ මුදල් රෙගුලාසි 750	ආයතනයේ මෝටර් රථ වාහන පැහැදිලිව හඳුනාගැනීම සඳහා එම වාහනවල ආයතනයේ ලාංඡන සහ ජාතික ලාංඡනය සලකුණු කළ යුතුය. නියැදි විගණන පරීක්ෂාවකට අනුව, රුපියල් මිලියන 111.65ක පිරිවැය වටිනාකමකින් යුත් වාහන 06ක සමාගමේ නාමය සහ ජාතික ලාංඡනය සලකුණු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ජී) වගන්තියේ අවශ්‍යතාවය අනුව, සමාගම විසින් එයට පැවරී ඇති බලතල, කාර්යයන් සහ වගකීම් අනුව කටයුතු කර නොමැති බව සඳහන් කිරීම.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (එච්) වගන්තියේ අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත් අදාළ කාල රාමුව තුළ සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව ආර්ථිකමය, කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් ලබාගෙන හා භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.

3. වෙනත් කරුණු

සමාගම විසින් ටැංකි හා නල පද්ධතිය ගුවනින් නිරීක්ෂණය කිරීමේ අරමුණින් 2021 නොවැම්බර් 17 දින රුපියල් මිලියන 5.49ක වටිනාකමකට ඩ්‍රෝන යානයක් මිලදී ගෙන තිබුණි. එහෙත්, එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා නොකර, 2025 වර්ෂයේදී ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව වෙත නොමිලේ ලබා දී තිබුණි. 2025 දෙසැම්බර් 31 දිනට එම වත්කමේ පොත් වටිනාකම රුපියල් මිලියන 3.44ක් විය.

එල්. එස්. අයි. ජයරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025.12.31 දිනට

වත්කම්	සටහන්	2025 රු	2024 රු
ජංගම නොවන වත්තම්			
දේපළ, පිරියත සහ උපකරණ	10	81,595,918,371	40,477,687,179
අස්පෘශ්‍ය වත්කම්	11	80,272,197	103,765,746
වෙනත් මූල්‍ය වත්කම්	14.1	1,349,711,025	1,479,620,703
		83,025,901,594	42,061,073,628
ජංගම වත්කම්			
තොග	12	848,094,524	870,657,190
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	13	16,230,533,393	11,145,281,753
වෙනත් මූල්‍ය වත්කම්	14.2	1,732,162,453	1,730,157,178
රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනය		1,245,430,515	1,148,174,651
මුදල් සහ මුදල් සමාන දෑ	15	3,089,641,097	4,376,879,992
		23,145,861,981	19,271,150,764
මුළු වත්කම්		106,171,763,575	61,332,224,392
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	7,500,000,000	7,500,000,000
ප්‍රාග්ධන සංචිතය	16.1	979,000,000	979,000,000
ප්‍රත්‍යාගණන සංචිතය		45,725,465,724	16,868,080,909
ස්වයං රක්ෂණ සංචිතය		2,831,436,562	2,651,405,099
රඳවාගත් ඉපැයීම්		21,957,672,281	18,850,120,827
මුළු හිමිකම්		78,993,574,567	46,848,606,835
ජංගම නොවන වගකීම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	17	2,507,704,233	1,906,978,095
විලම්භිත බදු වගකීම්	8.1	21,385,475,972	9,055,640,712
		23,893,180,205	10,962,618,807
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	18	2,119,860,451	2,492,698,618
ගෙවිය යුතු ආදායම් බදු		1,138,699,038	980,743,691
බැංකු අයිරාව		26,449,314	47,556,440
මුළු ජංගම වගකීම්		3,285,008,803	3,520,998,749
මුළු හිමිකම් සහ වගකීම්		106,171,763,575	61,332,224,392

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව මම සහතික කරමි.

ඕ පී කණ්ගොඩආරච්චි
මූල්‍ය අංශයේ ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

ආචාර්ය මියුර නෙත්තිකුමාරගේ
කළමනාකාර අධ්‍යක්ෂ

ඩී ජේ වී වීස් ද වීස් රාජකරුණා
සභාපති

පිටු 94 සිට 115 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

2026 පෙබරවාරි 20
කොළඹ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

	සටහන්	2025 රු	2024 රු
ආදායම	3	20,520,096,045	18,898,875,688
සෘජු වියදම්		(10,753,171,847)	(9,562,225,548)
දළ ලාභය		9,766,924,198	9,336,650,140
අනෙකුත් මෙහෙයුම් ආදායම්	4	1,082,399,492	1,015,248,890
අනෙකුත් මෙහෙයුම් වියදම්	4.1	(257,929,027)	-
පරිපාලන වියදම්		(5,460,170,658)	(5,687,556,959)
මෙහෙයුම් ලාභය		5,131,224,005	4,664,342,071
මූල්‍ය ආදායම	5	405,777,985	333,715,184
බදු පෙර ලාභය	6	5,537,001,990	4,998,057,255
ආදායම් බදු වියදම්	7.1	(1,696,632,507)	(1,616,828,409)
වසර සඳහා ලාභය		3,840,369,483	3,381,228,846
පසුකාලීන කාල පරිච්ඡේදවල ලාභ අලාභ වලට නැවත වර්ගීකරණය නොකළ යුතු අනෙකුත් විස්තීර්ණ ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය / අලාභය	17	(575,409,380)	169,463,108
ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය		41,224,835,449	24,097,258,442
අනෙකුත් විස්තීර්ණ ආදායම් සඳහා බද්ද	8.1	(12,194,827,821)	(7,280,016,464)
වර්ෂය සඳහා බදු අඩු කල පසු වෙනත් විස්තීර්ණ ආදායම		28,454,598,249	16,986,705,086
වර්ෂය සඳහා බදු අඩු කල පසු මුළු විස්තීර්ණ ආදායම		32,294,967,732	20,367,933,932
කොටසකට ඉපැයීම්	9.2	5.12	4.51

පිටු 94 සිට 115 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	ස්වයං රක්ෂණ සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2024 ජනවාරි 01 දිනට ශේෂය	7,500,000,000	979,000,000	-	2,500,000,000	15,501,672,905	26,480,672,905
වසර සඳහා ලාභය	-	-	-	-	3,381,228,846	3,381,228,846
බදු අඩු කළ වෙනත් විස්තීර්ණ ආදායම	-	-	16,868,080,909	-	118,624,176	16,986,705,085
සම්පූර්ණ විස්තීර්ණ ආදායම්	-	-	16,868,080,909	-	3,499,853,022	20,367,933,931
රක්ෂණ සංචිත අරමුදලෙන් ලැබෙන පොලී ආදායම	-	-	-	105,572,470	(105,572,470)	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරු කිරීම	-	-	-	45,832,629	(45,832,629)	-
2024 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	7,500,000,000	979,000,000	16,868,080,909	2,651,405,099	18,850,120,827	46,848,606,835
වසර සඳහා ලාභය	-	-	-	-	3,840,369,483	3,840,369,483
බදු අඩු කළ වෙනත් විස්තීර්ණ ආදායම	-	-	28,857,384,815	-	(402,786,566)	28,454,598,249
මුළු විස්තීර්ණ ආදායම	-	-	28,857,384,815	-	3,437,582,917	32,294,967,732
ගෙවූ ලාභාංශ	-	-	-	-	(150,000,000)	(150,000,000)
රක්ෂණ සංචිත අරමුදලෙන් ලැබෙන පොලී ආදායම	-	-	-	97,255,863	(97,255,863)	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරු කිරීම	-	-	-	82,775,600	(82,775,600)	-
2025 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	7,500,000,000	979,000,000	45,725,465,724	2,831,436,562	21,957,672,281	78,993,574,567

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

	සටහන්	2025 රු	2024 රු
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ /(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහයන්			
ආදායම් බදු වියදමට පෙර ලාභය		5,537,001,990	4,998,057,255
ගැලපුම්			
මූල්‍ය ආදායම	5	(405,777,985)	(333,715,184)
සේවක ණය හානිකරණය සඳහා දීමනාව		(3,558,934)	24,846,278
තොග හානිකරණය සඳහා දීමනාව		5,659,445	2,805,711
අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා හානිකරණය සඳහා දීමනාව		-	508,288,309
දේපළ පිරියත සහ උපකරණ විකිණීමේ දී අලාභය /ලාභය	4	2,415,121	(26,974,090)
නිශ්චිත ප්‍රතිපාදන සැලසුම් සඳහා වෙන්කිරීම්		307,240,545	338,268,907
ක්ෂයවීම්	10.2	1,484,213,953	715,132,673
වත්කම් ප්‍රත්‍යාගණන අලාභ		8,895,701	83,862,857
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	11.2	23,549,548	3,920,990
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**6,959,639,384**	**6,314,493,706**
තොග (වැඩිවීම) / අඩුවීම		22,562,666	12,575,941
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම		(5,085,251,640)	(1,566,049,737)
අනෙකුත් මූල්‍ය වත්කම්වල වැඩිවීම / (අඩුවීම)		127,904,403	(288,273,034)
වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් වැඩිවීම / (අඩුවීම)		(180,657,118)	253,963,552
මෙහෙයුම්වලින් ජනිත වූ/ (භාවිත කරන ලද) මුදල්		**1,844,197,695**	**4,726,710,428**
ගෙවූ ආදායම් බදු		(1,403,669,722)	(145,967,194)
ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ	17	(281,923,786)	(180,729,006)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහනයන්		**158,604,187**	**4,400,014,228**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපළ. පිරියත සහ උපකරණ මිලදී ගැනීම්	10.1	(1,584,267,079)	(1,298,182,793)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම	11.1	(56,000)	(98,362,978)
දේපළ. පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබීම්		1,065,000	26,974,090
රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය කිරීම		(97,255,863)	(148,174,651)
මූල්‍ය ආදායම	5	405,777,985	333,715,184
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ		**(1,274,735,957)**	**(1,184,031,148)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
ගෙවන ලද ලාභාංශ		(150,000,000)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(150,000,000)**	-
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(1,266,131,770)**	**3,215,983,080**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	15	4,329,323,553	1,113,340,473
වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ	15	3,063,191,783	4,329,323,553
මුදල් සහ මුදල් සමාන දෑ			
බැංකුවේ ඇති මුදල්		3,089,641,097	4,376,879,993
බැංකු අයිරාව		(26,449,314)	(47,556,440)
		3,063,191,783	4,329,323,553

පිටු 94 සිට 115 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

1. සංස්ථාපිත තොරතුරු

1.1 පොදු

ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2003 ඔක්තෝබර් 08 වන දින සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර, සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, කොලොන්නාව නිමාව යන ස්ථානයෙහිය.

1.2 මූලික කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ මූලික කටයුතු වූයේ බනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

1.3 මව් සමාගම සහ අවසාන පාලන පාර්ශවය

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් සමාගම වන්නේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවයි.

1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාව අනුව 2026 පෙබරවාරි 20 දින බලය පවරනු ලැබීය.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

2.1.1 අගය කිරීමේ පදනම

අගය කිරීමේ පදනම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සඳහා වන වගකීම් ආයුගණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

2.1.2 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් සිදුකර ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය තුළ අඛණ්ඩව කටයුතු කිරීමට සම්පත් සමාගමට ඇති බවට ඔවුන් තෘප්තිමත්ය. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාග මේ හැකියාව සම්බන්ධයෙන් යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් නිසැක වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග අනුරූප වේ. පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා කරන ලද ප්‍රමාණයට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවන් වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්වලට අනාගත කාලසීමාවන් තුළ බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වටිනාකම් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, ඇස්තමේන්තු කිරීම අවිනිශ්චිතතාවය සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වඩා වැදගත් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

(අ) සේවක ප්‍රතිලාභ වගකීම

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් - පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ අනෙකුත් අදාල දත්තයන් ඇතුළත් වේ. සේවක ප්‍රතිලාභවල දීර්ඝ කාලීන ස්වභාවය

හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 හි දක්වා ඇත.

(ආ) වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය

වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට සමාගම විසින් තක්සේරු කරනු ලබයි. ලැබිය යුතු දෑ දැනට පවත්නා තත්ත්වය සහ ණය අයකර ගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. එවැනි හානිකරණ සැබෑ සහ අපේක්ෂිත හානි පිළිබිඹු කිරීම සඳහා වරින් වර ගැලපීම් කරනු ලැබේ. සටහන 13 සහ 19 හි අනාවරණය කර ඇති පරිදි සමාගම 2024 වසර තුළ වෙළඳ සහ ලැබිය යුතු මුදල් හා සම්බන්ධ වෙනත් කිසිදු හානිකරණ හඳුනාගෙන නොමැත.

(ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන්වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම්වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

2.5 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.5.1 විදේශ විනිමය පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල වේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනු දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

2.5.2 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට ආදායම හඳුනාගත හැකිය. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිශ්ධාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු) අඩු කොට ආදායම ගණනය කෙරෙයි.

සමාගම විසින් පාරිභෝගිකයෙකුට එවැනි සේවාවන් පැවරීම සඳහා නුවමාරු කර ගැනීමට සමාගම අපේක්ෂා කරන සලකා බැලීමේ ප්‍රමාණයෙන් පාරිභෝගිකයාට පොරොන්දු වූ සේවාවක් පැවරීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කරන විට සමාගම ආදායම හඳුනා ගනී.

ආදායම් ප්‍රමාණය විශ්වාසනීයව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළ විශේෂිත නිර්ණායක සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. එය අනාගතයේදී ලැබිය හැකි ආදායමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට සමාගම ආදායම හඳුනා ගනී, අදාල සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසැලකෙයි.

අ) සේවාවන් සැපයීම

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

පර්යන්ත ගාස්තුව

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා IOC සමාගම සහ මහා භාණ්ඩාගාරය අතර 2003 වර්ෂයේදී අත්සන් කරන ලද, පසුව 2011, 2019 සහ 2023 වර්ෂවලදී සංශෝධනය කරන ලද පොදු පරිශීලක ගිවිසුමට අනුව අලෙවිකරණ සමාගම්වලින් අයකර ගන්නා ලද මෙහෙයුම් වියදම් වලින් පර්යන්ත ගාස්තුව සමන්විත වන අතර එය ඔවුන් සතු ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිකරුවන්ට හෝ පාරිභෝගිකයින්ට පවරන අවස්ථාවේදී හඳුනාගනී. පර්යන්ත ගාස්තුව මනිනු ලබන්නේ අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් වෙත විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදන ලීටරයකටය අලෙවිකරණ සමාගම් වෙත නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

මෙහෙයුම් ආන්තිකය

මිල සූත්‍රවල කලින් තීරණය කළ අනුපාතය මත පදනම්ව මෙහෙයුම් ආන්තිකය හඳුනා ගැනේ. මෙහෙයුම් ආන්තිකය මනිනු ලබන්නේ අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් වෙත විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදන ලීටරයකටය. අලෙවිකරණ සමාගම් වෙත නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

ප්‍රවාහන ආදායම

දුම්රිය වැගන්, නළ මාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගනු ලැබේ. අලෙවිකරණ සමාගම් වෙත

නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

2022 නොවැම්බර් 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, ඓතිහාසික SLAB ගාස්තු අයකර ගැනීම වෙනුවට CPC සහ LIOC සමග අත්සන් කරන ලද නව ගිවිසුමේ වගන්ති අංක 06 අනුව තොග ගබඩාවල ඉන්ධන අලෙවිය මත අන්තර්-පර්යන්ත ඉන්ධන තොග ප්‍රවාහන ගාස්තු 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකර ගැනීමට අනුමැතිය ලබා දෙන ලදී.

ආ) මූල්‍ය ආදායම

ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින්, උපචිත පොළිය ලෙස මූල්‍ය ආදායම හඳුනාගනු ලැබේ.

ඇ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී. දේපළ, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශනයට ගණනය කර ඇත.

අහඹු කටයුතුවල සිට ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතු දක්වා සහ වැදගත් නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

2.5.3 වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ රාජ්‍යයක දේපළ පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරණ ලද සියලුම වියදම් කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සඳහා අය කර ඇත.

2.5.4 බදුකරණය

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම වර්තන සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාලව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහා වන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු, පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගැනේ.

වත්මන් බදු

වත්මන් සහ පෙර කාලපරිච්ඡේද සඳහා වත්මන් ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු බලධාරීන්ගෙන් අයකර ගැනීම හෝ ගෙවනු ලබන අපේක්ෂිත මුදලිනි. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති වීවා වාර්තා කරන දිනය වන විට පනවනු බල පැවැත්වෙන බදු නීතීන්ය.

ආදායම් බදු ගණනය මූල්‍ය ප්‍රකාශයන්හි සඳහන් අදාල බදු නීතීන්හි, විධිවිධාන අනුව ප්‍රකාශ සහ ගණනය කර ඇත.

හිමිකම් සඳහා සෘජුවම පිළිගත් අයිතමවලට අදාල වත්මන් ආදායම් බද්ද හිමිකම් ප්‍රාග්ධනය හා ගැළපීම් කරන අතර එය විස්තීර්ණ ගැලපීම් නොකෙරේ.

විලම්බිත බදු

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරන පරමාර්ථ සඳහා වන ධාරණ අගයන් අතර, වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්බිත බදු වෙන් කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්බිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බලනොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාල විලම්බිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්බිත ආදායම් බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරන අතර භාවිතා කළ යුතු විලම්බිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්බිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

අධිභාර බදු

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

තවද, 2022 අංක 14 දරණ අධිභාර බදු පනතෙන් පැන නගින බදු වගකීම් අංක 22.1 ආදායම් බදු සටහන යටතේ අනාවරණය කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශය (SoAT) මගින් නිර්දේශිත පරිදි ගිණුම්ගත කර ඇත.

විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද)

බදු අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිලදී ගැනීමේ දී දරණ ලද, අදාල පරිදි විකුණුම් බදු ඇතුළත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ප්‍රමාණය මුල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ වල කොටසක් ලෙස ඇතුළත් කරයි.

2.5.5 මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන අගය කිරීම

2.5.5.1 මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම

මූල්‍ය වත්කම්, මූලික හඳුනාගැනීමේදී, පසුව ක්‍රමක්ෂගත පිරිවැයෙන්, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ලෙස මනිනු ලැබේ. මූල්‍ය වත්කමක් (එය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ශේෂයක් නම්) හෝ මූල්‍ය වගකීම මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් සහ FVPL හි නොමැති අයිතමයක් සඳහා, එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයයි. සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ශේෂයක් මූලිකව මනිනු ලබන්නේ ගනුදෙනු කළ මිලටය.

පසුකාලීන අගය කිරීම

පසුකාලීන මිනුම් සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ග කර ඇත;

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට (ණය උපකරණ)
- සමුච්චිත ලාභ සහ අලාභ (ණය උපකරණ) ප්‍රතිවක්‍රීකරණය සමග වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්
- හඳුනාගැනීමෙන් පසු සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිවක්‍රීකරණය නොකර වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)
- ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්

කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය (ණය උපකරණ) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම් යන කාණ්ඩවලට සීමා වේ.

ණය සහ ලැබිය යුතු මුදල

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළෙඳ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ තිරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික අගය කිරීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළි අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර අගය කරයි.

අත්පත්කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළි අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක්වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. IR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කරයි. හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනී.

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමාගම විසින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මනිනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇත.

සහ

- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හිදී මුදල් ප්‍රවාහයන් ඉහළ නංවන අතර, එය මූලික ගෙවීම් හා ඉතිරිව ඇති මුදල සඳහා පොලියෙන් පමණක් සමන්විත වේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය මත මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හානිකරණයට යටත් වේ. වත්කම් හඳුනා නොගත්, වෙනස් කරන ලද හෝ හානිකරණය වූ විට ලාභ හෝ අලාභ හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු මුදල්, මුදල් සහ කෙටි කාලීන තැන්පතු ඇතුළත් සමාගමේ

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කරන විට පමණක් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලබයි. සමාගම ක්‍රමක්ෂය කළ පිරිවැයෙන්, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI) හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ලෙස මනින ලද මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්, සමාගම නැවත වර්ගීකරණය කළ දින සිට අනාගතයට බලපාන ලෙස අදාළ වේ. සමාගම විසින් කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ ලාභ හෝ අලාභ ඇතුළුව) හෝ පොලී නැවත ප්‍රකාශ නොකරයි.

සමාගම විසින් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය කළ පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩය හරහා නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ වටිනාකම නැවත වර්ගීකරණ දිනට මනිනු ලැබේ. මූල්‍ය වත්කම්වල කලින් ක්‍රමක්ෂ කළ පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනසකින් පැන නඟින ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

සමාගම විසින් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය කළ පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩයෙන් සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩයට නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ වටිනාකම නැවත වර්ගීකරණ දිනට මනිනු ලැබේ. කිසියම් ලාභයක් හෝ අලාභයක් මූල්‍ය වත්කම්වල කලින් ක්‍රමක්ෂය කළ පිරිවැය සහසාධාරණ වටිනාකම අතර වෙනසක් හේතුවෙන් පැන නඟින ලාභ හෝ අලාභ අනෙකුත් විස්තීරණ ආදායම ලෙස හඳුනා ගැනේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඵලදායී පොලී අනුපාතිකය සහ අපේක්ෂිත බැර අලාභ ගැලපීම් නොකරයි.

ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් ඉවත් කරනු ලබන්නේ;

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට.
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාග මට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරු කිරීම් වැඩපිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇති විටක සහ

(අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට

හෝ

(ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට

සමාගම වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා එහි අයිතිය පැවරූ විට හෝ සම්මත කර ගැනීමේ විධිවිධානයකට ඇතුළත් වූ විට, එය හිමිකාරිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගෙන තිබේද යන්න නැවත තක්සේරු කරයි.

වත්කම්වල සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරීම හෝ රඳවා තබා ගැනීම හෝ වත්කම් පාලනය පැවරීම සිදු නොකළ විට, සමාගම එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පැවරූ වත්කම දිගටම හඳුනා ගනී. එම අවස්ථාවේ දී, සමාගම රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනම මත මනිනු ලබන සම්බන්ධිත වගකීමක් සමාගම හඳුනා ගනී.

පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමාගමට ආපසු ගෙවීමට අවශ්‍යවන උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිඳව විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ විශ්වාසවන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇති කරන විට හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි.

ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳිමින් සිටින විට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිඟවල හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථා ඇගයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් කළ හැක.

අනෙකුත් වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා සමාගම අපේක්ෂිත බැර අලාභ ගණනය කිරීමේදී සරල ප්‍රවේශයක් යොදා ගනී. එබැවින්, සමාගම ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරයි. නමුත් ඒ වෙනුවට එක් එක් වාර්තා කරන දිනයන්හි පූර්ණ ජීව කාල අපේක්ෂිත බැර අලාභ මත පදනම්ව අලාභ දීමනාවක් හඳුනා ගනී. සමාගම තම නිශ්චිත ගනුදෙනුකරුවන් සමඟ එක් එක්

සිද්ධි වලට අනුකූලව සිය වෙතිහාසික ණය අලාභ අත්දැකීම් මත පදනම් වූ ප්‍රතිපාදන න්‍යාසයක් ස්ථාපිත කර ඇති අතර එය ආර්ථික පරිසරයට ඉදිරි දැක්ම සඳහා සකස් කර ඇත.

2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළෙඳ කටයුතුවලින් ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොලි දරණ ණය සහ ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ.

මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම

SLFRS 09 විෂයපථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ සුදුසු පරිදි ඵලදායී ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන් වර්ග කෙරේ. සමාගම මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි. සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් සංරචකයක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාල කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හඳුනාගනු ලබයි.

පසුකාලීනව අගය කිරීම

පසුකාලීනව අගය කිරීම පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් අගය කිරීම ඒවායේ වර්ගීකරණය මත රදා පවතී:

අ) ණය සහ ණය ගැනීම්

මූලික හඳුනාගැනීමෙන් පසුව පොළී දරණ ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමයකි. පිරිවැයට පසු කාලීනව මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හඳුනාගැනේ. අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැදියාව මුදාහැර ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් නියමයන් මත එම ණයහිමියාගෙන් හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හදුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාල ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හදුනාගනු ලැබේ.

මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් වටිනාකම් පියවීමට දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින විට සහ වත්කම උපලබ්ධි කර ගැනීම සහ වගකීම පියවීම ශුද්ධ පදනමක් මත එකවර පියවීමට අදහස් කරන විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

2.5.5.3 සාධාරණ අගය මැනීම

අගය කරන දිනයට වෙළෙඳපොල සහභාගිවන්නන් අතර නිසි ලෙස කරන ගනුදෙනුවකදී වත්කමක් විකිණීම සඳහා ලැබෙන මිල හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොළ

  හෝ

- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් විය යුතුය.

වෙළෙඳපොල සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන්න උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළම හා හොඳම භාවිතය යොදාගනිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොල සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාල නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මනිනු

ලැබූ හෝ හෙලිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය ධූරාවලිය තුළ පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

- **මට්ටම 1** - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිලගණන්
- **මට්ටම 2** - සාධාරණ අගය මැනීමට වැදගත් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම
- **මට්ටම 3** - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙලිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තරකර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම්වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

2.5.6 තොග

කල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කළ පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නියම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකළ පසු ශුද්ධ උපලබ්ධි අගය වේ.

තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරණ ලද පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් හා පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් අළුත්වැඩියාව සඳහා යොදාගන්නා පොදු භාණ්ඩ හා අළුත්වැඩියාව සඳහා යොදාගන්නා පොදු භාණ්ඩ නිමි තොග	බර තබන ලද සාමාන්‍ය මත පදනම්ව මිල දී ගැනීමේ පිරිවැයට
නිමි තොග	සත්‍ය ගැනුම් පිරිවැයට

2.5.7 දේපළ පිරියත සහ උපකරණ

පිරිවැය ආකෘතිය ඒදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකළ පසු අගයට ඉඩම් සහ ගොඩනැගිලි හැර අනෙකුත් දේපළ පිරියත සහ උපකරණ අයිතම දක්වා ඇත. හඳුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපළ පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය දැරෑවිට එවැනි පිරිවැයට ඇතුළත් වේ. ප්‍රත්‍යාගණන ආකෘතිය ඉඩම් සහ ගොඩනැගිලි අගය කරන්නේ එහි සාධාරණ වටිනාකම්න් ප්‍රත්‍යාගණන දිනයෙන් පසු ගොඩනැගිලි වල සමුච්චිත ක්ෂයවීම් සහ ප්‍රත්‍යාගණනය මත වන අලාභ අඩු කිරීමෙනි. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා තක්සේරු කිරීම් කාලානුරූපිව සිදු කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණනය අතිරික්තයක් ඇත්නම් එය හිමිකම් යටතේ වන ප්‍රත්‍යාගණනය සංචිතයට බැර කරනු ලැබේ. එහෙත්, එම වත්කම කලින් ආදායම් ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණනය අලාභයක් ලෙස වාර්තා කර ඇත්නම්, එම ප්‍රමාණය තෙක් වැඩිවීම ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගනී. ප්‍රත්‍යාගණන හිඟයක් හෙවත් අලාභයක් ඇත්නම් එය ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගන්නා අතර එම වත්කම මීට පෙරාතුව ප්‍රත්‍යාගණන කොට ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනාගෙන තිබුනේ නම්, එම හිඟය අදාළ වත්කමේ පවතින අතිරික්තය දක්වා ප්‍රත්‍යාගණනය සංචිතය මගින් පියවා ගනී.

වත්කමක් බැහැර කිරීමේදී අලෙවි කරන විශේෂිත වත්කමට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණනය සංචිතයක් රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

නොනිමි ප්‍රාග්ධනය

වසර අවසානයට තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින භාරගත් කාර්යයන් මත ගෙවන ලද සියලුම අගයන් නිම නොවූ ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි. අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීව කාලය සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකරගත හැකි අගය දක්වා කපා හරිනු ලබයි. විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමග සැසඳීමෙන් බැහැර කිරීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබයි.

2.5.8 අස්පෘශ්‍ය වත්කම්

ERP පද්ධති සහ ERP සඳහා බලපත්‍ර ගාස්තු

ආයතන සම්පත් සැළසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැළසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු මිලට ගත් මෘදුකාංග යෙදුම් සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මඟින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිතකාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරලමාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

2.5.9 මුදල් හා මුදල් සමාන දෑ

